ශ්‍රී ලංකා
රක්ෂණ නියාමන
කොමිෂන් සභාව

රකිමු ඔබ අගයන දේ

# වාර්ෂික වාර්තාව

# 2023



# පටුන


| | |
|---|---|
| දැක්ම, මෙහෙවර | 2 |
| වසරේ වැදගත් සිදුවීම් | 3 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 4 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය | 7 |
| **කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය** | |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් | 12 |
| කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව | 14 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 16 |
| කාර්ය මණ්ඩලය | 18 |
| **සමාලෝචන** | |
| පොදු සමාලෝචනය | 24 |
| අධීක්ෂණ සමාලෝචනය | 29 |
| ආයුගණක වාර්තා පිළිබඳ සමාලෝචනය | 33 |
| නියාමන සමාලෝචනය | 35 |
| විමර්ශන සමාලෝචනය | 38 |
| වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය | 41 |
| මූල්‍ය හා පරිපාලනමය සමාලෝචනය | 45 |
| සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව | 50 |
| විගණන කමිටුවේ වාර්තාව | 51 |
| **මූල්‍ය තොරතුරු** | |
| විගණකාධිපති වාර්තාව | 54 |
| 2023 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම | 61 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 64 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය | 65 |
| ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය | 66 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 67 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 68 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 69 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 75 |
| මූල්‍ය කාර්ය සාධනයේ විශේෂ අවස්ථා | 89 |
| පරිශිෂ්ඨය I | 90 |
| පරිශිෂ්ඨය II | 91 |
| පරිශිෂ්ඨය III | 93 |
| සටහන් | 94 |




# රකිමු

ඔ බ අ ග ය න දේ

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට, තිරසාර රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීමට සහ ශක්තිමත් අධීක්ෂණ සහ නියාමන පාලන තන්ත්‍රයක් ඇති කිරීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අපගේ සමාජය සහ ආර්ථිකය අවදානම්වලට වඩාත් ඔරොත්තු දෙන තත්ත්වයට පත් කිරීමට කැපවී සිටියි. අපි වැදගත් සම්පත් ආයෝජනය කරන අතර මෙරට රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීම සඳහා කර්මාන්තය සමග සහයෝගයෙන් කටයුතු කරන්නෙමු.



# දැක්ම

දකුණු ආසියාවේ රක්ෂණ නියාමනයේ
මිනුම් ලකුණ බවට පත්වීම.

# මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම,
අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා
පහසුකම් සැලසීම සිදුකරලමින්
රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.



# වසරේ වැදගත් සිදුවීම්

**28**
රක්ෂණ සමාගම්

**78**
රක්ෂණ තැරැව්කාර සමාගම්

**47,192**
රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින්

**662**
රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින්

| කොමිෂන් සභාවේ කාර්යසාධනය | 2023 | 2022 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන) | 11,532 | 9,381 | 23% |
| සෙස් ආදායම (රු. මිලියන) | 648 | 588 | 10.2% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 319 | 291 | 9.6% |



# සභාපතිතුමාගේ පණිවිඩය

## ගෝලීය ආර්ථික පසුබිම



"2023 දී, භාණ්ඩ මිල ඉහළ යෑම සහ භූ දේශපාලනික අවිනිශ්චිතතාවන් මගින් බලපෑමට ලක් වූ ගෝලීය වෙළෙඳාම සහ ආයෝජනවලට අදාළව අභියෝග රාශියකට මුහුණ දීමට සිදු වී ඇත. විශේෂයෙන්ම 2022 දී ඇති වූ අර්බුදකාරී තත්වයත් සමග ශ්‍රී ලංකාවට ආර්ථික පසුබෑමකට මුහුණ දීමට සිදු විය. වසර පුරාවට ගෝලීය මූල්‍ය හා ආර්ථික තත්ත්වය තුළ අවිනිශ්චිතතාවයන් පැවතුන අතර ගෝලීය ආර්ථික කටයුතුවල පසුබෑම සහ ආයෝජන අඩුවීම මගින් එම තත්ත්වය උත්සන්න විය. සංකීර්ණ ආර්ථික තත්ත්වයන් සහ දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් උපායමාර්ගික අවිනිශ්චිතතාවයන් ඇති වීම කෙරෙහි මෙම සාධක බලපෑවේය."

**රසික් සරූක් - ජනාධිපති නීතිඥ**
සභාපති

කොවිඩ් - 19 වසංගතයේ කල්පවත්නා ආර්ථික ප්‍රතිවිපාක අත්විඳිමින් සිටිය දී දැන් නව අභියෝග සහ විපත් රැසකට මුහුණ දීමට සිදු වී ඇත. යුක්රේනයේ යුද්ධය, භූ-ආර්ථික ඛණ්ඩනය ඉහළ යාම, උද්ධමනය පාලනය කිරීම අරමුණු කරගත් මූල්‍ය ප්‍රතිපත්ති පෙර නොවූ විරූ ලෙස දැඩි කිරීම, ඉහළ යන රාජ්‍ය මූල්‍ය ණය මට්ටම් මධ්‍යයේ මූල්‍ය උත්තේජක ඉවත් කර ගැනීම, ස්වෛරී-බැංකු අන්තර් සම්බන්ධතා සහ ප්‍රබල කාලගුණික සිදුවීම් යනාදිය මගින් ගෝලීය වශයෙන් ආර්ථිකය යථා තත්වයට පත් කර ගැනීමට බාධා එල්ල වීම සහ කලාප අතර වර්ධනයේ වෙනස්කම් පුළුල් වීම සිදු වී ඇත. මෙම අඛණ්ඩ අභියෝග මධ්‍යයේ වුවද, උද්ධමන මට්ටම් පහත වැටීමේ බලපෑම්, කොවිඩ් - 19 තවදුරටත් ගෝලීය සෞඛ්‍ය හදිසි අවස්ථාවක් ලෙස හඳුනා නොගැනීම, ගෝලීය සැපයුම් දාම නැවත දිශාභිමුඛ කිරීම සහ ගෝලීය මූල්‍ය තත්වයන් ලිහිල් කිරීම යනාදිය ගෝලීය ආර්ථිකයේ මන්දගාමීත්වය තරමක් දුරට සමනය කරයි.

## අභියෝග : ශ්‍රී ලාංකීය ආර්ථිකය

ආනයන සීමා කිරීම්, මුදල් හිඟය සහ බලශක්ති සැපයුම කෙරෙහි වූ බාධාවන් මධ්‍යයේ වුව 2023 දී මෙහෙයුම් සාමාන්‍යකරණය වීමට පටන් ගැනීම ව්‍යාපාරික ප්‍රජාවට අස්වැසිල්ලක් විය. බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද කාලෝචිත සාර්ව විචක්ෂණ ක්‍රියාමාර්ග ආර්ථික පුනර්ජීවනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කළේය. ශ්‍රී ලංකා ආර්ථිකය 2023 වසරේ සාර්ව ආර්ථික ස්ථායීතාවය ඇති කිරීමෙහිලා ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර එහිදී උද්ධමනය 2022 වසරේ වාර්තා වූ ඉහළම මට්ටමේ සිට තනි ඉලක්කමේ මට්ටමට පහත හෙළන ලදී. ඉහත කී ගෝලීය අහිතකර තත්වයන් මධ්‍යයේ වුවද ප්‍රධාන ආර්ථික දර්ශකවල ස්ථායීතාවය මගින් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකාව සඳහා බලාපොරොත්තු සහගත අන්දමින් ආර්ථිකය යථා තත්වයට පත් වීමක් පෙන්නුම් කෙරිණි. 2023 වසරේ සමස්ත ආර්ථික සංකෝචනය සහ රාජ්‍ය මූල්‍ය හිඟය අවම කිරීම සඳහා වූ බදු ඉහල දැමීම් හා ඉහළ මිල මට්ටම් සහ පොලී අනුපාත ආර්ථික නියෝජිතයින්ගේ ශේෂ පත්‍රවලට අහිතකර ලෙස බලපෑවේය.

එපමණක් නොව, අවිනිශ්චිතතා සහ අභියෝගාත්මක තත්වයන් මධ්‍යයේ මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය තත්වයන් ක්‍රමයෙන් ලිහිල් වීම සහ බාහිර අංශයේ පුනර්ජීවනය හේතුවෙන් ආර්ථික කටයුතු ක්‍රමයෙන් නැවත ආරම්භ විය. අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ නිවැරදි කිරීමේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, දේශීය මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සඳහා ඉවහල් වූ අතර එමගින් සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව ශක්තිමත් විය.

## රක්ෂණ අංශයේ කාර්යසාධනය

අවිනිශ්චිත කාලපරිච්ඡේද තුළ කටයුතු කිරීමට හැකියාවක් සහිත රක්ෂණ අංශය, ප්‍රශංසනීය ඔරොත්තු දීමේ සහ අනුවර්තනය වීමේ හැකියාවක් පෙන්නුම් කරමින්, 2023 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්වයට පත් කිරීම සඳහා එහි ප්‍රධාන භූමිකාව තවදුරටත් ශක්තිමත් කළේය. ආර්ථික අර්බුදයෙන් පසු පෙර නොවූ විරූ අභියෝග රැසකට මුහුණ දුන් රක්ෂණ අංශය අභියෝගාත්මක තත්වයන් යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක විය. නවෝත්පාදන උපාය මාර්ග සහ විකසනය වන වෙළඳපල ගතිකත්වයට ඉක්මන් ප්‍රතිචාර දැක්වීම හරහා දුෂ්කරතා මධ්‍යයේ සාර්ථකත්වය ළඟා කර ගැනීමට රක්ෂණ සමාගම්වලට ඇති හැකියාව පෙන්නුම් කළේය.

පෙර වසරට සාපේක්ෂව සුළු දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 23,375 කින් වැඩි වීමත් සමග 2023 වසර සඳහා දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ මුළු දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 280,955 ක් වූ අතර එය 9.07% ක වර්ධනයක් විය. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය රු.මි. 152,793 ක් වූ අතර එය 12.87% ක වැඩි වීමකි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකය
රු.මි. 128,162 ක් වූ අතර එය 4.87% ක වැඩි වීමකි.

රක්ෂණ සමාගම්හි මුළු වත්කම්වල වටිනාකම 14.81%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2023 වසර අවසානයේ දී රු.මි. 1,087,573 දක්වා ඉහළ ගොස් ඇත. 2023 වසර අවසන් වන විට දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන දෙඅංශයේ ම රක්ෂණ සමාගම්වල බදු පෙර ලාභය රු.මි. 54,170 ක් වූ අතර එය සමස්ත ලාභය 7.62% කින් ඉහළ යාමකි.

## නියාමන සහ අධීක්ෂණ රාමුවේ වර්ධනයන්

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ තිරසාර වර්ධනය සඳහා ඵලදායී නියාමන සහ අධීක්ෂණ රාමුවක් අත්‍යවශ්‍ය වේ. කාර්යක්ෂම, විනිවිද පෙනෙන, තරඟකාරී සහ විශ්වසනීය රක්ෂණ කර්මාන්තයක් මගින් රටේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් සපයනු ලැබේ. එබැවින් ගෝලීය සහ දේශීය රක්ෂණ කර්මාන්තයේ සිදුවන වර්ධනයන් සහ දේශීය වශයෙන් සිදුවන ආර්ථික සංවර්ධනය මත නියාමන සහ අධීක්ෂණ රාමුව සකස් විය යුතුය. රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමන රාමුව ශක්තිමත් කිරීම සහ එහි සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අතර නිවැරදි සමතුලිතතාවයක් ඇති කර ගැනීමට අපි අඛණ්ඩ උත්සාහයක නිරත වුනෙමු.

කර්මාන්තයේ වර්ධනය දිරිගන්වමින් කර්මාන්තයේ සහ සාමාන්‍ය ජනතාවගේ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නිවැරදි දිශාව ඔස්සේ ගමන් කරන බවට වගබලා ගැනීම පිණිස අපි වැදගත් ක්‍රියාමාර්ග කිහිපයක් ගත්තෙමු. ගෝලීය ආර්ථික අර්බුදයේ උගත් පාඩම් සමගින් රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමකයා ලෙස අපි කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණින් නව රෙගුලාසි නිකුත් කළෙමු. ඒ අනුව අපි රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ අනු නීති කිහිපයක් සකස් කළෙමු.

## උපායමාර්ගික අවධානය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමනය සහ අධීක්ෂණය ඉහළ නැංවීමේ අරමුණින් 2023 සිට 2027 දක්වා විහිදෙන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. රක්ෂණයේ මූලික මූලධර්මවල පරතරය විශ්ලේෂණය කිරීම, වෙළඳපල හැසිරීම් නියාමනය කරන රෙගුලාසි සකස් කිරීම සහ හිමිකම් කළමනාකරණ ක්‍රියා පටිපාටි ඇගයීම වැනි ප්‍රධාන මුල පිරීම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. සිය ඉලක්ක සඳහා නොසැලෙන කැපවීම හරහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අරමුණු කරන්නේ හොඳින් නියාමනය කළ සහ ඔරොත්තු දෙන රක්ෂණ කර්මාන්තයක් පවත්වා ගැනීම සහ එමගින් ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වයට දායක වීමයි.

# සභාපතිතුමාගේ පණිවිඩය

## ඉදිරි ගමන

ශ්‍රී ලංකා  රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිය උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ මීළඟ අදියර ආරම්භ කිරීමේ දී තවදුරටත් සිය උපායමාර්ගික අරමුණු ඉදිරියට ගෙන යාමට කැපවී සිටී. තවද, ප්‍රත්‍යාස්ථ සහ හොඳින් නියාමනය කරන ලද රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීමේ අරමුණින් රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ගික උත්සාහයන් ගනු ඇත.

සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ සිට නියාමන ක්‍රියාවලින් වැඩි දියුණු කිරීම දක්වා විවිධ අංශවලින් සමන්විත වන අපගේ අඛණ්ඩ මුලපිරීම් අතරින් ප්‍රමුඛස්ථානය ගන්නේ ඩිජිටල්කරණයයි. පද්ධති ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ තොරතුරු පූර්ණත්වය තහවුරු කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කරමින් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට උත්සාහ දරනු ඇත.

අපගේ සාර්ථකත්වයේ පදනම අපගේ කණ්ඩායමයි.  ඉදිරි වසර තුළ, රක්ෂණ ක්ෂේත්‍රයේ සංකීර්ණතා වලට මුහුණ දීමට අපගේ නියාමන කාර්ය මණ්ඩලය හොඳින් සූදානම්ව සිටින බව සහතික කිරීම පිණිස ඔවුන් දැනුමෙන් සහ පළපුරුද්දෙන් සන්නද්ධ කිරීමට පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමටත් ප්‍රතිලාභ සහ වැටුප් වැඩි කිරීමටත් අපි කැපවී සිටිමු.

මේ වන විට ආර්ථිකය වඩාත් ස්ථායී මට්ටමක පවතින බැවින් රක්ෂණ කර්මාන්තයේ විභව අවස්ථා  ගවේෂණය කරමින් විශ්වාසයෙන් යුතුව ඉදිරියට ගමන් කරනු ඇත. ශ්‍රී ලංකා  රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශක්තිමත් නියාමන රාමුවක් සහතික කිරීම, නවෝත්පාදනයන් දිරිගැන්වීම සහ රක්ෂණ ක්ෂේත්‍රය තුළ පාරිභෝගික ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා වන සිය වගකීම ඉටු කිරීමට කැපවී සිටී. කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග සහයෝගීතාවය වර්ධනය කිරීම, තාක්ෂණ භාවිතය ඉහළ නැංවීම සහ අවදානම් කළමනාකරණයට ප්‍රමුඛත්වය ලබා  දීම තුළින් අපේක්ෂා  කරන්නේ ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඉදිරි ආර්ථික ස්ථායිතාවය සහ සමෘද්ධිය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ස්ථානගත කිරීමයි.

## අගය කිරීම්

අවසාන වශයෙන්, කොමිෂන් සභාව වෙත ලබා දුන් සහයෝගය පිළිබඳව අතිගරු ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මුදල් අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන්ටත් මම ස්තුතිවන්ත වෙමි.  තවද, සියළුම කොමිෂන් සභා සාමාජිකයින්ගේ වටිනා දායකත්වය වෙනුවෙන් මම ස්තුති කිරීමට කැමැත්තෙමි. කොමිෂන් සභාව වෙත ලබාදුන් සුහද සහයෝගීතාවය වෙනුවෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ සියලුම පාර්ශ්වකරුවන්ට ද මම ස්තූතිවන්ත වෙමි. එසේම, අධ්‍යක්ෂ ජනරාල්වරයා, අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කැපවීම සහ ඔවුන්ගේ උත්සාහය බෙහෙවින් අගය කරනු කැමැත්තෙමි.



**රසික් සරූක් - ජනාධිපති නීතීඥ**
සභාපති

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය



"2022 දී ශ්‍රී ලංකාව සැලකිය යුතු ආර්ථික පසුබෑමකට මුහුණ දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට තුළ ඉතිහාසයේ දරුණුතම අර්බුදය ඇති විය. කෙසේ වුවද, 2023 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු කරමින් එය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. කර්මාන්තයේ ස්ථාවර බව තහවුරු කරමින් ද වඩාත් පුළුල් ආර්ථික ප්‍රතිසාධනයකට රක්ෂණ අංශයේ දායකත්වයට පහසුකම් සලසමින් ද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මෙහිදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. නියාමන අධීක්ෂණය සහ වෙළඳපළ අධීක්ෂණය කරා වූ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සක්‍රීය ප්‍රවේශය මගින් රක්ෂණ අංශය කෙරෙහි පාරිභෝගික පැහැදීම සහ ආයෝජක විශ්වාසය ඉහළ නැංවූ අතර එමගින් තිරසර රක්ෂණ කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කැපවීම අවධාරණය කෙරිණි."

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය සංක්ෂිප්තව

### දළ ලිඛිත වාරිකය

2023 දී ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ මුළු දළ ලිඛිත වාරික ආදායම රු.මි. 280,955 ක් වූ අතර එමගින් පෙර වසරට සාපේක්ෂව 9.1%ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වර්ධන අනුපාතය පෙර වසරේ වර්ධන අනුපාතය වූ 10.3%ට වඩා සුළු අඩුවීමක් පෙන්නුම් කළ ද එය ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද කර්මාන්තයේ ඔරොත්තු දීමේ හැකියාව අවධාරණය කරයි.

දිගුකාලීන රක්ෂණ අංශය වසර පුරා ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරමින් කර්මාන්තයේ සමස්ත කාර්යසාධනය සඳහා කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කර ඇත. 2023 දී රු.මි. 152,793 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින්, ජීවිත රක්ෂණ නිෂ්පාදන සඳහා ඇති ඉහළ ඉල්ලුම, හිතකර ජන විකසන ප්‍රවණතා සහ දිගුකාලීන මූල්‍ය සැලසුම්කරණය හා ආරක්ෂාව ඉලක්ක කරගත් එක් එක් පුද්ගලයාට ගැළපෙන නිෂ්පාදන හඳුන්වා දීම වැනි කරුණු මත මෙම අංශය පෙර වසරේ පැවති 8.6% ක වර්ධන වේගය ඉක්මවා ගොස් 12.9%ක වර්ධන වේගයක් පෙන්නුම් කිරීමට සමත් විය.

ගිනි සහ සෞඛ්‍ය රක්ෂණය වැනි ප්‍රධාන අංශවල වර්ධනය හේතු කොට ගෙන 2023 දී සාමාන්‍ය රක්ෂණ අංශයෙහි සාමාන්‍ය ව්‍යාප්තියක් දක්නට ලැබිණි. මෝටර් රථ ආනයනය සීමාකිරීම හේතුවෙන් මතු වූ අභියෝග මධ්‍යයේ වුවද සාමාන්‍ය රක්ෂණ අංශය රු.මි.128,162 ක වාරික ආදායමක් උපයා ගනිමින් 4.9% ක වර්ධන වේගයක් අත්කර ගැනීමට සමත් විය. කෙසේ වුවද, මෝටර් රථ රක්ෂණ අංශය ආනයන සීමා කිරීම් හේතුවෙන් බාධාවන්ට මුහුණ දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස 0.7%ක වර්ධන වේගයක් වාර්තා කළ අතර එය පෙර වසරේ 9.4%ක් වූ වර්ධන වේගයට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි. කෙසේ වුවද, සෞඛ්‍ය සහ ගිනි රක්ෂණය 2023 දී පිළිවෙළින් 10.2%ක සහ 23.0%ක සැලකිය යුතු වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත.

1 ප්‍රස්තාරය මගින් 2019 සිට 2023 දක්වා වූ වසර පහ තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යසාධනය පෙන්නුම් කෙරේ. කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය 43.0% ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් 2021 දී වාර්තා වූ රු.මි. 196,472 ට සාපේක්ෂව රු.මි. 280,955 දක්වා වූ ඉහළ යාමක් පෙන්නුම් කර ඇත.

### දළ ලිඛිත වාරිකය




1 ප්‍රස්තාරය - 2019 සිට 2023 දක්වා දළ ලිඛිත වාරිකය

### මුළු වත්කම්

2023 අවසන් වන විට රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් රුපියල් ට්‍රිලියනය ඉක්මවා ගොස් 14.8%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 1,087,573 ළඟා විය. එසේම දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් රුපියල් මිලියන 819,923ක් වූ අතර ප්‍රධාන වශයෙන් රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජන මගින් නියෝජනය වන ව්‍යාපාර කටයුතුවල ඉහළ යාම හේතුවෙන් 22.6%ක වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් රු.මි. 267,650ක් වූ අතර, එය 3.9%ක සුළු අඩු වීමකි.

2 ප්‍රස්තාරය මගින් 2019 සිට 2023 දක්වා වූ වසර පහ තුළ රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් පෙන්නුම් කෙරේ. පසුගිය වසර පහ තුළ 56.0%ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් 2023 අවසන් වන විට රු.මි. 1,087,573ක් දක්වා ඉහළ ගියේය.

### මුළු වත්තකම්




2 ප්‍රස්තාරය - 2019 සිට 2023 දක්වා මුළු වත්කම්

### හිමිකම් පෑම්

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යන දෙඅංශයේ ම රක්ෂණ සමාගම් විසින් ගෙවන ලද හිමිකම් ප්‍රමාණය රු.මි. 137,918ක් වූ අතර එය වාර්ෂිකව 12.8%ක වර්ධනයක් පෙන්නුම් කරයි. දිගු කාලීන රක්ෂණ අංශයේ හිමිකම් පෑම් රු.මි.76,502ට ළඟා වූ අතර එය 26.2%ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේ ය. මෙම ඉහළ යාම මූලික වශයෙන් කල් පිරෙන අවස්ථාවේ ලබා දෙන ප්‍රතිලාභ හේතුවෙන් සිදු විය.

මෝටර් රථ, ගිනි, නාවික, සෞඛ්‍ය, අනෙකුත් කාණ්ඩ සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හිමිකම් පෑම් රු.මි.61,416 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 0.3%ක සුළු අඩුවීමකි. මෙම අංශ අතරින් මෝටර් රථ රක්ෂණයට අදාළව ඉහළම හිමිකම් පෑම් ප්‍රමාණයක් වාර්තා වී ඇත. 2023 දී මෝටර් රථ රක්ෂණය සඳහා වූ හිමිකම් පෑම් 5.6%කින් ඉහළ ගිය අතර, සෞඛ්‍ය රක්ෂණ අංශය විසින් ගෙවන ලද හිමිකම් 2022ට සාපේක්ෂව 1.1%කින් අඩු විය. තවද, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් 2023 දී හිමිකම් පෑම්වලට අදාලව රු.මි. 66 ක් වාර්තා කර ඇති අතර එය 2022 දී වාර්තා වූ රු.මි.1,464 ට වඩා සැලකිය යුතු අඩුවීමකි.

දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා 2019 සිට 2023 දක්වා වූ වසර පහ තුළ රක්ෂණ සමාගම් විසින් ගෙවන ලද හිමිකම්වල ප්‍රවණතාවන් 3 ප්‍රස්තාරය මගින් දැක්වේ.

### හිමිකම් පදනම




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| දිගු කාලීන | 35,139 | 37,909 | 45,969 | 60,639 | 76,502 |
| සාමාන්‍ය (SRCC ඇතුළුව) | 58,149 | 42,520 | 48,276 | 61,624 | 61,416 |
| මුළු | 93,288 | 80,429 | 94,245 | 122,263 | 137,918 |

දිගු කාලීන   සාමාන්‍ය (SRCC ඇතුළුව)   මුළු

3 ප්‍රස්තාරය - 2019 සිට 2023 දක්වා රක්ෂණ සමාගම් විසින් ගෙවන ලද හිමිකම්

### නුබුන්වත් තත්ත්වය

අවදානම් පාදක ප්‍රාග්ධනය යටතේ වන ප්‍රාග්ධන ප්‍රමාණවත්තතා අනුපාතය මගින් අවශ්‍ය අවදානම් ප්‍රාග්ධනයට සාපේක්ෂව පවතින මුළු ප්‍රාග්ධනයේ ප්‍රමාණවත් බව මනිනු ලබන අතර එමගින් රක්ෂණකරුවන්ට තම ප්‍රාග්ධන තත්ත්වයට අදාළව අවදානමට මුහුණ දීමට ඇති හැකියාව පෙන්නුම් කෙරේ. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය

ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය 2023 වසර සඳහා 358% (2022 : 303%) ලෙස වාර්තා වූ අතර එය 18.0%ක ඉහළ යාමකි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය 2023 වසර සඳහා 252% (2022 : 210%) ලෙස වාර්තා වූ අතර එය 20.0% ක ඉහළ යාමකි.

## ලාභදායී බව

2023 වර්ෂයේදී රු. මි. 54,170ක් වාර්තා කිරීමෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ ලාභදායීතාවය 7.6%ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කර ඇත. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ලාභදායිතාව 2023 දී රු.මි. 23,439 සිට රු.මි. 30,617 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 30.6%ක කැපී පෙනෙන වාර්ෂික ලාභ වර්ධනයකි. එසේම, 2023 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රු.මි. 23,553 ක් වාර්තා කරමින් 12.4%ක සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

## රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කාර සමාගම්වල මුළු වත්කම් 2022 වසර අවසානයේ වාර්තා වූ රු.මි. 9,689 ට සාපේක්ෂව 2023 වසර අවසන් වන විට රු.මි. 12,378 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 27.8% ක වර්ධනයකි. වෘත්තීය මැදිහත්කරුවන් ලෙස රක්ෂණ තැරැව්කරුවෝ රක්ෂණයේ සංකීර්ණ පසුබිම ගවේෂණය කිරීම සඳහා ගනුදෙනුකරුවන්ට සහාය වීමේ දී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරති. ඔවුහු අවදානම් තක්සේරු කිරීම, රක්ෂණාවරණ විකල්ප විශ්ලේෂණය කිරීම සහ තම ගනුදෙනුකරුවන්ට තරඟකාරී මිල ගණන් යටතේ පුළුල් ආරක්ෂාවක් තහවුරු කිරීම සඳහා ඔවුන් වෙනුවෙන් කොන්දේසි සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සිදු කරති. ගනුදෙනු සේවාවලට අමතරව තැරැව්කරුවන් විසින් හිමිකම් පෑම් සඳහා සහාය, රක්ෂණ ඔප්පු කළමනාකරණය හා අවදානම් කළමනාකරණ උපදෙස් ඇතුළු අඛණ්ඩ සහාය සපයනු ලබන අතර ඒවා විශ්වාසය මත ගොඩනැගුණු දිගුකාලීන හවුල්කාරීත්වයන් පවත්වා ගෙන යාමට ඉවහල් වේ.

## අභියෝග ජයගැනීමේ ක්‍රම සොයා ගැනීම

ඉහළ ගිය ජීවන වියදම, ඉහළ ගිය බදු සහ ආදායම් මට්ටම් පහත වැටීම වැනි අභියෝග මධ්‍යයේ රක්ෂණය සඳහා ඇති ඉල්ලුම නිරායාසයෙන් අඩු වේ. මෙම අභියෝග සඳහා ඵලදායී ලෙස විසඳුම් සෙවීමට රක්ෂණ කර්මාන්තය ප්‍රගාමී ක්‍රියාමාර්ග ගත යුතුය. රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම, විශේෂයෙන් ආපදා අවදානම් රක්ෂණාවරණය පිළිබඳ අවධාරණය කිරීම, රක්ෂණ නිෂ්පාදන වෙත වන ප්‍රවේශය සහ මිල දැරිය හැකි බව ඉහළ නැංවීම, නවෝත්පාදනයන් දිරිගැන්වීම, ක්ෂුද්‍ර රක්ෂණ අංශයේ සංවර්ධනය, කෘෂි පාදක රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම සහ තාක්ෂණික දියුණුව ඉහළ නැංවීම මීට ඇතුළත් වේ. අනපේක්ෂිත අවදානම්වලට එරෙහිව පුළුල් ආරක්ෂාවක් සහතික කරමින් යථා තත්ත්වයට පත්වන ආර්ථිකයට ගැළපෙන පරිදි රට පුරා රක්ෂණය ප්‍රචලිත කිරීම මෙම මුල පිරීම්වල අරමුණයි.

එපමණක් නොව, උෟණ රක්ෂණය, වංචනික භාවිතයන් සහ ස්වභාවික විපත් අවදානම් වැනි අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රත්‍යාස්ථ සහ සියල්ල ඇතුළත් වූ රක්ෂණ අංශයක් ඇති කිරීම සඳහා රක්ෂණකරුවන්, නියාමකයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර අඛණ්ඩ සහයෝගීතාවයේ අවශ්‍යතාවය ඉස්මතු කෙරේ.

## රක්ෂණ ඔප්පු හිමියන් පිළිබඳ දැනුවත් කිරීම සහ අධ්‍යාපනය

සාමාන්‍ය මහජනතාවගේ රක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීමේ වැදගත්කම හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. මන්ද යත්, එය රක්ෂණය පිළිබඳ වැඩි විශ්වාසයක් ඇති වීම කෙරෙහි සෘජුව බලපාන බැවිණි. ඒ අනුව, විශ්වසනීය බව ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. අපි අවදානම් ආවරණය සම්බන්ධයෙන් දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය දැනුමෙන් වත්මන් සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන් යන අංශ දෙකම සන්නද්ධ කිරීමට උත්සාහ කරමින්, මහජන සහ ඩිජිටල් සන්නිවේදන වේදිකා ආවරණය කෙරෙන සමබර ප්‍රවේශයක් භාවිතා කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත්තෙමු. ගිවිසුම්ගත බැඳීමක් ලෙස රක්ෂණය පිළිබඳ මහජන අවබෝධය වැඩි කිරීමෙන් සහ දැනුවත් තෝරා ගැනීම් සිදු කිරීමට පුද්ගලයන් සවිබල ගැන්වීමෙන් වඩාත් දැනුවත් සහ විශ්වාසදායක රක්ෂණ ක්ෂේත්‍රයක් ඇති කිරීමට අපි දායක වෙමු.

## පාර්ශවකරුවන් සඳහා වටිනාකමක් එක් කිරීම

2023 දී, රක්ෂණ කර්මාන්තය හැඩගැස්වීමට උපකාරී වන මූලාරම්භයන් ගෙන ඇති අතර එය රක්ෂණ ඔප්පු හිමියන් ඇතුළු පාර්ශවකරුවන් කෙරෙහි ධනාත්මක අයුරින් බලපායි. මේ අතරින් මූලාරම්භයන් කිහිපයක් පහත පරිදි වේ:

- රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය සහ මෙම විශ්වාසය කෙරෙහි බලපාන අභියෝග සහ කරුණු හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කොළඹ විශ්ව විද්‍යාලයේ ජන විකසන අධ්‍යයන අංශය විසින් පවත්වනු ලබන පුළුල් අධ්‍යයනයක් ආරම්භ කර ඇත. මූලික ඉලක්කය වූයේ මහජන විශ්වාසයට බලපාන සාධක හඳුනා ගැනීම සහ රට තුළ රක්ෂණ ව්‍යාප්තිය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සැකසීමයි. සමීක්ෂණ සොයාගැනීම්වලින් හෙළි වූ ආකාරයට සාමාන්‍ය රක්ෂණ විශ්වාසනීයත්ව දර්ශකය 100 න් 50.2 ක් විය.

  මෙම අධ්‍යයනයේ සොයාගැනීම් මගින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ලැබුණු අතර එමගින් මහජන විශ්වාසය ඉහළ නැංවීම සහ රක්ෂණ ව්‍යාප්තිය වැඩි කිරීම සඳහා ඉදිරි සැලැස්මක් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඉදිරි වසරවලදී රටේ රක්ෂණ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සමග එක්ව රක්ෂණ සමාගම් වෙත කොළඹ කොටස් හුවමාරුවේ නව ආයතනික පාලන රීති පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී. දැඩි පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීමෙන් විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම පමණක් නොව, රක්ෂණ ක්ෂේත්‍රය තුළ විශ්වාසනීයත්වය තහවුරු වීම ද සිදු වන බව අපි තරයේ විශ්වාස කරමු. එවැනි ප්‍රගතිශීලී මුලපිරීම් හරහා සියළු පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා රක්ෂණ ක්ෂේත්‍රයේ ස්ථාවරභාවය සහතික කරමින් පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා වන අපගේ කැපවීම අපි යළිත් තහවුරු කරමු.

- මෝටර් රථ අනතුරුවලින් පීඩාවට පත් තුන්වන පාර්ශවීය වින්දිතයන්ට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන්ට වන්දි ලබා දීම සඳහා ලියාපදිංචි කළ සාමාන්‍ය රක්ෂණ සමාගම් මගින් පහසුකම් සලසන නව්‍ය යෝජනා ක්‍රමයක් සඳහා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ, අධිකරණ නියෝග ලබා ගැනීමේ අවශ්‍යතාවයකින් තොරව

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ සමාලෝචනය

3 වන පාර්ශවයක් මියයාමකදී රුපියල් 500,000 ක් ද, පූර්ණ ආබාධිතයන් සඳහා රු. 500,000 සීමාවට යටත්ව චක්‍රලේඛයේ සඳහන් ප්‍රමාණවලට වන්දියක් ලැබෙනු ඇත. මෙම නව්‍ය ක්‍රියාමාර්ගය ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ සහයෝගීතාවය ඇතිව ප්‍රධාන පාර්ශවකරුවන් සමග එක්ව සකස් කරන ලද අතර, එය 2024 දී ක්‍රියාවට නැංවීමට නියමිතය. එමගින් රක්ෂණ ක්ෂේත්‍රයේ සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කරන අතර අනතුරුවල තුන්වන පාර්ශවීය වින්දිතයන්ගේ අවශ්‍යතා වඩාත් කාර්යක්ෂමව සහ දයානුකම්පාවෙන් යුතුව සපුරාලීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි කැපවීම අවධාරණය කරයි.

## උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ කර්මාන්තයේ නියාමනයේ සහ අධීක්ෂණයේ විවිධ අංශ වැඩිදියුණු කිරීමේ අරමුණින් 2023 සිට 2027 දක්වා විහිදෙන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාවට නැංවීම ආරම්භ කර ඇත. අවදානම් පාදක අධීක්ෂණය, වෙළඳපොළ හැසිරීම් නියාමනය, හිමිකම් පෑම් කළමනාකරණය, නියාමන රාමුව වැඩිදියුණු කිරීම සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ඇතුළුව විවිධ ක්ෂේත්‍ර හරහා විහිදෙන ප්‍රධාන මුල පිරීම් කිහිපයක් මෙම සැලැස්මට ඇතුළත් වේ.

උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ 2023 අදියර අවසන් වන විට එහි දක්වා ඇති මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට අදාළව සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. අවදානම් පාදක අධීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ වෙත යොමු වෙමින් මූලික රක්ෂණ මූලධර්මයන්හි පරතර විශ්ලේෂණයන් ආරම්භ කර ඇත. වෙළඳපොළ හැසිරීම් රෙගුලාසි සමාලෝචනය කර ඇති අතර පරිපූර්ණ නියාමන රාමුවක් සැකසීම සඳහා මූලික කටයුතු සම්පාදනය කර ඇත. හිමිකම් කළමනාකරණ ක්‍රියා පටිපාටි ඇගයීමට ලක් කර ඇති අතර වැඩිදියුණු කිරීම සඳහා වන මාර්ගෝපදේශ කෙටුම්පත් කර ඇත. මීට අමතරව, නියාමන කාර්යයන්ට ඵලදායී ලෙස සහාය වීම සඳහා යටිතල පහසුකම් සහ පරිපාලන හැකියාවන් වැඩිදියුණු කිරීමට උත්සාහ දරා ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2024 සිට 2027 දක්වා එහි උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ මීළඟ අදියර කරා ගමන් කරන විට එය පෙර අදියරේ ජයග්‍රහණ මත අඛණ්ඩව වර්ධනය වනු ඇත. අවදානම් පාදක අධීක්ෂණ ක්‍රමවේද තවදුරටත් සකස් කිරීම, වෙළඳපොළ හැසිරීම සඳහා නියාමන රාමුව සම්බන්ධ කටයුතු අවසන් කිරීම, වැඩිදියුණු කළ හිමිකම් කළමනාකරණ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම සහ රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීම මෙයට ඇතුළත් වේ. පාර්ශ්වකරුවන් විසින් හඳුනාගෙන ඇති අවශ්‍යතා සහ අවධානය යොමු විය යුතු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සමීක්ෂණ පර්යේෂණ සොයාගැනීම්වලින් ලබාගත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම කෙරෙහි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ප්‍රමුඛත්වය දෙනු ඇත. තවද, ශක්තිමත් යටිතල පහසුකම් සහ පරිපාලන සහාය සහතික කිරීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සඳහා වැදගත් වනු ඇත. සිය උපාය මාර්ගික ඉලක්ක වෙත කැපවී සිටීමෙන්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අරමුණ වන්නේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලන සහ ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික ස්ථාවරත්වයට දායක වන මනාව නියාමනය කරන ලද සහ ප්‍රත්‍යාස්ථ රක්ෂණ කර්මාන්තයක් ඇති කිරීමයි.

## ප්‍රධාන නියාමන මුලපිරීම්

2023 දී, මෙම වාර්තාවේ සාමාන්‍ය සමාලෝචනයේ දී සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි රක්ෂණ අංශයේ නියාමනය වැඩිදියුණු කිරීම සඳහා නියාමන ප්‍රතිසංස්කරණ සහ මුලපිරීම් මාලාවක් හඳුන්වා දෙන ලදී.

## අනාගත අපේක්ෂාවන්

ශ්‍රී ලාංකීය රක්ෂණ ක්ෂේත්‍රය පවත්නා අභියෝග මධ්‍යයේ වුවද, ඉදිරි වසරවල තිරසාර වර්ධනයක් සහ නව්‍යතාවයට ගැළපෙන පරිදි ප්‍රත්‍යාස්ථව සහ අනුවර්තනය වෙමින් පවතී. තාක්ෂණික දියුණුව වැළඳගැනීමෙන්, නවෝත්පාදනයන් පෝෂණය කිරීමෙන් සහ වෙනස් වෙමින් පවතින පාරිභෝගික අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන්, රක්ෂණකරුවන්ට නව අවස්ථා විවෘත කර රක්ෂණ වෙළෙඳපොළේ ගතිකත්වය තුළ පාර්ශවකරුවන් සඳහා කල් පවත්නා වටිනාකමක් නිර්මාණය කළ හැකිය.

තවද, අනන්‍ය පාරිභෝගික අවශ්‍යතා සපුරාලන සරළ සහ අභිරුචීන් අනුව සකස් කරන ලද ප්‍රතිපත්ති තිබීම ඉතා වැදගත්වේ. නූතන රක්ෂණ අවශ්‍යතා සපුරාලන රක්ෂණ නිෂ්පාදන ව්‍යුහගත කිරීමේ සහ සැලසුම් කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2024 වසර දක්වා ප්‍රධාන මූලාරම්භයන් ස්ථිර ලෙස පවත්වා ගනු ලබයි. රක්ෂණ නියාමන පනතට සහ අවදානම් පාදක ප්‍රාග්ධන රාමුවට සිදු කරන ප්‍රතිසංස්කරණ වැනි අඛණ්ඩ ප්‍රයත්නයන් සමගින් ඩිජිටල් පරිවර්තනය, වෙළෙඳපොළ හැසිරීම් අධීක්ෂණය කිරීමේ ශක්තිමත් රාමුවක් ස්ථාපිත කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා මූල්‍ය ත්‍රස්තවාදය වැළැක්වීමේ අවශ්‍යතා අධීක්ෂණය කිරීම සහ එමගින් ක්ෂේත්‍රය පුරා අනුකූලතාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. රක්ෂණ ක්ෂේත්‍රය තුළ නියාමනයේ විශිෂ්ටත්වය, නවෝත්පාදන සහ රක්ෂණ ක්ෂේත්‍රය තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ පාර්ශවකරුවන්ගේ ආරක්ෂාව සඳහා අපගේ කැපවීම මෙම මුලපිරීම් මගින් අවධාරණය කෙරේ.

තවද, රට පුරා සිටින අවදානමට ලක්විය හැකි පුරවැසියන් ඇතුළත් වන පරිදි මුළු රටටම පොදු රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීමේ ශක්‍යතාව ගවේෂණය කිරීමට අපි අදහස් කරමු.

## අගය කිරීම

අපගේ කණ්ඩායමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සඳහා ඉවහල් වූ අපගේ සභාපතිවරයා සහ කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ලබා දුන් නිරන්තර මගපෙන්වීම සහ සහයෝගය පිළිබඳව මම බෙහෙවින් කෘතඥ වෙමි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ සමස්ත කණ්ඩායමට ඔවුන්ගේ නොසැලෙන කැපවීම සහ සියළු පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබා දීම සඳහා වෙහෙස මහන්සි වී ක්‍රියා කිරීම මම අවංකවම අගය කරමි.

2023 වසර තුළ රක්ෂණ ක්ෂේත්‍රයේ සංගම් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් දැක්වූ නොමසුරු සහාය පිළිබඳව ද ස්තූතිවන්ත වෙමි. අප මුහුණ දෙන අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීම සඳහා රක්ෂණ කර්මාන්තය සමග අපගේ අඛණ්ඩ සහයෝගීතාවය පවත්වා ගනු ඇතැයි මම දැඩි ලෙස අපේක්ෂා කරමි. රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට සහ එමගින් කර්මාන්තය පිළිබඳ ධනාත්මක හැඟීමක් ඇති කිරීමට අපි කැපවී සිටිමු.



**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජනරාල්

# කොමිෂන් සභාවේ සාමාජිකයින්
# සහ කාර්ය මණ්ඩලය

# කොමිෂන් සභාවේ සාමාජිකයින්



01. රසික් සරූක් මහතා - ජනාධිපති නීතිඥ සභාපති

02. ඒ කේ සෙනෙවිරත්න මහතා

03. ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය




04. සංජීව දිසානායක මහතා

06. සංජීව ඇන්තනි මහතා

05. බ්‍රයන් සෙල්වනායගම් මහතා

07. ආචාර්ය ප්‍රසාද් සමරසිංහ

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව



**රසික් සරූක් මහතා**
**ජනාධිපති නීතීඥ**
**සභාපති**

ජනාධිපති නීතීඥවරයෙකු, රාජතාන්ත්‍රිකයෙකු හා රාජ්‍ය සංස්ථා රැසක හිටපු සභාපති වන රසික් සරූක් මහතා ජ්‍යෙෂ්ඨ නීතීඥයෙකි.

ඔහු සතොස ආයතනයේ සභාපති ධුරය දැරූ අතර ඔහුගේ සේවා කාලය තුළ එනම් (1978 සිට 1989) දක්වා වූ කාලය තුළ සතොස ආයතනය ලාභ ලබන හා ශක්‍යතාවයෙන් යුතු ආයතනයක් බවට පත් කළ අතර ඉඩම් සංවර්ධනය හා සීමා සහිත සතොස මෝටර්ස් හා සීමා සහිත ලංකා මිල්ක් ෆුඩ්ස් වැනි ලැයිස්තුගත පොදු සමාගම් ගණනාවක් ස්ථාපනය කරමින් දේපළ රැසක් අත්පත් කර ගැනීමට මෙම ආයතනයට හැකි විය.

ඔහු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය සහ ලංකා බැංකුව යන ආයතනවල සභාපති ධුරය ද දැරූ අතර මුදල් කොමිෂන් සභාවෙහි සාමාජිකයෙකි.

ඔහු එවකට යුගෝස්ලෝවියානු ෆෙඩරල් ජනරජයේ තානාපති ලෙසත් ඉන් පසුව හංගේරියාවේ පළමු තානාපති ලෙසත් තානාපති සේවයෙහි කටයුතු කළේය. ඉන් පසුව, ඔහු සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස පත් කෙරිණි.

වර්තමානයේ ඔහු බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි කළමනාකරණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකි.

ඔහු මාතර සර්වේශස් පාසලේ හා කොළඹ සහිරා විද්‍යාලයේ ආදි සිසුවෙකි.



**ඒ.කේ. සෙනෙවිරත්න මහතා**

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි.

සෙනෙවිරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ විශේෂ ගෞරව උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ඔහු 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක් විය. ඔහුගේ සේවාස්ථ පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු ඔහු 1996 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. 2006 දී ඔහු එම අමාත්‍යාංශයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අධ්‍යක්ෂවරයෙකු ලෙස අනුයුක්ත කරන ලදී. 2015 දී ඔහු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලදී. 2018 ජනවාරි මාසයේ සිට සෙනෙවිරත්න මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කළේය. පසුව ඔහු 2018 පෙබරවාරි මාසයේදී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස පත් කරන ලද අතර 2020 නොවැම්බර් දක්වා ඔහු එම තනතුරේ කටයුතු කළේය.

පසුව ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස කටයුතු කර ඇත. ඔහු නැවතත් 2022 අගෝස්තු මාසයේ සිට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස පත් කර ඇත.

සෙනෙවිරත්න මහතා රාජ්‍ය ආයතන රැසක මණ්ඩල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කර ඇත.



**ඉවෙට් ප්‍රනාන්දු මිය**

දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරිය වන ඉවෙට් ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ ක්ෂේත්‍රය භාරව කටයුතු කරන්නීය. ඇය බැංකු අධීක්ෂණය සහ නියාමනය, විදේශ විනිමය කළමනාකරණය සහ මුදල් කළමනාකරණය යන ක්ෂේත්‍රවල මහ බැංකුවේ වසර 30 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇත. මෙම කාලසීමාව තුළ ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ විනිමය පාලකවරිය ලෙස කටයුතු කර ඇති අතර බැංකු අධීක්ෂණ, මුදල්, විදේශ විනිමය සහ සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු භාර සහකාර අධිපති ධුරය ද හොබවා ඇත.

ප්‍රනාන්දු මහත්මිය බැංකු අධීක්ෂණය සහ නියාමනය, සාමාන්‍ය බැංකු මෙහෙයුම්, යහපාලන භාවිතාවන්, දුර්වල බැංකු විශ්ලේෂණය, මුදල් කටයුතු, මුදල් කළමනාකරණය සහ නායකත්ව කුසලතා වැනි විවිධ අංශ පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා වන දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වෙනත් සංසද කිහිපයකට සහභාගි වී ඇත. ඇය රැකියාව ආශ්‍රිත විෂයයන් පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් කිහිපයක සහ මණ්ඩල සාකච්ඡා කිහිපයක සම්පත් දායකවරියක් ලෙස කටයුතු කර ඇත. ප්‍රනාන්දු මහත්මිය දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව සහ ජාතික ගෙවීම් කවුන්සිලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය යන ආයතනවල සභාපතිනිය ලෙසත් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකාවක් ලෙසත් ක්‍රියා කරන්නීය. ඇය කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍යමය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ඇත.



**සංජීව දිසානායක මහතා**

සංජීව දිසානායක මහතා හොංකොං විශ්වවිද්‍යාලයෙන් මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු 1997 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස ලියාපදිංචි විය. ඔහු ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්ත නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර දැනට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරී ඉටු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇත.

සංජීව දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන දෙඅංශයේම අත්දැකීම් ඇති අතර දූෂණයට එරෙහි ෆීජි ස්වාධීන කොමිෂන් සභාවේ ද කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකි.



**බ්‍රයන් සෙල්වනායගම් මහතා**

බ්‍රයන් සෙල්වනායගම් මහතා සිලෝන් බිස්කට් ලිමිටඩ්හි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

ඔහු කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයේ (එක්සත් රාජධානිය) ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, වරලත් අලෙවිකරණ ආයතනයේ (එක්සත් රාජධානියේ), ශ්‍රී ලංකා සහතික කළ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරණ අතර සුරැකුම්පත් සහ ආයෝජන වරලත් ආයතනයේ වරලත් සාමාජිකයෙක් වේ. (එක්සත් රාජධානිය)

ඔහු ශ්‍රී ලංකා වරලත් අලෙවිකරණ ආයතනයේ හිටපු සභාපතිවරයා වන අතර වරලත් අලෙවිකරණ ආයතනයේ (එක්සත් රාජධානියේ) විගණන සහ අවදානම් කමිටුවේ සාමාජිකයෙකු ද විය. ඔහු කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම් කිහිපයක් වන ඔනලි හෝල්ඩිංස් පීඑල්සී, සිලෝන් ලෑන්ඩ් ඇන්ඩ් ඉක්විටි පීඑල්සී, ගෝල්ෆේස් කැපිටල් පා(ර්)ට්න(ර්)ස් පීඑල්සී, රේනුකා ඇග්‍රි ෆුඩ්ස් පීඑල්සී සහ රේනුකා ෆුඩ්ස් පීඑල්සී යන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලයන්හි සේවය කර ඇත.

ඔහු රොටරි සමාජයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වන අතර බටහිර කොළඹ රොටරි සමාජයේ හිටපු සභාපතිවරයා ද වේ.

ඔහු විගණනය, බැංකු සහ මූල්‍ය සේවා, දේපල සංවර්ධනය සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන්හි වසර 25 කට අධික සේවා පළපුරුද්දක් ඇත. ඔහු මුළු දිවියිනටම සාම විනිසුරුවරයෙක් ද වේ.



**සංජීව ඇන්තනි මහතා**

සංජීව ඇන්තනි මහතා 1996 සිට අපරාධ, සිවිල්, කම්කරු සහ වාණිජ නීතිය පිළිබඳ විශේෂඥ දැනුම සහිත නීතිඥවරයෙකි. ඔහු කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

ඔහු කම්කරු දෙපාර්තමේන්තුවේ බේරුම්කරුවෙකු ලෙස මනා පළපුරුද්දක් සහිත වන අතර නිල නොවන මහේස්ත්‍රාත්වරයෙකු ලෙසද කටයුතු කරයි.

දැනට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් නීතිඥ සංගමයේ උප සභාපති ධුරය දරන ඔහු මීට පෙර එහි සභාපතිවරයා ලෙස කටයුතු කර ඇත.



**ආචාර්ය ප්‍රසාද් සමරසිංහ**

ආචාර්ය සමරසිංහ ලෝක ශ්‍රේණිගත කිරීම් අතර ඇති පර්යේෂණ විද්‍යාලයක් වන ඔස්ට්‍රේලියාවේ කැන්බරාහි පිහිටි ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයෙන් විදුලි සංදේශ පිළිබඳ ආචාර්ය උපාධිය ලබා ගත්තේය. ඔහු මොරටුව විශ්විද්‍යාලය වෙතින් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධියක් සහ විද්‍යාපති ඉංජිනේරු උපාධියක් ලබා ගෙන ඇත. විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ සහ ඉංජිනේරු හා තාක්ෂණ ආයතනයේ සාමාජිකයෙකු වන ඔහුට මූල්‍ය ගිණුම්කරණය, ව්‍යාපාර ගණිතය, සංඛ්‍යානය සහ දත්ත සැකසීම සඳහා දිවයිනේ හොඳම ප්‍රතිඵල සහිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික (I සහ II) ද ඇත.

ආචාර්ය ප්‍රසාද් සමරසිංහ ලංකා බෙල් ලිමිටඩ්හි කළමනාකාර අධ්‍යක්ෂවරයා වේ. ඊට අමතරව ඔහු බෙල් සොලියුෂන්ස් (පුද්ගලික) සමාගම,බෙල් වැන්චේජ් (පෞද්ගලික) සමාග මෙහි කළමනාකරණ අධ්‍යක්ෂ ධුරය දරන අතර, එච්එන්බී පීඑල්සී, එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සහ හේලීස් ෆයිබර් පීඑල්සී යන ආයතනවල අධ්‍යක්ෂ තනතුර දරයි. ආචාර්ය සමරසිංහ මහතා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති, ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පීඑල්සීහි තොරතුරු තාක්ෂණ ප්‍රධානී යන තනතුරු හෙබවීය.

# ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කණ්ඩායම




01. දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්)
02. චමරි ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ අධීක්ෂණ)
03. සතීෂ් කුමාර් මහතා (අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)
04. ප්‍රභාෂිණී සමරකෝන් මහත්මිය (අධ්‍යක්ෂ විමර්ශන)
05. දීපිකා නවරත්න මහත්මිය (අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
06. රාජන් නිරූබසිංහම් මහතා (අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)




07. බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)
08. චමරී හීනටිගල මහත්මිය (සහකාර අධ්‍යක්ෂ විමර්ශන)
09. ඩිරල් ප්‍රනාන්දු මහතා (සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ)
10. මලිති අම්බලන්ගොඩගේ මෙනවිය (සහකාර අධ්‍යක්ෂ නීති හා බලාත්මක කිරීම)
11. ලසන්ති තොටහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)
12. උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය (සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)

# කාර්ය මණ්ඩලය



ශ්‍යාමලී අත්තනායක මහත්මිය



තුෂාරි විජේගුණවර්ධන මහත්මිය



ඩෙසිකා රත්නායක මහත්මිය



කෝකිලා සිරිවර්ධන මහත්මිය



චරිත වික්‍රමසිංහ මහතා



පවිත්‍රා පුංචිහේවා මහත්මිය



තිළිණි වාකිෂ්ඨ මහත්මිය



අනුෂ්ක ඩිලාන් බණ්ඩාර මහතා



සඳමාලි කරුණාරත්න මහත්මිය



**පාරමී මුණසිංහ මෙනවිය**



**උපේක්ෂා ලියනගේ මෙනවිය**



**නිසල් කරුණාරත්න මහතා**



**නුවන් සුදර්ශණ මහතා**



**නදීශා විජේසිංහ මහත්මිය**



**රුවනි මල්දෙනිය මෙනවිය**



**සචිනි ගුණරත්න මෙනවිය**



**නිලක්ෂි රුවන්තිකා මෙනවිය**



**චාමර ප්‍රේමරත්න මහතා**

# කාර්ය මණ්ඩලය



සචී ගොඩවෙල මහත්මිය | කාංචනා දිල්රුක්ෂි මහත්මිය | පසින්ද්‍ර පෙරේරා මහතා



කනගසුන්දරම් කුරුපරන් මහතා | හසංක රත්නසිරි මහතා | ඊ. ශ්‍රීකාන්තන් මහතා



සුජීවා රණසිංහ මහත්මිය | ඩී.ඩබ්ලිව්.එස්.එස්. සුපුලි මහත්මිය | චන්දිමා කඹුරුගමුව මහත්මිය



**මල්හාරි වික්‍රමසිංහ මහත්මිය**



**හර්ෂණී පෙරේරා මහත්මිය**



**තිසලි අලුත්ගේ මෙනවිය**



**නිශාදි පෙරේරා මහත්මිය**



**වීණා සෙනෙවිරත්න මහත්මිය**



**සමන් සේනාධීර මහතා**



**සනත් උදයංග මහතා**



**නලීන් තලගල මහතා**



**චමින්ද ලාල් කුමාර මහතා**

# කාර්ය මණ්ඩලය



**එෂාදි අශ්මිකා මිහිරංගි මෙනවිය - ආධුනික** **බිහේෂ ඩිල්ෂාන් මහතා - ආධුනික** **හිරුෂි දිල්හාරි පීරිස් මෙනවිය - ආධුනික**

# සමාලෝචන

පොදු සමාලෝචනය | 24
මෙහෙයුම් සමාලෝචනය | 29

# පොදු සමාලෝචනය



## පනත සහ නියාමන ප්‍රතිසංස්කරණ පරිපාලනය කිරීම

### නීති සම්පාදනය

රක්ෂණ කොමිෂන් සභාවේ ("මින් මතු කොමිෂන් සභාව" ලෙස හැඳින්වෙන) අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙතැන් සිට "පනත" ලෙස හැඳින්වේ) මගින් රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ නියෝජිතයින් සහ පාඩු ගැලපුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා අදාළ නීතිමය රාමුව සපයයි.

2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් මගින් එම පනත සංශෝධනය කර ඇත.

### උප නීති සම්පාදනය

වර්ෂය තුළ පනත යටතේ සම්පාදනය කරන ලද රීති, නියාමන ප්‍රතිසංස්කරණ යටතේ පහතින් විස්තර කෙරේ.

### නියාමන ප්‍රතිසංස්කරණ

#### රීති

රක්ෂණ තැරැව්කරුවන් විසින් ගිණුම් පවත්වාගෙන යා යුතු ආකාරය සහ ආකෘතිය පිළිබඳ රීති 2023 වසරේ ප්‍රකාශයට පත් කරන ලද අංක 2292/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2022 අගෝස්තු 09 දින නිකුත් කරන ලදී.

### පනතේ 96 (අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන

1. **2023 විධාන අංක 01 - සාමාන්‍යය පිළිබඳ කොන්දේසිය**

   හිමිකම් පෑමේදී මෝටර් රථ රක්ෂණ ඔප්පුවල සාමාන්‍යය පිළිබඳ කොන්දේසිය සම්බන්ධයෙන් සාමාන්‍ය රක්ෂණ සමාගම්වල වත්මන් භාවිතයන් සැලකිල්ලට ගනිමින් සාමාන්‍යය පිළිබඳ කොන්දේසිය සම්බන්ධ විධානය සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. මෙම විධානය 2023 ජූනි 19 දින සිට බලාත්මක විය.

2. **2023 විධාන අංක 01 පිළිබඳ පැහැදිලි කිරීම**

   2023 ජූනි 19 දින 2023 අංක 01 හි අංක 01 අයිතමයේ "රක්ෂණකරු විසින් මෝටර් වාහන එහි වෙළඳපල වටිනාකමට රක්ෂණය කළ යුතුය" යන්න වෙනුවට "රක්ෂණකරුවෙකු විසින් මෝටර් රථ ඒවායේ වෙළඳපල වටිනාකම් අනුව රක්ෂණය කර ඇති බවට වගබලා ගත යුතුය" යන්න ආදේශ කර ඇත.

3. **2023 විධාන අංක 02 - රක්ෂණකරුවන්ගේ සහ රක්ෂණ තැරැව්කරුවන්ගේ ප්‍රධාන නිලධාරීන් පිළිබඳ විධාන**

   2021 දෙසැම්බර් සහ 2017 දෙසැම්බර් මාසවලදී ප්‍රධාන නිලධාරීන් පිළිබඳ රක්ෂණකරුවන් සහ රක්ෂණ තැරැව්කරුවන් වෙත නිකුත් කරන ලද විධානය අවලංගු කරන ලදී. මෙම විධානය මගින් රක්ෂණකරුවෙකුගේ හෝ රක්ෂණ තැරැව්කරුවෙකුගේ ප්‍රධාන නිලධාරියා සමාගමේ ඉහළම විධායක තනතුර දරන පුද්ගලයා විය යුතු බවට සහ ඔහු/ ඇය සමාගමේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය පාලනය, මග පෙන්වීම සහ අධීක්ෂණය සම්බන්ධ වගකීම දැරිය යුතු බවට නියම කරනු ලැබේ. තවද, ප්‍රධාන නිලධාරියා සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග වන සියලු සන්නිවේදනයන් හැකි ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

### වසර තුළ නිකුත් කරන ලද චක්‍රලේඛ

1. **2023 අංක 01 චක්‍රලේඛය - සාමාන්‍ය රක්ෂණ ඔප්පු සඳහා වාරික ගෙවීමේ වගකීම**

   මෙම චක්‍රලේඛය අංක 25 දරන චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත් කර ඇත්තේ සංචාර රක්ෂණය, සමුද්‍ර රක්ෂණය, හිමිකම් රක්ෂණය සහ වාරික ගෙවීමේ වගකීමේ අදාළත්වය බැහැර කිරීම සහ කෙටි කාලීන සාමාන්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ වාරික ගෙවීම සඳහා ණය ලබා නොදෙන පදනම මත රක්ෂණ සමාගම් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා ය. මෙම සංශෝධනය 2023 ඔක්තෝම්බර් 09 දින සිට බලාත්මක විය.

### වසර තුළ කරන ලද නිශ්චයන්

#### නිශ්චය අංක 13 සඳහා කරන ලද සංශෝධන

අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධයෙන් පනතේ 33 ඕ (1) වගන්තියට අනුකූලව රක්ෂණකරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ආකෘති පත්‍රය සහ දිවුරුම් ප්‍රකාශ සංශෝධනය කර ඇත.

#### නිශ්චය අංක 7, 8 හා 9 අවලංගු කිරීම සහ ආදේශ කිරීම

පිළිවෙලින් තැරැව්කරුවන් ලෙස ලියාපදිංචිය අපේක්ෂා කරන අයදුම්කරුවන්ට අදාළ වෘත්තීය හානිපූර්ණ රක්ෂණ ඔප්පුවේ වටිනාකම, තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන වෘත්තීය හානිපූර්ණ රක්ෂණාවරණයේ උපරිම සීමාව සහ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන ගාස්තුව සම්බන්ධයෙන් පිළිවෙලින් 2002 ඔක්තෝම්බර් 30 දිනැති තීරණ අංක 7, 2008 පෙබරවාරි 08 දිනැති තීරණ අංක 8 සහ 2028 අගෝස්තු 13 දිනැති තීරණ අංක 9 යන තීරණ 2023 සැප්තැම්බර් 27 දිනැති තීරණ අංක 7, 8 සහ 9 මගින් අවලංගු කර ප්‍රතිස්ථාපනය කරන ලදී. ඒ අනුව තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ගේ වෘත්තීය හානිපූරණ රක්ෂණ ඔප්පුවේ වටිනාකම, තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන වෘත්තීය හානිපූර්ණ රක්ෂණාවරණයේ උපරිම සීමාව සහ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව සංශෝධනය කර ඇත.

### වසර තුළ නිකුත් කරන ලද මාර්ගෝපදේශ

#### සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන සඳහා වන රක්ෂණ ඔප්පු රාමුව පිළිබඳ මාර්ගෝපදේශ

රක්ෂණ ඔප්පු හිමියන්ගේ පිළිබැඳියාවන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ලබා දෙන සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදනවලට අදාළ ඔප්පුවල අත්‍යවශ්‍ය සංරචක (අංග) සඳහා රාමුවක් සැකසීමට මෙම මාර්ගෝපදේශය 2023 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

### වෙළඳපොළ ව්‍යුහය

#### රක්ෂණකරුවන්

පනතේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් පුද්ගලයකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා මෙම පනත යටතේ දැනට ලියාපදිංචි වී ඇත්නම් හෝ පනත යටතේ ලියාපදිංචි වී ඇතැයි සැලකෙන්නේ නම් මිස, එම පුද්ගලයා ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.

පනතේ 13 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරවල නිරත වීමට කැමති ඕනෑම පුද්ගලයකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් සංස්ථාගත කර නිශ්චිතව දක්වා ඇති සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පනත යටතේ රක්ෂණකරුවෙකු ලෙස ලියාපදිංචි වී බලපත්‍රයක් ලබා ගත යුතුය.

වසර අවසානය වන විට සමාගම් විසි අටක් (28) ක් රක්ෂණකරුවන් ලෙස ක්‍රියාත්මක විය. තවද, ඒ අයි ජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්හි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා වන බලපත්‍රය 2022 අප්‍රේල් 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර ඇත. එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් 2020 ජූනි 1 වන දින සිට නව ජීවිත රක්ෂණ ව්‍යාපාරය ප්‍රාරක්ෂණය කිරීම නතර කර ඇත.

1 ප්‍රස්තාරය මගින් සමාගම් විසින් නියැලුණු රක්ෂණ ව්‍යාපාර පන්ති නිරූපණය කරයි. ක්‍රියාත්මක වූ සමාගම් 28 න් සමාගම් 2ක් සංයුක්ත රක්ෂණකරුවන් වූ අතර සමාගම් 14ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන ගිය අතර සමාගම් 12ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වා ගෙන යමින් තිබිණි. ඉහත සඳහන් සංයුක්ත රක්ෂණ සමාගම් 2න් සීමාසහිත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් සමාගම සිය සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වෙන් කිරීමේ ක්‍රියාවලියේ නියැළී සිටී.

1 ප්‍රස්තාරය : **රක්ෂණකරුවන් විසින් සිදු කරගෙන යන රක්ෂණ ව්‍යාපාරයේ පන්ති**




#### රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවෙකු යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කරගෙන යාම සඳහා පනත යටතේ ලියාපදිංචි වූ සමාගමකි. රක්ෂණ තැරැව්කරුවෝ ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණය සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරති.

වසර අවසානයේදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වූ සමාගම් ගණන 78කි. එම සමාගම් අතරින් සමාගම් 60ක් දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර දෙකෙහිම ලියාපදිංචි වී ඇති අතර සමාගම් 18ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයේ පමණක් ලියාපදිංචි වී ඇත.

2 ප්‍රස්තාරය මගින් වසර තුළ රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යන ලද රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති දැක්වේ.

2 ප්‍රස්තාරය : **රක්ෂණ තැරැව්කරුවන් විසින් පවත්වාගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්ති**




#### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාවක් ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන් වේ. රක්ෂණ නියෝයෙකු ලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයන් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකකි.

# පොදු සමාලෝචනය

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව වසර තුළ දී රක්ෂණ නියෝජිතයන් ලෙස බඳවා ගෙන ඇති මුළු පුද්ගලයන් සංඛ්‍යාව 17,989 ක් පමණ වන අතර එය පසුගිය වසරේ බඳවා ගත් සංඛ්‍යාව වූ 15,850 ට සාපේක්ෂව 13.5%ක ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 47,192 ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 47,102 ට සාපේක්ෂව 0.19%ක ඉහළ යාමකි.

3 ප්‍රස්තාරය මගින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයන් පෙන්නුම් කරයි.

3 ප්‍රස්තාරය : **31.12.2023 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්**




වසර අවසානය වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් නියෝජනය කරන මුළු රක්ෂණ නියෝජිතයන් සංඛ්‍යාව 662 ක් පමණ විය.

## අලාභ ගැලපුම්කරුවන්

වසර අවසාන වන විට අලාභ ගැලපුම්කරුවෝ 29 ක් සිටියහ.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි වීම පිළිබඳ රීති 2017 ජූලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

2011 වසරේ දී 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිෂන් සභාව සමඟ ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114 (1) යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. පනතේ 89අ (2) වගන්තියේ අලාභ ගැලපුම්කරුවන් සඳහා වන අවශ්‍යතා වන්ට අදාළව සීමිත ව්‍යතිරේකයක් ඇත. 89ආ වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචි වීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් කරමින් රීති සෑදීමට ඉඩ ඇත. පනතේ 89ඇ (1) වගන්තිය අනුව අවශ්‍ය තොරතුරු, ලේඛන සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු නිශ්චය කරමින් රීති සකසනු ලැබේ.

ඒ අනුව, කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා/හෝ පළපුරුද්ද උක්ත රීති මගින් නිශ්චිතව දක්වා ඇත.

## සමාගම්වල තත්වය හා ප්‍රාග්ධන වෙනස්කම්

කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 11 ක් වර්ෂ 2023 දෙසැම්බර් 31 දිනට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොට ඇත: එනම් යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී, එච් එන් බී ඇෂුවරන්ස් පීඑල්සී, අමානා ටකාෆුල් පීඑල්සී, අමානා ටකාෆුල් ලයිෆ් පීඑල්සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, සනස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී, කෝපරේට්ව් ඉන්ෂුවරන්ස් කම්පනි පීඑල්සී සහ එල් ඕ එල් සී ජෙනරල් ඉන්ෂුවරන්ස් පීඑල්සී වේ.

ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 ප්‍රස්තාරයෙන් දැක්වේ.

4 ප්‍රස්තාරය : **ලැයිස්තුගතවූ/ නොවූ රක්ෂණකරුවන්ගේ තත්වය**




2011 අංක 03 දරන සංශෝධිත පනතින් සියළු රක්ෂණ සමාගම් දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය වේ. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ජීවිතයේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තුගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරන සංශෝධිත පනත බලාත්මක වූ පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුළත දී දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙර ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු.මි. 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට කොමිෂන් සභාව නියම කර ඇත.

## රක්ෂණක සමාගම්වලින් සෙස් බද්දක් අය කිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අය කිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.2% ක් ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ථ ශුද්ධ වාරිකයෙන් 0.4%ක් ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කළ යුතු බවට පැහැදිලි කොට ඇත.

රක්ෂණකරුවන්ගෙන් සෙස් බද්ද එකතු කිරීම 2003 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ආරම්භ විය. සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ක්‍රියාකාරීත්වය 5 ප්‍රස්තාරය මගින් දැක්වේ.

## රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වගන්තිය ප්‍රකාරව ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සහ වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේදීත් රක්ෂණ කාර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදු වන වියදම් පියවාලීම සහ

ආ) කොමිෂන් සභාව එහි බලපත්‍ර, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාව නැංවීමේ දී දරණු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල සහ රාජ්‍ය බැංකුවල පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ.

5 ප්‍රස්තාරය : **සෙස් බද්ද සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**




## රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල කිසිඳු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නොවේ. 2002, 2005 සහ 2007 යන වර්ෂවල ජනවාරි 1 දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්මක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය හා කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

## පනතේ බලපෑමෙන් නිදහස් වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩල පනත යටතේ සාමාජික සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

## ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, 2011 අංක 3 දරන සංශෝධිත පනත මගින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් ඒ සඳහා අය කර ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධන පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට් පත්‍රයේ පළ කරන ලද අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාරව සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 දින සිට සියළු ම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පුවලින් (දීර්ඝ කාලීන ප්‍රතිරක්ෂණ ගිවිසුම් අතහැර) පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30% ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20% ක් විය.

## අදාළ අනෙකුත් කරුණු

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යංශයේ විෂය පථය යටතේ පවතියි. මෝටර් රථ රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකු ම තෙවන පාර්ශවීය ආරක්ෂණ ආවරණයකින් 2% ක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව යටතේ ස්ථාපිත කර ඇති මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය (1% ක් වූ දායකත්වය 2021 ඔක්තෝම්බර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි 2% දක්වා ඉහළ නංවන ලදී).

මෙම දායක මුදල් හඳුනා නොගත් මෝටර් රථවලින් සිදු වන අනතුරුවල වින්දිතයන් සඳහා වන්දි ලබා දීමට භාවිත කරනු ලැබේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නියෝජනය වේ.

### මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මින් පෙර පිහිටුවන ලද මූල්‍ය පද්ධති අධීක්ෂණ සභාව ප්‍රතිස්ථාපනය කරමින් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ XI කොටස මගින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව ස්ථාපිත කරන ලදී. එය මූල්‍ය අංශයේ නියාමකයන්ගේ ජ්‍යෙෂ්ඨ නියෝජිතයන්ගෙන් සමන්විත වන අතර මහ බැංකු අධිපතිවරයා එහි සභාපතිත්වය දරයි. එම කමිටුවේ පරමාර්ථය වනුයේ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සුරක්ෂිත කිරීමට දායක වීමයි. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුවෙහි කොමිෂන් සභාව නියෝජනය කරයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකට ම ලබා ගත හැකි ය.

සියලුම රක්ෂණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ විධායක කමිටුව, ක්‍රියාකාරකම්වල සමස්ත කළමනාකරණය සඳහා වගකිව යුතු අතර තම ක්ෂේත්‍රවලට අදාළ විෂයයන් පිළිබඳ විධායක කමිටුවට නිර්දේශ ඉදිරිපත්

# පොදු සමාලෝචනය

කරන පහත කමිටු මගින් එයට සහාය ලබා දේ:

- ජීවිත රක්ෂණ සන්සදය
- සාමාන්‍ය රක්ෂණ සන්සදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සන්සදය
- මානව සම්පත් අනු කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණ හා විකුණුම් සන්සදය
- ආයුගණක අනු කමිටුව

## ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ රක්ෂණ කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම් වන අතර එය රක්ෂණ තැරැව්කරුවන්ගේ යහපත සඳහා පිහිටුවා ඇත.

## ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්ත වන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

ශ්‍රී ලංකා  රක්ෂණ ආයතනය ලන්ඩන්යේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධිත වන අතර එමගින් එවැනි වෘත්තීය ආයතනවල රක්ෂණ විභාග පරිපාලනය කරයි. රක්ෂණ ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයින් සඳහා කෙටි කාලීන ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු රක්ෂණ අධ්‍යාපනයට අදාළ විවිධ වැඩසටහන් ආයතනය විසින් පවත්වනු ලැබේ. මීට අමතරව, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) සම්මන්ත්‍රණ, රක්ෂණයට අදාළ සමුළු, අන්තර් රක්ෂණ සමාගම් පැන විසඳුම් වැඩසටහන් සහ අන්තර් රක්ෂණ සමාගම් ක්‍රිකට් සහ දැල් පන්දු තරඟාවලි පැවැත්වීම මෙමගින් සිදු කෙරෙන අනෙකුත් ක්‍රියාකාරකම් කිහිපයකි.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ පැවැත්වීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. මෙම ආයතනය විසින් රක්ෂණ ව්‍යාපාරයේ පන්ති දෙකටම අදාළ වන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ ලිඛිත හා දුරස්ථ පරීක්ෂාව සහිත පරිගණක පාදක මාර්ගගත යන දෙයාකාරයෙන් ම අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

## රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස රක්ෂණ ඔම්බුඩ්ස්මන්වර ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් සමථ කිරීම සහ නිරාකරණය සඳහා එකී පාර්ශවයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ඇත.

## රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙකු ලෙස, කොමිෂන් සභාවට ප්‍රකාශන, රක්ෂණයේ මූලික මූලධර්ම වැනි මාර්ගෝපදේශ සහ රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු නිතිපතා ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන ඇතැම් මූලධර්ම ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය එලදායී ලෙස අධීක්ෂණය කිරීමට සහ මෙහෙයවීමට කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය (AFIR)

කලාපීය රක්ෂණ නියාමන සහයෝගීතා යාන්ත්‍රණයක් වන රක්ෂණ නියාමකයන්ගේ අසියානු සංසදය 2006 දී අරඹන කරන ලද අතර චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මේ සඳහා මුල පුරන ලදී. කොමිෂන් සභාව මෙහි සාමාජිකත්වය දරයි.

රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සංසදය ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය හා නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවදානම අඩු කරමින් සහයෝගීතාව වැඩි දියුණු කරමින් ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ ශක්‍යතාවය වැඩි දියුණු කිරීම තුළින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම මෙහි අරමුණ වේ.

## ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වය (GAIP)

ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වය, සිංගප්පූරුව මූල්‍ය අධිකාරිය, එරට නැන්යැං තාක්ෂණික සරසවිය සහ ගෝලීය රක්ෂණ කර්මාන්තයේ හවුල්කරුවන් සමඟ එකතුව ආසියාවේ පවතින ආරක්ෂණයේ හිඩැස් අවම කරමින් ආසියාව තුළ දීර්ඝ කාලීන අවදානම් දරාගැනීමේ හැකියාව ගොඩනැගීම සිය දැක්ම කරගනිමින් ආරම්භ කරන ලද ක්‍රියාවලියකි. එය රක්ෂණ කර්මාන්තය නියාමකයන් සහ ශාස්ත්‍රඥයන් අතර ඇති කර ගන්නා ලද ත්‍රෛපාර්ශවීය ලාභ නොලබන හවුල්කාරිත්වයකි. එය, සජීවී පරීක්ෂණාගාරය (Living Lab), ප්‍රතිපත්ති බුද්ධි මණ්ඩලය (Policy think tank) සහ කුසලතා සංවර්ධනය (talent development) යනුවෙන් කුළුණු තුනකින් සමන්විතය. ශාස්ත්‍රීය හවුල්කරුවා වශයෙන් සිටින සිංගප්පූරුවේ නැන්යැං තාක්ෂණික සරසවිය සමඟ එක් වී, ගෝලීය ආසියානු රක්ෂණ හවුල්කාරිත්වය විසින් ආසියාව මුහුණදෙන පවතින සහ නව ආරක්ෂණයේ හිඩැස් ආමන්ත්‍රණය කිරීම සඳහා කර්මාන්තය සහ කලාපීය ප්‍රතිපත්ති සකසන්නන් බලගැන්වීමට ක්‍රියාකාරී පර්යේෂණ, දත්ත, බුද්ධිමත් අදහස් සහ ප්‍රතිපත්තිමය නිර්දේශ නිකුත් කරනු ඇත.

කොමිසම වර්ෂ 2019 දී ආරාධනාවක් මත ගෝලීය ආසියානු රක්ෂණ හවුල් ක්‍රියාකාරීත්වයේ අනුබද්ධ හවුල්කරුවකු වශයෙන් සම්බන්ධ වූ අතර, එමගින් දැනුම හුවමාරු කර ගැනීම සහ ධාරිතාව ගොඩනැගීම වැනි කරුණු හරහා රක්ෂණ කර්මාන්තයේ ආරක්ෂණ හිඩැස් අවම කිරීම මගින් කොමිසම ප්‍රතිලාභ ලබනු ඇත.

# මෙහෙයුම් සමාලෝචනය
# අධීක්ෂණ සමාලෝචනය

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අධීක්ෂණ අංශය ලෙදාණාන්විත අවශ්‍යතාවන් සහ අධීක්ෂණ ක්‍රියා පටිපාටි නිරතුරුව අදාළ කර ගැනීම තහවුරු කරමින් රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය කරයි. මෙමගින් රක්ෂණ වෙළඳපළ තුළ සාධාරණත්වය, සුරක්ෂිත බව සහ ස්ථාවරත්වය තහවුරු කරන අතර රක්ෂණ ඔප්පු හිමියන්ට එලදායී ආරක්ෂාවක් සපයනු ලැබේ.**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි අවදානම්-පාදක අධීක්ෂණ ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථානුකූල වාර්තා සමාලෝචනය සහ නීති සහ රෙගුලාසි වල අනුකූලතා තත්ත්වය, රක්ෂණ සමාගම්වල අවදානම් ඇගයීම, පූර්ව අනතුරු ඇඟවීමේ අනුපාත ගණනය කිරීම ආදිය සහ ස්ථානීය පරීක්ෂණ කටයුතුවලින් සමන්විත වේ. තවද, අංශය විසින් විවිධ අරමුණු සඳහා සංඛ්‍යාන වාර්තා සකස් කරනු ලැබේ.**

**තවද, රක්ෂණ ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන් වෙත මූල්‍යනය සිදු කිරීමට එරෙහිව සටන් කිරීම සඳහා එම අංශය ඇතැම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනියි. මෙම ක්‍රියාමාර්ගවලට අවදානම් ඇගයීමේ මෙවලම් සමාලෝචනය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමග සහයෝගයෙන් AML/CFT ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම යනාදිය ඇතුළත් වේ.**



## රක්ෂණ සමාගම්වලින් පිටත සිදු කෙරෙන අධීක්ෂණය

### 1. ව්‍යවස්ථානුකූල වාර්තා පිළිබඳ සමාලෝචනය

#### අ. වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණිත මූල්‍ය ප්‍රකාශන හා ජීවගණකඥ වාර්තා

2021 දෙසැම්බර් 31 වන දින සංශෝධිත 14 සහ 15 තීරණයන්ට අනුව, සියලුම ලියාපදිංචි රක්ෂණ සමාගම් අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් තම ජීවගණකඥ වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියමිත කාල රාමුවට අනුකූල වීම සහ නිවැරදි බව මෙන්ම අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික වීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම අධීක්ෂණය කරන ලදී. එම වාර්තා ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවන්ගෙන් බැහැර වන අවස්ථා දක්වා ඇති දිනයන් වන විට නිවැරදි කරන ලෙස රක්ෂණ සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී. අවශ්‍ය අවස්ථාවලදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පසු විපරම් කිරීම ද සිදු කරන ලදී. ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ශන අතරතුර දී අවධානයට ලක් කරන ලදී.

#### ආ. රක්ෂණ සමාගම්වල අභ්‍යන්තර පාලන, පාලනය සහ අවදානම් කළමනාකරණය තක්සේරු කිරීම

සෑම රක්ෂණ සමාගමක් ම එක් එක් සමාගමේ අවදානම් තක්සේරු කිරීමේ වාර්තා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාවන්හි කොටසක් ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. මෙම වාර්තා මගින් ආයතනික ව්‍යුහය, හිමිකාරිත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, අලෙවිකරණය සහ බෙදා හැරීම වැනි කාර්යයන්, හිමිකම් පෑම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය යනාදී රක්ෂණ සමාගම්වල විවිධ අංශ පිළිබඳ ගුණාත්මක තොරතුරු සපයන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම්වල පාලනය, අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ රාමු පිළිබඳ පූර්ණ තක්සේරුවක් කිරීම සහ අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම තොරතුරු භාවිතා කරනු ලැබේ.

#### ඇ. ප්‍රතිරක්ෂණ/අවදානම් මාරු කිරීමේ වැඩසටහන්

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 31 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවන් විසින් පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව, රක්ෂණකරුවන් විසින් 2023 ජනවාරි 31 දින හෝ ඊට පෙර 2023 වර්ෂය සඳහා වන ප්‍රතිරක්ෂණ/අවදානම් මාරු කිරීමේ වැඩසටහන පිළිබඳ වාර්තාවක් ද 2023 මාර්තු 15 දින හෝ ඊට පෙර අදාළ සහතික සමග ප්‍රතිරක්ෂණ ගිවිසුම් විධිවිධාන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. රක්ෂණ සමාගම් 10ක් නියමිත කාලසීමාව තුළ සිය ප්‍රතිරක්ෂණ ගිවිසුම් විධිවිධාන ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති අතර සාමාන්‍ය රක්ෂණකරුවෙක් තම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ සංකූලතා හේතුවෙන් ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමට අසමත් විය. අපි ආයතනයේ අදාළ බලධාරීන්ට සහ කළමනාකාරිත්වයට මේ සම්බන්ධයෙන් ඇති අවදානම අවධාරණය කර ඇත්තෙමු.

තවද, සියළු රක්ෂණකරුවන් විසින් එළඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් සඳහා ම ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එම විධිවිධාන සමාලෝචනය කරන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට අදාළ රක්ෂණකරුවන් වෙත නිරීක්ෂණය කරන ලද උල්ලංඝනයන් පිළිබඳ දැනුම් දෙන ලදී.

# අධීක්ෂණ සමාලෝචනය

### ඈ. කාර්තුමය වාර්තා

අංක 12 දරන විධානයට 2022 ඔක්තෝම්බර් 06 දිනැතිව සිදු කළ සංශෝධනය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කාර්තුව අවසන් වී දින 30ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

සමාගම්හි කාර්යසාධනය ඇගයීම සඳහාත් පනතේ අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වන ලෙස ඉදිරිපත් කර ඇති බවට වගබලා ගැනීම සඳහාත් 2023 වසර පුරාවට ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා සියුම් ලෙස පරීක්ෂා කරන ලදී. එක් එක් සමාගමෙහි මූල්‍ය තත්වයන් කාර්තුමය වාර්තා පදනම් කර ගනිමින් නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබූ අතර මෙහි දී වත්කම් හා බැරකම්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලීතාවය සහ අනෙකුත් අවදානම් සහිත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී. එකී කාර්තුමය වාර්තාවන් සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද විෂමතාවන්, නීති රීති රෙගුලාසි වලින් බැහැරවීම් සහ අනෙකුත් වෙනස්කම් නියමිත කාලය සීමාවන් තුළ නිවැරදි කිරීමට අදාළ සමාගම් වෙත අප්‍රමාදව දැනුම් දෙන ලදී.

රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණය සඳහා වන වාරික ආදායම, ප්‍රතිරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය විශ්ලේෂණය කරන ලදී. තවද, අංශය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරෙන කාර්තුමය වාර්තා මත පදනම්ව රක්ෂණ සමාගම්වල පූර්ව අනතුරු ඇඟවීම් අනුපාත කාර්තුමය පදනමින් ගණනය කරනු ලබයි. මෙම අනුපාතවලට වාරික ස්ථායීතාවය, හිමිකම් පෑම් අනුපාතය, වියදම් අනුපාතය, රඳවා තබා ගැනීමේ අනුපාතය, ඒකාබද්ධ අනුපාතය, ප්‍රතිරක්ෂණ ප්‍රතිඵල, වත්කම් මත ප්‍රතිලාභ, කොටස් මත ප්‍රතිලාභ සහ ලාභය යනාදිය ඇතුළත් වේ. අංශය විසින් මෙම අනුපාතවල විචලනයන් සමාගම් අනුව මෙන්ම කර්මාන්ත මට්ටමින් ද අධීක්ෂණය සහ සංසන්දනය කරනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක විලනයන් කාර්තුමය වාර්තා සමග තවදුරටත් ඇගයීමට ලක් කෙරෙන අතර කාර්තුමය වාර්තා පිළිබඳ අනෙකුත් නිරීක්ෂණ සමග රක්ෂණකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

රක්ෂණකරුවන් විසින් පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීම සඳහා වාර්තා දෙකක් සෑම කාර්තුවක ම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

### ඉ. මාසික වාර්තාකරණය

2023 දී, එක් රක්ෂණ සමාගමක් කලින් කලට වාර්තා කරන ලද නොගැළපීම් මත පදනම්ව නිකුත් කරන ලද විධානයට අනුකූලව 12 වන විධානයෙහි නියම කර ඇති තොරතුරු අවශ්‍යතා අනුව මාසික වාර්තා ඉදිරිපත් කරන ලදී.

## 2. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාර අනුකූලතාවය අධීක්ෂණය කිරීම

2015 දී ප්‍රකාශිත නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති නියමයන්ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක් ම අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය සහ අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර එම ගණනය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයක් ඇතුළත අනුකූලතාවයන් සපුරා ගන්නා ලෙස සහ නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාළ රක්ෂණකරුවන් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙනු ලැබේ.

## 3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූල වීම නිරීක්ෂණය කිරීම

### අ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

සියළු ම රක්ෂණ සමාගම් තම රක්ෂණ අරමුදල්වලින් කොටසක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව තාක්ෂණික සංචිතවලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම්වලින් 30%ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය. මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් එකී විධිවිධානවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි යන්න වාර්තා හා අදාළ ලේඛන මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අධීක්ෂණය කරනු ලබයි.

නිරීක්ෂණය කරනු ලබන දෝෂ සහ නියාමන අවශ්‍යතාවන්ගෙන් බැහැර වීම් නියම කරනු ලබන කාල සීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

### ආ. නීර්ණය අංක 1 අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු 1 දින දරණ නීර්ණය අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අදාළ වන පරිදි, සියළු ම රක්ෂණ සමාගම් තමන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. විධාන අංක 01ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා ඉදිරිපත් කරන වාර්තා මත පදනම්ව තාක්ෂණික සංචිතයන්ගේ සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ ආයෝජන විස්තර මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබයි.

වර්ෂය තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවන් දෙදෙනෙකුට අදාළව අංක 01 විධානයෙහි අවශ්‍යතාවන්ට අනුකූල නොවීම් සහ ඉන් බැහැර වීම් නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, අංක 01 විධානයට අනුකූල වීම සඳහා වහාම අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරන ලෙස අදාළ සමාගම් වෙත දැනුම් දෙන ලදී. පසුව, සමාගම් දෙකම අංක 1 විධානයෙහි අවශ්‍යතා වලට අනුකූලව කටයුතු කර ඇත.

## 4. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති මත බලාත්මක උපාය මාර්ග

නුබුන්වත් සීමා (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවල නිශ්චිතව දක්වා ඇති අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්තා ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට රක්ෂණකරුවෙකු අපොහොසත් වීමේ අවදානමක් ඇති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අවදානම් පාදක ප්‍රාග්ධනයෙහි බලාත්මක කිරීමේ උපාය මාර්ගයට අනුකූල වන ලෙස නියම කිරීම මගින් නිවැරදි කිරීමේ පියවරයන් ක්‍රියාත්මක කරයි. මෙහි අරමුණ වන්නේ ගැටළු විසඳීම සඳහා ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමට හැකි වන පරිදි ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවධියේදී ම හඳුනාගැනීමයි. මෙමගින් අදාළ රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ලෙස පහළ යාමට පෙර තම අධීක්ෂණ මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට ඉඩ සැලසෙන අතර ඇති විය හැකි අර්බුධය මගහරවා ගැනීමට හැකිවේ. වර්ෂය තුළ සමාගම් තුනක් රු.මි. 500කට වඩා අඩු පවත්නා මුළු ප්‍රාග්ධනයක් සහ සමාගම් හතරක් 120% සහ 160% ක ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතයක් වාර්තා කළ අතර එම සමාගම්

බලාත්මක කිරීමේ උපාය මාර්ගය යටතේ වන අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස දැනුම් දෙන ලදී.

### 5. රක්ෂණ සමාගම්හි ස්ථානීය අධීක්ෂණය

2023 දී, අංශය විසින් ආයෝජන, මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය, ව්‍යවසාය අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලනය ඇතුළු රක්ෂණ සමාගමේ නිශ්චිත අංශ සම්බන්ධයෙන් වන කාර්ය සාධනය, ක්‍රියා පරිපාටි සහ පාලනයන් ඇගයීම අරමුණු කරගත් ස්ථානීය පරීක්ෂණ හතරක් පවත්වන ලදී. මෙම පරීක්ෂණවල දී හඳුනාගත් ප්‍රධාන සොයාගැනීම්, වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙතින් වන නිර්දේශ සමඟ රක්ෂණකරු වෙත දැනුම් දෙන ලදී.

## සංඛ්‍යාන වාර්තාකරණය සහ අනෙකුත් ක්‍රියාකාරකම්

### 1. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2022

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන විගණිත මූල්‍ය ප්‍රකාශන සහ සංඛ්‍යාලේඛන මත පදනම්ව අංශය විසින් රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2022 සකස් කරන ලදී. ඒ අනුව, රක්ෂණ කර්මාන්තයේ අත්පොත කර්මාන්තයට අදාළ සංඛ්‍යාලේඛන සහ සමාගම් අනුව ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන, වත්කම් සංකේන්ද්‍රණය ආදියෙන් සමන්විත වේ. එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

### 2. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

2023 දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි පහත තොරතුරු ඉදිරිපත් කරන ලදී.

- කාර්තුමය වාර්තා වලින් සකසන ලද සඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම කාර්තුමය පදනමින්.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ රක්ෂණ කර්මාන්ත පරිශිෂ්ඨය සඳහා රක්ෂණ ක්ෂේත්‍ර තොරතුරු වාර්ෂික පදනමින්.
- මහ බැංකුව විසින් සකස් කරන ලද පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තුවල තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා වාරික ආදායම, ගෙවන ලද හිමිකම් සහ වෙනත් ආදායම් පිළිබඳ පළාත් දත්ත.
- සමූහ වශයෙන් පුළුල් අධීක්ෂණයක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා ඇති තොරතුරු

### 3. මුදල් අමාත්‍යංශය වෙත ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම

අංශය විසින් අත්කර ගත් ප්‍රගතිය පිළිබඳ කාර්තුමය පදනමින් වාර්තාවක් සකස් කර මුදල් අමාත්‍යංශය වෙත ඉදිරිපත් කෙරිණි. මෙමගින් එක් එක් කාර්තුව තුළ අංශය මගින් සිදු කරන ලද අධීක්ෂණ කටයුතු ආවරණය කරනු ලැබේ.

### 4. අවදානම් මෙවලම

වාර්ෂික සහ ත්‍රෛ මාසික වාර්තා හරහා රක්ෂණකරුවන් විසින් සපයනු ලබන මූල්‍ය සහ අනෙකුත් අදාළ දත්ත මත පදනම්ව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර අවදානම් තක්සේරු කිරීමේ මෙවලමක් සකස් කර ඇත. මෙම මෙවලම එක් එක් රක්ෂණකරු ආශ්‍රිත අවදානම් මට්ටම හඳුනා ගැනීමට පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක නිර්ණායක සහ අවදානම් තක්සේරු සාරාංශය, නුබුන්වත් වාර්තා සහ ස්ථානීය පරීක්ෂාවන් ආදියෙන් රැස් කරගත් අදාළ දත්ත මත පදනම්ව දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා අවදානම් ප්‍රරේඛනය වෙන් වෙන් වශයෙන් සිදු කරන ලදී. ප්‍රධාන මූල්‍ය නිර්ණායකවලට ප්‍රාග්ධනය, වත්කම්, ලාභදායීත්වය, වෙළඳපල කොටස ආදිය ඇතුළත් වන අතර අනුකූලතා දෘෂ්ඨිකෝණයට නුබුන්වත් අවශ්‍යතා, ප්‍රතිරක්ෂණ නියමයන් සහ කොන්දේසි, විධාන අංක 1 සහ වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය යනාදියට අනුකූල වීම ඇතුළත් වේ. තවද, අවදානම් ප්‍රරේඛනය සඳහා ආයතනික ව්‍යුහය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල අනු කමිටු, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය යනාදිය පිළිබඳ කටයුතු කරන පාලනය සහ අවදානම් කළමනාකරණ දෘෂ්ඨිකෝණය සම්බන්ධයෙන් ද සලකා බලන ලදී.

ඒ අනුව, ලබා ගන්නා ලකුණු මත පදනම්ව රක්ෂණ සමාගම් "ඉහළ", "මධ්‍යම" හා "පහළ" අවදානම් සමාගම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මින් පෙර සඳහන් කළ අවදානම් බාණ්ඩ අනුව අදාළ රක්ෂණ සමාගම් වර්ගීකරණය කිරීම සඳහා අංශය විසින් වාර්ෂික කාර්යසාධනය යොදා ගනු ලැබේ. අංශය විසින් "ඉහළ අවදානම්" සමාගම් ලෙස වර්ගීකරණය කෙරෙන රක්ෂණ සමාගම්වල කාර්යසාධනය සමීපව අධීක්ෂණය කරනු ලැබේ. අවදානම් පාදක ප්‍රවේශය සැලකීමේ දී සමාගම්වලට නිශ්චිත වූ නියාමන අවශ්‍යතාවන් සහ අධීක්ෂණයේ ප්‍රමාණය රක්ෂණකරුගේ අවදානම් ලකුණු ප්‍රමාණය අනුව වෙනස් වනු ඇත.

### 5. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැළැක්වීම

#### අ. ක්ෂේත්‍රගත විමර්ශන

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමග සහයෝගීත්වයෙන් 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු 15 (1) (ඉ) වගන්තිය ප්‍රකාරව AML ස්ථානීය පරීක්ෂණ පහක් පවත්වන ලදී. මෙම පරීක්ෂාවන්හි අරමුණ වූයේ රක්ෂණ සමාගම්වල පාරිභෝගික තොරතුරු ලබාගැනීමේ සහ තහවුරු කර ගැනීමේ ක්‍රියාවලීන් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නීතිමය සහ නියාමන අවශ්‍යතා සහ ඒ ආශ්‍රිත නීති සහ රෙගුලාසිවලට අනුකූල වන්නේ ද යන්න ඇගයීමයි. අප්‍රමාදව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම පරීක්ෂාවන්වලදී සිදු කළ නිරීක්ෂණ පිළිබඳ අදාළ රක්ෂණකරුවන් දැනුවත් කෙරිණි.

#### ආ. අවදානම් මෙවලම

මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමග එක්ව සියළු ම දිගු කාලීන රක්ෂණ සමාගම් විශුද්ධිකරණයට ලක් වීමේ අවදානම් ඇගයීම අඛණ්ඩව සිදු කර ඇති අතර මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා මෙවලමක් ද සකස් කර ඇත.

ඒ අනුව 2022 ඔක්තෝම්බර් 1 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා කාලය සඳහා නිෂ්පාදන, පාරිභෝගිකයන්, දේශපාලනික වශයෙන් නිරාවරණය වූ පුද්ගලයන්, බෙදා හැරීමේ මාර්ග, ඒකාබද්ධ පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපරිපාටින්, අවදානම් කළමනාකරණය, සේවක අනලස් බව, අනුකූලභාවය සහ අභ්‍යන්තර පාලනයන් ආදී කරුණු පිළිබඳ එක් එක් සමාගමට අදාළ තොරතුරු රැස් කිරීම සඳහා

# අධීක්ෂණ සමාලෝචනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගු කාලීන රක්ෂණ සමාගම් අතර ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. මෙම තොරතුරු මත පදනම්ව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් දිගු කාලීන රක්ෂණය සමාගම්හි මුදල් විශුද්ධිකරණ විරෝධී/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමේ අවදානම නිර්ණය කිරීම සඳහා වන මෙවලම යාවත්කාලීන කරන ලදී.

### 6. ලාභාංශ බෙදාහැරීම්

2021 මාර්තු 10 දිනැති අංක 01 දරන විධානය සහ 2021 අගෝස්තු 30 සහ 2023 සැප්තැම්බර් 20 දිනැතිව එයට පසුකාලීනව සිදු කළ සංශෝධන ප්‍රකාරව රක්ෂණකරුවන්ගෙන් ලාභාංශ ප්‍රකාශන ඉල්ලීම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ලැබුණි. 2023 සංශෝධනය මගින් මූලික වශයෙන් අරමුණු කර ඇත්තේ රක්ෂණ සමාගම්වලින් වැඩ වර්ජනය, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වෙත ලැබිය යුතු සියළුම මුදල් අයකර ගැනීමට අදාළ මූල්‍ය බලපෑම් මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 17 සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතා වලට අදාළ විසඳුම් ලබා දීමයි. ඒ අනුව, රක්ෂණකරුවන් ලාභාංශ ප්‍රකාශ කිරීමේදී 2021 විධාන අංක 01 හි දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සපුරාලීමට අවශ්‍ය වන අතර එයට එම රක්ෂණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකී විධානයේ සඳහන් කර ඇති සියලුම නියමයන් සහ කොන්දේසි සලකා බලා ඇති බවට තහවුරු කිරීමක් ඇතුළත් වේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් කැමැත්ත ලබාදීමට පෙර ලාභාංශ ප්‍රකාශන ඉල්ලීම් 2021 අංක 01 දරන විධානයේ අවශ්‍යතා සහ සමාගමේ අනෙකුත් අදාළ මූල්‍ය සහ නුබුන්වත් කොන්දේසි අනුව වෙන වෙනම සමාලෝචනය කරනු ලැබේ.

### 7. රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණයේ මූලික මූලධර්මය (ICP) 16 පිළිබඳ සමීයුරු සමාලෝචන ක්‍රියාවලිය

වසර තුළදී, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා ව විසින් අධීක්ෂණ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සඳහා රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමය විසින් නිර්මාණය කරන ලද තක්සේරු උපාය මාර්ගයේ කොටසක් වන රක්ෂණයේ මූලික මූලධර්මය 16 සම්බන්ධ අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ ස්වයං-තක්සේරු කිරීමක් සහ සමීයුරු සමාලෝචනයක් සිදු කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ අධීක්ෂණ සහ නියාමන රාමුවල යම් දුර්වලතා හෝ හිඩැස්වල ස්වභාවය සහ ප්‍රමාණය හඳුනා ගැනීම සහ වත්මන් අධීක්ෂණ ධාරිතා මට්ටම සහ අනාගත අධීක්ෂණ සංවර්ධනයේ ප්‍රමාණය පිළිබඳ තොරතුරු සැපයීමයි.

### 8. රජයේ සුරැකුම්පත් වෙත රක්ෂණ කර්මාන්තය නිරාවරණය වීම

රක්ෂණ කර්මාන්තය මගින් රාජ්‍ය සුරැකුම්පත් තබා ගැනීම කෙරෙහි ඇති විය හැකි බලපෑම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද අතර ඕනෑම රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණයකින් රක්ෂණ කර්මාන්තය නිදහස් කිරීම සම්බන්ධයෙන් සලකා බලන ලෙස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින ලදී.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

### 1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරණ ගැසට් නිවේදනය සහ පසුව එයට සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව සියළු රක්ෂණ තැරැව්කාර සමාගම් සිය කාර්තුමය වාර්තා එක් එක් කාර්තුව අවසන් වී දින හතළිස් පහක් ඇතුළත ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2023 තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් සිය කාර්තුමය වාර්තා ඉදිරිපත් කළේය. අදාළ සමාගම්වල මූල්‍ය තත්වය, කාර්යසාධනය සහ නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම ආදිය ඇගයීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අදාළ සමාගම්වල කාර්තුමය වාර්තා සමාලෝචනය කරන ලදී. එහි දී නිරීක්ෂණය කරන ලද අනනුකූලතාවන් හෝ බැහැර වීම් පැහැදිලි කිරීම් සහ නිවැරදි කිරීම් සඳහා අදාළ තැරැව්කාර සමාගම් වෙත සන්නිවේදනය කෙරිණි.

රක්ෂණ තැරැව්කාර සමාගම් සිය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 06ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉදිරිපත් කරන විගණිත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමාලෝචනය කළ අතර රෙගුලාසිමය අවශ්‍යතාවලින් බැහැර වූ විට හා ප්‍රමාණාත්මක විචලනයන් වලදී පැහැදිලි කිරීම් හා නිවැරදි කිරීම් සඳහා අදාළ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත සන්නිවේදනය කරන ලදී.

### 2. ලියාපදිංචිය අළුත් කිරීම

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් 2024 වර්ෂය සඳහා තමන්ගේ වාර්ෂික බලපත්‍ර අලුත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලදී. බලපත්‍ර අලුත් කිරීමේ කටයුතු ඉදිරියට කර ගෙන යාමට පෙර, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සිය මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය ඇගයීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන (AFSs) සහ කාර්තුමය වාර්තා පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරන ලදී.

### 3. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළ රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස බලපත්‍ර ලබා ගැනීමට යෝජිත පාර්ශවයන් වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අයදුම්පත් ලැබිණි. ලියාපදිංචිය සඳහා නිර්දේශ කිරීමට පෙර විකුණුම් හා මූල්‍ය පුරෝකථනයන්, සංවිධාන සටහන, පවතින යටිතල පහසුකම් හා බාහිර විගණකගේ සහතිකය ඇතුළුව අයදුම්කරුගේ ව්‍යාපාර සැලැස්ම ඇතුළු අයදුම්කරුගේ ව්‍යාපාර සැලැස්ම අංශය විසින් විශ්ලේෂණය කරන ලදී.

### 4. රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා වන අවදානම් මෙවලම

සිය වාර්ෂික සහ ත්‍රෛ මාසික වාර්තා හරහා රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් සපයනු ලබන මූල්‍ය සහ අනෙකුත් අදාළ දත්ත මත පදනම්ව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර අවදානම් තක්සේරු කිරීමේ මෙවලමක් සකස් කර ඇත. මෙම මෙවලම එක් එක් සමාගම ආශ්‍රිත අවදානම් මට්ටම් හඳුනා ගැනීමට පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ලෙස ක්‍රියා කරයි. මුළු වත්කම්, ශුද්ධ ප්‍රාග්ධනය, කොමිස් ආදායම, වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය යනාදී මූල්‍ය දර්ශක මත පදනම්ව අවදානම් විශ්ලේෂණය සිදු කෙරේ.

පසුව, රක්ෂණ තැරැව්කාර සමාගම් ඒවාට අදාළ ලකුණු මත පදනම්ව "ඉහළ," "මධ්‍යස්ථ," සහ "අඩු" අවදානම් කාණ්ඩවලට වර්ග කෙරේ. "ඉහළ අවදානම්" ලෙස වර්ගීකරණය කර ඇති තැරැව්කාර සමාගම්වල ක්‍රියාකාරිත්වය සමීපව අධීක්ෂණය කිරීම කෙරෙහි අංශයේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ. නියාමන අවශ්‍යතා සහ අධීක්ෂණ තීව්‍රතාවය එක් එක් සමාගමේ අවදානම් ලකුණු මත පදනම්ව වෙනස් වන අතර එමගින් අවදානම් පාදක ප්‍රවේශයක් පිළිබිඹු කෙරේ.

# ආයුගණක වාර්තා පිළිබඳ සමාලෝචනය



රක්ෂණකරුවන් විචක්ෂණශීලීව අධීක්ෂණය කිරීම තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සහ වෙළෙඳපොළ ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ වගකීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලැබේ. ආයුගණක දෘෂ්ටිකෝණයක් තුළින් රක්ෂණ කර්මාන්තය සඳහා ශක්තිමත් නියාමන සහ අධීක්ෂණ රාමුවක් පවතින බවට ආයුගණක ඒකකය මගින් වග බලා ගනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නීති රීතිවලට අනුකූල වන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සහ පරීක්ෂාවන් හරහා මූල්‍ය පරීක්ෂණ සිදු කිරීම මගින් ඒකකය රක්ෂණ වෙළඳපල ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරනු ලැබේ. තවද, රක්ෂණ ඔප්පු හිමියන්ගේ අභිලාෂයන් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා වන්නේද යන්න පරීක්ෂා කිරීමේ අරමුණින් ඒකකය මගින් දිගුකාලීන රක්ෂණ නිෂ්පාදනවල ආයුගණක සහතික සමාලෝචනය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුළදී, දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණකරුවන් වෙතින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ආයුගණක වාර්තා සහ සාරාංශ 16ක්, සංචිත වාර්තා 14 ක් සහ කාර්තුමය වාර්තා 120ක් (කාර්තුවක් සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත වාර්තා 30කින් සමන්විත) ලැබිණි. ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපළෙහි ගතික සහ තරඟකාරී ස්වභාවය හේතුවෙන් නියාමනය සහ අධීක්ෂණය සඳහා ක්‍රියාකාරී ප්‍රවේශයක් අවශ්‍ය වේ.

## රක්ෂණ සමාගම් පිළිබඳ සිදු කෙරෙන සාමාන්‍ය අධීක්ෂණය

### ව්‍යවස්ථාපිත වාර්තා - රක්ෂණ ඔප්පු වගකීම්, ආයුගණක සාරාංශ සහ සංචිත වාර්තා සමාලෝචනය කිරීම

රක්ෂණකරුවන්ගේ ප්‍රමාණවත් ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2016 ජනවාරි 1 සිට නුඹුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රාමුව ක්‍රියාත්මක කරන ලදී. පනතේ 26 (1), 47 (1) හා 56 වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලද 14 විධානය සහ පනතේ 48 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කළ 15 විධාන අනුව සියළු ම ලියාපදිංචි කළ රක්ෂණ සමාගම් විසින් ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කළ යුතුය. පනතේ 49(ආ) වගන්තිය යටතේ නිකුත් කරන ලද 12 විධානය ප්‍රකාරව කාර්තුමය වාර්තා ඉදිරිපත් කළ යුතු වේ.

එක් එක් රක්ෂණකරුගේ කාර්ය සාධනය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම, තක්සේරු කිරීම සහ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල වන බවට සහතික කිරීම සඳහා ඒකකය විසින් පුළුල් රාමුවක් ස්ථාපිත කර ඇත. මෙම රාමුවට සමාගම් සමාලෝචන, අධීක්ෂණ අවදානම් තක්සේරු කිරීම්, හඳුනාගත් ගැටළු පිළිබඳ පසු විපරම් ක්‍රියා සහ රක්ෂණකරුගේ ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණ ඇතුළත් වේ.

අවදානම් පාදක ප්‍රාග්ධන රීතිවලට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ සමාගමක් ම අවම ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය සහ මුළු පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය පවත්වා ගත යුතු අතර එම ගණනය කිරීම වාර්ෂික සහ කාර්තුමය වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එහි අධීක්ෂණ සමාලෝචන ක්‍රියාවලියේ කොටසක් ලෙස, නීතිරීතිවලට අනුකූල වන බවට සහතික කිරීම සඳහා ඒකකය විසින් එවැනි ගණනය කිරීම් සමාලෝචනය කර විශ්ලේෂණය කරනු ලැබේ. රක්ෂණකරුවන්ට නුඹුන්වත් ආන්තික අවශ්‍යතා හෝ එවැනි ගණනය කිරීම් සම්බන්ධයෙන් සඳහන් කර ඇති නොගැළපීම් සපුරාලීමට නොහැකි නම්, නියමිත කාලසීමාවන් තුළ නීතිරීතිවලට අනුකූල වීමට සහ නොගැළපීම් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඒකකය විසින් සමාගම්වලට උපදෙස් දෙනු ලැබේ. ඒකකය විසින් අවශ්‍ය පරිදි තවදුරටත් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට ද ඉඩ ඇත.

වෙනත් දේ අතර, රක්ෂණ ඔප්පු හිමියන් කෙරෙහි වන සිය අනාගත වගකීම් ඉටු කිරීමට සහ නුඹුන්වත් අවශ්‍යතාවලට සහ

# ආයුගණක වාර්තා පිළිබඳ සමාලෝචනය

අනෙකුත් නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීමට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් රක්ෂණකරුවන්ට තිබේද යන්න සොයා බැලීම සඳහා එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සියලුම රක්ෂණකරුවන්ගේ මූල්‍ය තත්ත්වය ඒකකය විසින් පරීක්ෂා කරනු ලැබේ. මෙම විශ්ලේෂණය මගින් වත්කම්, වගකීම්, ද්‍රවශීලතාවය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධනය පිළිබඳ සලකා බලනු ලබන්නේ එවැනි සාධක රක්ෂණකරුගේ නුබුන්වත් අවශ්‍යතා සහ අනෙකුත් අවශ්‍යතාවලට අනුකූල වීමේ හැකියාව කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන බැවිනි. මෙමගින් අවිනිශ්චිතතාවයන් අපේක්ෂා කිරීමට සහ රක්ෂණකරුගේ ධාරිතාවය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි ගැටළු නිරාකරණය කිරීමට ඒකකයට හැකියාව ලැබේ.

රක්ෂණකරු ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වන්නේ ද යන්න පිළිබඳව සමාලෝචනය කිරීමට නිරන්තර අධීක්ෂණය ඉඩ ලබා දෙන අතර සත්‍ය හෝ පැන නැගීමට ඉඩ ඇති අධීක්ෂණ ගැටලු විසඳීම සඳහා ක්ෂේත්‍රගත විමර්ශනයන්ද ඉතා වැදගත් වේ. මෙම ක්ෂේත්‍රගත පරීක්ෂාවන් ශක්තිමත් අධීක්ෂණ ක්‍රියාවලියක අත්‍යවශ්‍ය අංගයක් ලෙස අධීක්ෂණය ඌණපූර්ණය කරයි. කෙසේ වුවද, සම්පත් හිඟය හේතුවෙන් ඒකකය විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්ෂේත්‍රගත පරීක්ෂාවක් සිදු කර නොමැත. ඒකකයේ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්ෂේත්‍රගත පරීක්ෂණ ඇතුළත් කිරීමට සැලසුම් කිරීමට බලාපොරොත්තුවේ. හඳුනා ගත් අවදානම් මට්ටම, ප්‍රමාණය සහ සංකීර්ණත්වය මත පදනම්ව රක්ෂණකරුවන් ප්‍රමුඛතාගත කර ඒ අනුව එක් එක් පරීක්ෂාවන් පවත්වන වාර ගණන, ඒවායේ විෂය පථය සහ ගැඹුර සකස් කරනු ඇත.

## දිගු කාලීන රක්ෂණ නිෂ්පාදනවල ආයුගණක සහතික සමාලෝචනය

2021 අංක 1 චක්‍රලේඛයට අනුව, පනතේ 37 (1) වගන්තියේ දක්වා ඇති පරිදි රක්ෂණ නිෂ්පාදනය දියත් කිරීමට යෝජිත දිනය සහ නිෂ්පාදනය පිළිබඳව නියම කර ඇති තොරතුරු රක්ෂණ සමාගම් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ, ඒකකය මගින් රක්ෂණ නිෂ්පාදන සහ අතිරේක ආවරණ (riders) 22 ක් සමාලෝචනය කර නියමයන් සහ කොන්දේසි සාධාරණ සහ අපක්ෂපාතී බවට සෑහීමකට පත්වීමෙන් පසු නිෂ්පාදන නිෂ්කාශනය කිරීමට සිය මතය ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාවලිය අතරතුර, ඒකකය විසින් අවශ්‍ය අවස්ථාවලදී සමාගම්වලින් පැහැදිලි කිරීම් ඉල්ලා සිටි අතර අවසන් තීරණය ගැනීමට පෙර ඔවුන්ගේ ප්‍රතිචාර සලකා බලන ලදී.

### රක්ෂණ මූලික මූලධර්මය අධ්‍යයනය - රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණ මූලික මූලධර්ම 14 (ICP 14)

“ප්‍රතිචාරාත්මක නීතිමය සහ නියාමන රාමුවක් සහතික කිරීම”, (උපායමාර්ගික සැලැස්ම 2023-2027) යන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ උපායමාර්ගික අරමුණට අනුකූලව, ඒකකය මගින් ICP 14 - “අධීක්ෂක විසින් නුබුන්වත් අරමුණු සඳහා අවශ්‍ය වත්කම් සහ වගකීම් තක්සේරු කිරීමේ අවශ්‍යතා සකස් කරයි” හි ස්වයං තක්සේරුවක් සහ සමාලෝචනයක් සිදු කරන ලදී. මෙම කාර්යයේ ප්‍රධාන පරමාර්ථය වූයේ වත්මන් අධීක්ෂණ සහ නියාමන රාමුවල දුර්වලතා සහ පරතරයන්ගේ ස්වභාවය සහ ප්‍රමාණය හඳුනා ගැනීම සහ වැඩිදුර සංවර්ධනය පිළිබඳ තොරතුරු සැපයීමයි. අධීක්ෂණ ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් පරතරයන් සහ දුර්වලතා මත පදනම්ව ඊළඟ අදියර ලෙස ඒකකය විසින් නිර්දේශ සකස් කරනු ඇත.

# නියාමන සමාලෝචනය



## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

වසර තුළදී කොමිෂන් සභාව විසින් කිසිදු රක්ෂණකරුවෙකු අලුතින් ලියාපදිංචි කර නැත. ඒ අනුව වසර සඳහා ලියාපදිංචි වූ රක්ෂණකරුවන් සංඛ්‍යාව 28 කි.

**පරිශිෂ්ඨය I:** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියලු රක්ෂණ සමාගම්වල නාම ලේඛණය සහ ඒ රක්ෂණ සමාගම් සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/පන්ති දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

### අත්හිටුවීම්

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව 2023 අප්‍රේල් 11 දින සිට බලාත්මක වන පරිදි රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදු කිරීමට අදාළව රක්ෂණ සමාගම් දෙකක ලියාපදිංචිය අත්හිටුවන ලදී. කොමිෂන් සභාවේ විධානයන් පරිදි එම සමාගම් විසින් නිවැරදි කිරීමේ පියවර ගැනීම සම්බන්ධයෙන් සලකා බලා 2023 මැයි 25 සහ 2023 මැයි 16 දිනවල දී උක්ත අත්හිටුවීම ඉවත් කරන ලදී.

පනතේ 18 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් හෝ කරන ලද යම් නිශ්චය කිරීමක් කඩ කර තිබීම හේතුවෙන් රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම සම්පූර්ණයෙන් ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් හෝ උප පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

## විධානයන්

1. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය තීරණය කර අවසාන වූ වහාම සමාගමේ වර්තමාන සමාගම් ලේකම් එම තනතුරෙන් ඉවත් කර ස්වාධීන සමාගම් ලේකම්වරයකු පත් කරන ලෙස පනතේ 57 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් රක්ෂණකරුවකු වෙත විධානයක් නිකුත් කරන ලදී.

   තවද, සමාගමේ අත්‍යවශ්‍ය වියදම් ගෙවීම් හැර, ප්‍රසාද දීමනා, වැටුප් වර්ධක, දිරිදීමනා ආදී සියලු අභිමත ගෙවීම්/ආයෝජන සිදුකිරීමෙන් වැලකෙන ලෙසට විධානයක්ද කොමිෂන් සභාව විසින් එම රක්ෂණකරුට නිකුත් කරන ලදි.

## අවවාද කිරීම්

නිශ්චය අංක 14 සහ 15 උල්ලංඝනය කිරීම සහ 2022 වසර සඳහා ප්‍රසාද දීමනා ගෙවීම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපොහොසත්වීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද අයවැය සීමාව ඉක්මවා සැබෑ ගෙවීම් සිදුකිරීම සම්බනධයෙන් කොමිෂන් සභාව විසින් රක්ෂණ සමාගම් වෙත අවවාද නිකුත් කරන ලදි.

එසේම, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු සම්බන්ධයෙන් පනවා ඇති විධානය පිළිපැදීමට අපොහොසත් වූ ප්‍රධාන නිලධාරිවරයෙක්ටද කොමිෂන් සභාව අවවාදයක් නිකුත් කරන ලදි.

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීමට උනන්දුව දැක්වූ පුද්ගලයන් හතර දෙනෙකුගෙන් නව ව්‍යාපාර යෝජනා හතරක් කොමිෂන් සභාව වෙත වසර තුළ දී ලැබී ඇත.

කොමිෂන් සභාව විසින් සමාගම් සංස්ථාපනය කිරීමට නම් සඳහා අනුමැතිය පුද්ගලයන් හතර දෙනෙකු වෙත වසර තුළ දී ලබා දී ඇත. කොමිෂන් සභාව විසින් මෙම වසර තුළ සමාගම් තුනකට රක්ෂණ තැරැව්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදි. දැනට පවතින සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතු කරගෙන යන තවත් සමාගම් දෙකකට දිගුකාලීන රක්ෂණ

# නියාමන සමාලෝචනය

තැරැව්කාර ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා ලියාපදිංචිය ලබා දෙන ලදි.

2024 වර්ෂය සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 78 කින් ඉල්ලුම් පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන අතර එම සමාගම් අතුරින් පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් සියල්ල සම්පූර්ණ කර තිබූ සමාගම් 76 කට ලියාපදිංචිය අළුත් කිරීම් ප්‍රදානය කර ඇත. පනතේ 83 වගන්තියේ දී ඇති ව්‍යවස්ථාපිත කාල රාමුව පිළිනොපැදීම මත සමාගම් දෙකක ලියාපදිංචිය අළුත් නොකරන ලදි.

**පරිශිෂ්ඨය II:** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින සියළු රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඒ සඳහා අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/පන්ති සහ ලියාපදිංචි කාල සීමාව දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

### රක්ෂණ තැරුව්කාර සමාගම්

### විධානයන්

විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණය පිළිබඳව රක්ෂණ තැරැව්කාර සමාගමකට ප්‍රදානය කර තිබූ බලය සම්බන්ධයෙන් කොමිෂන් සභාව ඔවුනට විධානයක් නිකුත් කරන ලදි.

### අවවාද

1. පනතේ 80 (2) (ආ) වගන්තිය කඩ කිරීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී වෙත කොමිෂන් සභාව විසින් අවවාදයක් නිකුත් කරන ලදි.

2. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත අසත්‍ය නොමග යවන සුළු/ සාවද්‍ය තොරතුරු සැපයීම සහ පනතේ 82 වන වගන්තියේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී වෙත අවවාද කරන ලදි.

3. පනතේ 82 (4) වගන්තිය උල්ලංඝනය කල රක්ෂණ සමාගමක ප්‍රධාන නිලධාරී සහ එහි අධ්‍යක්ෂකවරුන්ට අවවාද කරන ලදි.

4. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලයක් රහිතව විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණ ඔප්පු සඳහා අතරමැදියෙකුගේ කාර්යයන් කරගෙන යෑම හේතුවෙන් තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී වෙත කොමිෂන් සභාවෙන් අවවාද නිකුත් කරන ලදි.

5. රක්ෂණ තැරැව්කාර සමාගමක අධ්‍යක්ෂ තනතුර දැරීමෙන් තොරව එහි අධ්‍යක්ෂකවරයකු ලෙස අත්සන් තැබූ එක්තරා සමාගමක අධ්‍යක්ෂකවරයකුට අවවාදයක් නිකුත් කරන ලදි.

6. පනතේ 94 වගන්තිය සමඟ කියවිය යුතු 2021 අංක 5 දරණ විධානය ප්‍රකාරව පැවරී ඇති වගකීම් සහ රාජකාරි කරගෙන යාමට අසමත් වූ එක්තරා රක්ෂණ තැරුව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී වෙත අවවාදයක් නිකුත් කරන ලදි.

7. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද බලයක් රහිතව අතරමැදියෙකුගේ කාර්යයන් කරගෙනයාම මගින් අංක 36 දරණ චක්‍ර ලේඛය උල්ලංඝනය කිරීම නිසා රක්ෂණ තැරුව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී වෙත අවවාදයක් නිකුත් කරන ලදි.

8. විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණය සම්බන්ධ බලය ලබාගැනීමට ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය, ලියාපදිංචිය කල්ඉකුත්වීමෙන් පසු යොමුකිරීම නිසා රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරීවරයාට අවවාදයක් නිකුත් කරන ලදි.

9. විධාන අංක 19 ප්‍රකාරව සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම මත කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කාර සමාගමකට අවවාදයක් නිකුත් කරන ලදි.

10. පනතේ 83 වගන්තියට අනුකූල වෙමින් 2024 වර්ෂය සඳහා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට අසමත් වූ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ප්‍රධාන නිලධාරීවරුන්ට කොමිෂන් සභාව විසින් අවවාදාත්මක ලිපි නිකුත් කරන ලදි.

11. සමාගමේ ලියාපදිංචි සහතිකය නැතිවීම සම්බන්ධව තවත් රක්ෂණ තැරැව්කාර සමාගමකට අවවාදයක් නිකුත් කරන ලදි.

12. පනතේ 82 (4) වගන්තිය උල්ලංඝනය කිරීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක ප්‍රධාන නිලධාරී සහ එහි අධ්‍යක්ෂකවරුන්ට අවවාද නිකුත් කරන ලදි.

### අත්හිටුවීම්

අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා නොගැනීම හේතුවෙන් රක්ෂණ තැරැව්කාර සමාගමක ලියාපදිංචිය වසර තුළ අත්හිටුවීම සිදුකරන ලද අතර ඉන්පසුව අවම ශුද්ධ ප්‍රාග්ධනය අවශ්‍යතාවය සපුරාලීමෙන් පසු අත්හිටුවීම ඉවත් කරන ලදි.

### අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

කොමිෂන් සභාව විසින් වසර තුළ දී අලාභ ගැලපුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා පුද්ගලයන් දෙදෙනෙකු හට ලියාපදිංචිය ලබා දී ඇත. වසර තුළ අලාභ ගැලපුම්කරුවන් ලෙස කටයුතු කිරීම සඳහා පුද්ගලයන් විසි නව දෙනෙකු වෙතින් වාර්ෂික ගෙවීම් ද කොමිෂන් සභාව විසින් භාර ගන්නා ලදි.

පනතේ 114 (1) වගන්තිය ප්‍රකාරව "අලාභ ගැලපුම්කරු" යන්නෙන් රක්ෂණ හිමිකම් පෑමක දී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ පනතේ විධිවිධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

**පරිශිෂ්ඨය III:** කොමිෂන් සභාව සමග ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය සහ ලියාපදිංචිය බලාත්මක වන දිනය දැක්වේ.

## නියාමන/ උපදේශන ක්‍රියාමාර්ග

1. සංශෝධන පනත මගින් හඳුන්වා දෙන ලද නව විධිවිධාන ප්‍රකාරව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදි. පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් ගණනාවක් සඳහා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදි.

2. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ලාභාංශ ප්‍රකාශ කරන ලෙස එක් රක්ෂණ සමාගමක් විසින් 2023 වර්ෂයේදී ඉල්ලීමක් කර ඇත. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම මෙන්ම එහි

රක්ෂණ ඔප්පු හිමියන් ආරක්ෂා කිරීමට අවශ්‍ය සියළු පූර්වාරක්ෂාවන් සහ පියවර ගැනීමට යටත්ව එම ඉල්ලීමට කොමිෂන් සභාව එකඟ විය.

3. චක්‍රලේඛ අංක 36 ප්‍රකාරව විදේශීය සෞඛ්‍ය රක්ෂණයන් අළුත් කිරීම සඳහා වන රක්ෂණ තැරැව්කරුවන් ගණනාවකගේ ඉල්ලීම් සමාලෝචනය කරන ලදුව කොමිෂන් සභාව විසින් බලය හිමිවන කාල සීමාව තවත් වසරක් සඳහා අළුත් කරන ලදී.

4. එක් රක්ෂණ සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම සහ අදාළ ලියකියවිලි සලකා බැලූ කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව සමාගමක් විසින් ආයෝජනය සඳහා  රුපියල් මිලියන 350ක යෝජිත හිමිකම් කොටස් නිකුතුව සහ මව් සමාගමේ එම රක්ෂණකරුගේ කොටස් හිමිකාරිත්වය අඩු කිරීම අනුමත කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත සඳහන් අනුමැතිය ලබා ගැනීමෙන් පසු මාස තුනක් ඇතුළත රක්ෂණකරු විසින් සාමාන්‍ය සහ ජීවිත රක්ෂණ ව්‍යාපාර සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR) සහ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම කොමිෂන් සභාව විසින් ඉල්ලා ඇති අතර මෙම අවශ්‍යතා  සපුරාලීමට අපොහොසත් වුවහොත් පනතේ 18 (1) (ඊ) සහ (උ) වගන්තිය ප්‍රකාරව එකී රක්ෂණකරු අත්හිටුවීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබේ.

5. පනතේ 102 වගන්තිය යටතේ අවශ්‍ය පරිදි රක්ෂණ ව්‍යාපාර පැවරීම පිළිබඳ කොමිෂන් සභාවේ නිරීක්ෂණ එක් සංයුක්ත රක්ෂණ සමාගමක් වෙත නිකුත් කර ඇත. පනතේ 102 වගන්තියට ප්‍රකාරව රක්ෂණ ව්‍යාපාරයක් පැවරීම සහ ඒකාබද්ධ කිරීම සම්බන්ධ සියළුම ගනුදෙනු දිස්ත්‍රික් අධිකරණයක් විසින් අනුමත කළ යුතු අතර එවැනි අනුමැතියක් සඳහා ඉල්ලුම් කරන විට, එම පැවරීම සහ ඒකාබද්ධ කිරීම පිළිබඳ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි නිරීක්ෂණවල පිටපතක් ද අධිකරණයට ඉදිරිපත් කළ යුතුය.

# විමර්ශන සමාලෝචනය



හිමිකම් පෑමකට අදාළව පැන නගින යම් ආරවුලක් විමර්ශනය කර ඒ පිළිබඳව නියෝගයක් නිකුත් කිරීම සඳහා 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිතව පැවරී ඇති බලය, විමර්ශන අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ආරවුල් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර ආරවුලකට අදාළ සියළු පාර්ශවයන්ට සිය කරුණු ඉදිරිපත් කිරීමට ඇති අයිතිය ලබා දීම විමර්ශන අංශය මගින් සහතික කරනු ලැබේ.

රක්ෂණ හිමියන්ගේ අභිලාශයන් ආරක්ෂා කිරීමේ ව්‍යවස්ථාපිත අරමුණ මනසේ තබා ගනිමින් හිමිකම් පෑමකට අදාළ ආරවුල් මෙම අංශය විසින් විමර්ශනය කරනු ලැබේ. හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණකරු පදනම් කරගත් සාක්ෂි ප්‍රමාණවත් හෝ තීරණාත්මක නොවේ නම්, එය ප්‍රතික්ෂේප කිරීමට ගත් තීරණය සංශෝධනය කිරීමට හෝ නැවත සලකා බැලීමට රක්ෂණකරුවෙකුගෙන් ඉල්ලා සිටීමට විමර්ශන අංශය පසුබට නොවනු ඇත.

## විමර්ශන අංශයේ ඉදිරි උපායමාර්ගික සැලසුම

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2023-2027 සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි උපායමාර්ගික සැලැස්මෙහි විමර්ශන අංශයේ උපායමාර්ගික අවධානය කුමක්ද යන්න අන්තර්ගත වේ. සමස්ත උපායමාර්ගික සැලැස්ම යටතේ මෙම අංශයේ ප්‍රධාන අපේක්ෂිත ප්‍රතිඵලය පාරිභෝගික ආරක්ෂාව වේ. එහි උපායමාර්ගික අරමුණ වන්නේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ අභිලාශයන් ආරක්ෂා කිරීමයි.

එකී අරමුණ යටතේ විමර්ශන අංශයට අදාළ ප්‍රධාන කාර්යයන් වන්නේ;

- රක්ෂණ හිමිකම්පෑම් කළමනාකරණය සහ රක්ෂණකරුවන් සහ ඔප්පුහිමියන් අතර ඇතිවන ආරවුල් විසඳීමේ දී රක්ෂණකරුවන් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටින් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම;
- පාරිභෝගික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා රක්ෂණකරුවන් විසින් අනුගමනය කළ යුතු අවම නිර්ණායක සකස් කිරීම සඳහා රක්ෂණකරුවන් වෙත ලැබෙන හිමිකම් පෑම් කළමනාකරණ ක්‍රියාවලියන්හි ගැටළු හඳුනා ගැනීම; සහ
- රක්ෂණ මූලධර්ම (ICPs) සහ පිළිගත් ජාත්‍යන්තර භාවිතයන් හා සැසඳීමේදී දැනට පවතින ආරවුල් විසඳීමේ ක්‍රමයේ දුර්වලතා හඳුනාගෙන ඒ සඳහා විසඳුම් නිර්දේශ කිරීම.

විමර්ශන අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී පිළිගත් ජාත්‍යන්තර භාවිතයන් අවබෝධ කර ගැනීම සඳහා විවිධ රටවල රක්ෂණ හිමිකම් පෑම් සහ ඒ සම්බන්ධ ආරවුල් පිළිබඳව කටයුතු කිරීමේ ක්‍රියා පටිපාටීන් පිළිබඳව අධ්‍යනයක් සිදු කරන ලදී. ඉන්පසුව, එම අංශය විසින් රක්ෂණ හිමිකම් පෑම් සහ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳව ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී රක්ෂණ සමාගම් කිහිපයක් වෙතින් ද තොරතුරු රැස් කරන ලදී. එලෙස සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කිරීමෙන් පසු විමර්ශන අංශය එම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් ප්‍රායෝගිකව රක්ෂණ සමාගම් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වැඩි අවබෝධයක් ලබා ගැනීම සඳහා සාමාන්‍ය රක්ෂණ සමාගම් දෙකක් සහ ජීවිත රක්ෂණ සමාගම් දෙකක් වෙත ගොස් නිරීක්ෂණය කරන ලදී.

## පැමිණිලි සම්පිණ්ඩනය

සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව වෙත පැමිණිලි 409ක් ලැබී ඇති අතර, ඉන් 308ක් (මීට පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ පැමිණිලිද ඇතුලත්ව) විමර්ෂණය කර අවසන් කර ඇත. ඉන් පැමිණිලි 88ක් රක්ෂණ ඔප්පුහිමියන්ට වාසිසහගත වන ආකාරයෙන් විසඳීමට හැකි වී ඇති අතර, එම රක්ෂණ හිමිකම්වල වටිනාකම රු.මිලියන 65ක් පමණ වේ.

### ප්‍රස්තාරය 1 : **පසුගිය වසර පහ තුළ කොමිසම ලද මුළු පැමිණිලි සංඛ්‍යාව (2019-2023)**




පසුගිය වසර පහ (5) තුළ විමර්ශන අංශය ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 2015 කි. සමාලෝචිත කාල සීමාව තුළ කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව පෙර වසරට (2022) සාපේක්ෂව සුළු වශයෙන් අඩු වී ඇත.

### ප්‍රස්තාරය 2 : **2023 වසර තුළ ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණය**




ප්‍රස්තාරය 2 මගින් විමර්ශන අංශය වෙත ලැබුණු පැමිණිලිවල මාසික විශ්ලේෂණයක් පෙන්නුම් කෙරේ. වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ මාර්තු සහ නොවැම්බර් යන මාසවල වන අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත්තේ ජනවාරි, අප්‍රේල් සහ දෙසැම්බර් මාස වලදී ය.

### ප්‍රස්තාරය 3 : **2023 වසරේ දී රක්ෂණ ව්‍යාපාර පංතිය මත පදනම්ව පැමිණිලි වර්ගීකරණය**




ප්‍රස්තාරය 3 මගින් 2023 වර්ෂය තුළ ලැබුණු සමස්ථ පැමිණිලි සංඛ්‍යාව දක්වා ඇත. සමස්ථ පැමිණිලි වලින් බහුතරය, එනම් 285 ක් (69.7%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද පැමිණිලි 88 (21.5%)ක් දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. ඉතිරි පැමිණිලි 36 (8.8%) ප්‍රධාන වශයෙන් රක්ෂණ නියෝජිතයන් පිළිබඳව ඇති පැමිණිලිය. පසුගිය වර්ෂය හා සැසඳීමේ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 63.7% (2022 වසරේ දී) සිට 69.7% දක්වා වැඩි වීමක් පෙන්නුම් කරන අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 31.7% (2022 වසරේ දී) සිට 21.5% දක්වා සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි. වෙනත් පැමිණිලි සංඛ්‍යාවද 4.6% (2022 වසරේ දී) සිට 8.8% දක්වා වැඩි වී ඇත.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලිවල විශ්ලේෂණයක් 1 වන වගුවේ දක්වා ඇත.

**වගුව 1 – සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි - අදාල ගැටළුව අනුව වර්ගීකරණය**

| ගැටළුව | පැමිණිලි ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| **රක්ෂණ වන්දි ආරවුල්** | 235 | 82.46 |
| වගකීම පිළිනොගැනීම | 145 | 61.70 |
| ගෙවන ලද/යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 45 | 19.15 |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 34 | 14.47 |
| වෙනත් | 11 | 4.68 |
| **වෙනත් පැමිණිලි** | 50 | 17.54 |
| **එකතුව** | **285** | **100.00** |

1 වන වගුවෙහි දැක්වෙන පරිදි සමස්ථ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පැමිණිලි අතුරින් (285), 235 ක් (82.46%) රක්ෂණ වන්දි ආරවුල් වන අතර ඉතිරි පැමිණිලි 50 (17.54%) අර්ධකාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්නවලට ප්‍රතිචාර නොදැක්වීම්, රක්ෂණ වාරික නැවත ලබා ගැනීම පිළිබඳ ඉල්ලීම් හා රක්ෂණ ඔප්පු නොලැබීම ආදී වෙනත් පැමිණිලි වේ.

මෝටර් රථ වාහන රක්ෂණ වන්දි හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ පැමිණිලිවල (61.7%) මූලසාධකය විශ්ලේෂණය කිරීමේ දී ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු රක්ෂිතයා විසින් හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම් පාන්නාට වාහනය කෙරෙහිද රක්ෂණීය බැඳියාවක් නොමැති වීම) අනතුර පිළිබඳ ලබා දුන් විස්තරය අනතුරෙන් සිදු වූ අලාභහානිවලට නොගැළපීම හෝ අනතුර සිදුවන දිනය වන විට අදාල රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගු වීම යනාදියයි. රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී, අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිසිය, රෝහල් හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් තුන්වන පාර්ශව වෙතින්ද තොරතුරු කැඳවා (අවශ්‍ය වූ විට) විමර්ශන සිදු කරනු ලැබේ .

රක්ෂණ වන්දි ආරවුල් වලට හේතුවන අනෙක් ප්‍රධාන මූලසාධකය වන්නේ පිරිනමන වන්දිය පිළිබඳ අතෘප්තිමත් බවයි (19.15%) මෙම පැමිණිලිවලට මූලික හේතුන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂණ සමාගම් විසින් ගෙවන ලද අලාභ

# විමර්ශන සමාලෝචනය

ගැලපුම් හෝ වන්දි අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කෙරුණු ඉතිරි පැමිණිලි 34 (14.47%) හිමිකම් මුදල් ගෙවීමේ ප්‍රමාදයට අදාළ විය. රක්ෂණ හිමිකම් ලබාදීමේ ප්‍රමාදයන් අතුරින් බොහෝමයක් උද්ගත වී ඇත්තේ සමාගම විසින් හිමිකම් පෑම් පිළිබඳ වැඩිදුර විමර්ශන පැවැත්වීම බව නිරීක්ෂණය විය. මීට අමතරව, රක්ෂිතයාගේ හෝ අළුත්වැඩියාකරුවන් වැනි අනෙකුත් බාහිර පාර්ශවයන්ගෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත් කිරීමේ දී සිදුවන ප්‍රමාදයන් ද නිරීක්ෂණය විය. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී හිමිකම් පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා දීම මගින් මෙවැනි බොහෝමයක් ආරවුල් විසඳාගත හැකි විය.

## දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි විශ්ලේෂණය

දිගුකාලීන රක්ෂණය ව්‍යාපාරයට අදාළව ලැබුණු පැමිණිලිවල විශ්ලේෂණය 2 වගුවෙන් දක්වා ඇත.

**වගුව 2 - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : අදාල ගැටළුව අනුව වර්ගීකරණය**

| ගැටළුව | පැමිණිලි ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| රක්ෂණ වන්දි ආරවුල් | 38 | 43.18 |
| වගකීම පිළිනොගැනීම | 23 | 60.53 |
| හිමිකම් ගෙවීම ප්‍රමාද වීම | 06 | 15.79 |
| යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 08 | 21.05 |
| වෙනත් | 01 | 2.06 |
| වෙනත් පැමිණිලි | 50 | 56.82 |
| ගෙවන ලද වාරික මුදල ආපසු ලබාගැනීම/ පුනස්ථාපනය අවලංගු කිරීම සඳහා වන ඉල්ලීම | 12 | 24.00 |
| තොරතුරු ලබා දීම | 01 | 2.00 |
| වාරික ගෙවීම/ සාවද්‍ය පරිහරණය | 04 | 8.00 |
| කල් පිරීමේ දී ගෙවීම/ පවාරණ අගය | 12 | 24.00 |
| වෙනත් | 21 | 42.00 |
| **එකතුව** | **88** | **100.00** |

2 වන වගුවට අනුව සමස්ථ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි (88) අතරින් (43.18%) ක් වන්දි ආරවුල් සම්බන්ධයෙන් වන අතර (56.82%)ක් වෙනත් පැමිණිලි වේ.

බහුතරයක් රක්ෂණ වන්දි ආරවුල් සඳහා (60.53%) මූලික හේතුව වන්නේ රක්ෂණ සමාගම් විසින් වගකීම පිළිනොගැනීමයි. එවැනි ආරවුල් ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවේ ඇති වගන්ති පිළිබඳ අවබෝධය මඳ බව සහ රක්ෂණ සමාගම් විසින් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සිදු නොකිරීමයි. ලිඛිතව සහ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡාවලදී රක්ෂණ ඔප්පුහිමියන්ට ලබාදෙන පැහැදිලි කිරීම් තුළින් මෙවැනි බොහොමයක් ආරවුල් විසඳන ලදී. හිමිකම් පෑම් පිළිබඳ ආරවුල්වලින් තවත් 21.05% කට හේතු වන්නේ රක්ෂණ සමාගම් විසින් ලබාදෙන වන්දි හිමිකම් පිළිබඳව ඔප්පුහිමියන්ට ඇති අතෘප්තියයි.

රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" (uberrimae fidei) නම් වූ මූලික නෛතික මූලධර්මය රක්ෂණ ගිවිසුමේ දෙපාර්ශවයටම, එනම් රක්ෂකයාට මෙන්ම රක්ෂිතයාටද එකසේ අදාල වේ. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේ ද යන වග සහ එසේ පිළිගන්නේ කුමන කොන්දේසි හා නියමයන් යටතේද යන වග රක්ෂකයා විසින් තීරණය කරනු ලබයි. එවන් අවස්ථාවක රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදු කළහොත් උපරිම සද්භාවය යන මූලධර්මය උල්ලංඝණය වේ.

ඇතැම් අවස්ථාවල දී යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාළ රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවීම බවට නිරීක්ෂණය විය. වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීම, හිතාමතා හෝ නොසැලකිල්ලෙන් සිදුකර නොමැති අවස්ථාවන් කිහිපයක දී පමණක් අදාළ රක්ෂණ හිමිකම් පාන්නන්ට සහාය වීමට අදාල සමාලෝචිත කාලසීමාව තුළ කොමිෂන් සභාවට හැකියාව ලැබිණ.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාල වකවානුව තුළ නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පු හිමියාගේ ගිවිසුම්ගත වගකීමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී ඇත. නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාම රක්ෂණ ඔප්පු හිමියාගේ වගකීමක් වන අතර ආරවුලක දී ඉදිරිපත් කිරීම සඳහා ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂිද ඔවුන් සන්තකයේ තබාගත යුතුය. ඒ අනුව, නියමිත කාල සීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේ දී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථාවලදී පමණක් අදාල රක්ෂණ ඔප්පුහිමියන්ට සහායවීමට කොමිෂන් සභාවට හැකි විය.

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අනෙකුත් පැමිණිලිවලින් බහුතරයක් (24%) ආපසු ගෙවා ඇති වාරික මුදල් ගෙවන ලෙස ඉල්ලීම්, රක්ෂණ ඔප්පු නැවත බලාත්මක කිරීම සඳහා හෝ අවලංගු කිරීම සඳහා වූ ඉල්ලීම් වේ. අවලංගු කිරීමේ කාල සීමාව (එනම් රක්ෂණ ඔප්පුව ලද දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පු හිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබී. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල හිමිකම් පාන්නන්ගේ දුර්වල මූල්‍ය තත්වය සැලකිල්ලට ගෙන රක්ෂණකරුවන් සහන සැලසීමට ඉදිරිපත් වේ. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටදී පමණක් නියමිත කාලය ඉකුත් වීමෙන් පසුව පුනස්ථාපනය සඳහා සිදුකරන ඉල්ලීම්වලට රක්ෂණ ඔප්පු හිමියන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය. ගෙවූ රක්ෂණ වාරික මුදල් ආපසු ගෙවන ලෙස වන ඉල්ලීම්වලට මූලික හේතුව වන්නේ රක්ෂණ ඔප්පු හිමියන් තුළ ජීවිත රක්ෂණයේ වැදගත්කම පිළිබඳ අවබෝධය මඳ බව සහ අඛණ්ඩව වාරික ගෙවා රක්ෂණ ඔප්පු පවත්වාගෙන යන අතරතුරදී මුහුණ පාන්නට වන ආර්ථික දුෂ්කරතා බව නිරීක්ෂණය විය.

## වෙනත් පැමිණිලි

කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි අතරින් 36ක් වෙනත් පැමිණිලි වන අතර ඉන් අසාධාරණ අයුරින් රක්ෂණ නියෝජිතභාවය අවසන් කිරීම සහ නියෝජිතයන්ගේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධ පැමිණිලි ප්‍රධාන වේ. පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එම පැමිණිලි සම්බන්ධව විමර්ශන අංශය කටයුතු කරන ලදී.

# වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය



දැනුවත්භාවය ඇති කිරීම, රක්ෂණ ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය සහ රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීම සඳහා ඉතා වැදගත් සාධකයක් ලෙස සලකනු ලැබේ. රක්ෂණ කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරීන්, වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ට සිය බැඳියාවන් ආරක්ෂා කර ගැනීම සහ රක්ෂණ ගිවිසුම්වලට එළඹීමේ දී දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීම සඳහා ඔවුන් දැනුවත් කළ යුතුය.

රක්ෂණ සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා වන අපගේ ප්‍රවේශය පදනම් වී ඇත්තේ රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම මගින් ජනතාවට රක්ෂණය පිළිබඳ දැනුම ලැබෙනු ඇති බව, වැඩි වගකීමක් ගැනීමෙන් ඔවුන්ට තම සමස්ථ අවදානම් කළමනාකරණය කර ගැනීමට උපකාරී වන බව සහ රක්ෂණාවරණයක් හෝ හිමිකම් පෑමක් පිළිබඳ ආරවුලක් ඇති වූ විට එය යොමු කිරීමට රක්ෂණ නියාමකයෙකු සිටීම වැනි අදහස් මතයි. රක්ෂණාවරණයට අදාළ හිමිකම් සහ වගකීම් , රක්ෂණ කර්මාන්තය සහ එහි නවතම අභිවර්ධනයන්, සුදුසු රක්ෂණ නිෂ්පාදන තෝරා ගැනීම, රක්ෂණ ඔප්පුහිමියන් සඳහා පවතින දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණ ආදිය සම්බන්ධයෙන් රක්ෂණ ඔප්පුහිමියන් දැනුවත් කිරීම මගින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වත්මන් සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීමට අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ට අවදානම් ආවරණය සඳහා වන සිය අවශ්‍යතා පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් ලබා දීම සහ එම අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලන රක්ෂණාවරණ තෝරා ගැනීමට සහාය වීම සඳහා වන උත්සාහයක් ලෙස රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අඛණ්ඩව පවත්වා ඇත. 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජන සන්නිවේදන සහ ඩිජිටල් සන්නිවේදන මාධ්‍ය හරහා සමබර ප්‍රවේශයකින් සිය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

## ජන සන්නිවේදන මාධ්‍ය හරහා දැනුවත් කිරීම

### මුද්‍රිත මාධ්‍ය

වැදගත් අයතනික ප්‍රවෘත්ති සහ නව ප්‍රවණතා පිළිබඳව මහජනතාව වෙත අප්‍රමාදව දැනුම් දීමට පුවත්පත් දැන්වීම් සහ මාධ්‍ය නිවේදන භාවිතා කරයි. සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් පුවත්පත් දැන්වීම් සහ මාධ්‍ය නිවේදන කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලදී.

ප්‍රකාශයට පත් කරන ලද පුවත්පත් මාධ්‍ය නිවේදන පහතින් දැක්වේ.

අ) "රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය - 2022, 03 වන කාර්තුව සහ 2017 සිට 2021 දක්වා කාර්යසාධනය" - 2023 ජනවාරි මාසය තුළදී.

ආ) "නියාමන වාර්තාකරන අවශ්‍යතා පිළිබඳ රක්ෂණ තැරැව්කාර සමාගම් දැනුවත් කිරීමේ සැසියක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලබයි" - 2023 පෙබරවාරි මාසය තුළදී.

ඇ) "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති ලෙස ජනාධිපති නීතිඥ රසික් සරූක් මහතා වැඩ භාර ගනියි" - 2023 මාර්තු මාසය තුළදී.

ඈ) "රක්ෂණ නිෂ්පාදනවලට අදාළ අවසර පත්/ කූපන් පත් / වට්ටම් කාඩ්පත් මිල දී ගැනීමෙන් වැළකීම පිළිබඳ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ දැනුම්දීම" - 2023 මාර්තු මාසය තුළදී.

ඉ) "රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය - 2022, 04 කාර්තුව" - 2023 අප්‍රේල් මාසය තුළදී.

ඊ) "ගාස්තුවක් අයකර ජනතාවට වට්ටම් කාඩ්පත් විකිණීම සහ ඇතැම් රක්ෂණ නිෂ්පාදන සඳහා වට්ටම් පිරිනැමීම" - 2023 ජුනි මාසය තුළදී.

උ) "රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය - 2023, 01 කාර්තුව" - 2023 ජූලි මාසය තුළදී.

ඌ) "රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය - 2022, වර්ෂය"- 2023 සැප්තැම්බර් මාසය තුළදී.

# වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

එ) "කාන්තාවන් සඳහා ජාත්‍යන්තර මූල්‍ය සමායතනයේ (IFC) රක්ෂණ වැඩසටහන" - 2023 ඔක්තෝම්බර් මාසය තුළදී.

පහත පුවත්පත් දැන්වීම පළ කෙරිණි:

ආ) "ගාස්තුවක් අයකර ජනතාවට වට්ටම් කාඩ්පත් විකිණීම සහ රක්ෂණ නිෂ්පාදන සඳහා වට්ටම් පිරිනැමීම" - 2023, ජුනි මාසය තුළදී

එවැනි කූපන් පත්/වට්ටම් කාඩ්පත් මිල දී ගැනීමෙන් වළකින ලෙස ජනතාව දැනුවත්කිරීම සඳහා එම දැන්වීම සියලු ගුවන්විදුලි සහ රූපවාහිනී නාලිකා මඟින් ප්‍රචාරණය කරන ලදී.

### රූපවාහිනී වැඩසටහන්

රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් පහත වැඩසටහන් සඳහා සහභාගි විය.

- ස්වාධීන රූපවාහිනිය හරහා විකාශය වූ "හත්වෙනි පැය" සාකච්ඡාව.

තවද, 2024 ජනවාරි මස සිට රූපවාහිනිය, ගුවන්විදුලිය සහ පුවත්පත් හරහා දැනුවත් කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීමට පසුබිම් කටයුතු සම්පූර්ණ කරන ලදී.

### ඩිජිටල් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

#### ඊ - අත්පොත්

රක්ෂණ ඔප්පුහිමියන්ගේ දැනුම වර්ධනය සඳහා ජීවිත රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, දේපළ රක්ෂණය, සංචාරක රක්ෂණය, රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීම පිළිබඳ උපදෙස් සහ ඔප්පුහිමියාගේ අයිතිවාසිකම් සහ යුතුකම් වැනි මාතෘකා මත පදනම් වූ විස්තරාත්මක ඊ - අත්පොත් සකස් කරන ලදී. සිංහල භාෂාවෙන් රචිත ඊ - අත්පොත් හත (07) ක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ 2023 ජුනි මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

#### ඊ - පුවත් ලිපිය

ඊ-පුවත් ලිපියෙහි වාර්ෂික ප්‍රකාශනය වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ දැනුම වැඩිදියුණු කිරීම සඳහා වන වැදගත් මාර්ගයක් ලෙස ක්‍රියාත්මක වේ. රක්ෂණය පිළිබඳ උපදෙස්, ඔබට ජීවිත රක්ෂණයක් අවශ්‍ය වන්නේ මන්ද, රක්ෂණ ක්ෂේත්‍රයේ සංඛ්‍යාලේඛන, රක්ෂණ කර්මාන්තය ආශ්‍රිත මාතෘකා සහ රක්ෂණ ඔප්පුහිමියන්, අනාගත රක්ෂණ ඔප්පුහිමියන් සහ රක්ෂණ ව්‍යාපාරයේ නියුක්තව සිටින්නන් කෙරෙහි අවධානය යොමු කෙරෙන නව විධානයන් සහ චක්‍රලේඛ වැනි මාතෘකා රැසක් මෙම පුවත් ලිපියේ අඩංගුවේ. ඊ-පුවත් ලිපිය 500,000 කට අධික පිරිසක් අතර ඊ මේල් මඟින් බෙදා හරින ලද අතර 2023 ඔක්තෝම්බර් මාසය තුළ එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ සහ සමාජ මාධ්‍ය පිටුවල ප්‍රකාශයට පත් කරන ලදී.

#### SMS මඟින් දැනුවත් කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාව "IRCSL" යන නාමය යටතේ රක්ෂණය සම්බන්ධ මාතෘකා සහ රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් ආවරණය කරමින් කෙටි පණිවුඩ (SMS) වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළ තෝරාගත් ජංගම දුරකථන ජාලය හරහා 6000 කට වැඩි පාරිභෝගික පිරිසක් වෙත මෙවැනි කෙටි පණිවුඩ විසි දෙකක් (22) බෙදා හරින ලදී.

#### Facebook පිටුව සහ LinkedIn පිටුව

සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් රක්ෂණයේ විවිධ අංග, රක්ෂණ ඔප්පුහිමියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්, සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සංඛ්‍යාලේඛන පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි Facebook සහ LinkedIn සමාජ මාධ්‍ය පිටු හරහා දැනුවත් කිරීම් සිදු කරන ලද අතර ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සාර්ථක ලෙස මාර්ගගත ක්‍රියාකාරීත්වය ශක්තිමත් කර ප්‍රවේශය පුළුල් කිරීමට සමත්ව ඇත.

#### YouTube

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ හිමිකම් සහ වගකීම් සහ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධ අනෙකුත් කරුණු මත පදනම් වූ දැනුවත් කිරීම් සිදු කරන ලදී.

#### ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවිය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි වෙබ් අඩවියේ සැකැස්ම සිංහල සහ දෙමළ භාෂා ඇතුළත් වන පරිදි වැඩිදියුණු කරන ලදී.

### වෙළඳ දැන්වීම් සහ රක්ෂණ ඔප්පු නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම තුළින් ඔප්පුහිමියාගේ ආරක්ෂාව සහතික කිරීම

1. **නව රක්ෂණ ඔප්පු සමාලෝචනය කිරීම මගින් රක්ෂණ ඔප්පුහිමියාගේ ආරක්ෂාව සහතික කිරීම**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද නව ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ ඔප්පු සමාලෝචනය කළ අතර, එහි සඳහන් ප්‍රතිලාභ නියමයන් සහ කොන්දේසි රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳියාවන් සුරක්ෂිතවන පරිදි සමාලෝචනය කරන ලදී.

2. **වෙළඳ ප්‍රචාරණ මාර්ගෝපදේශ අනුව රක්ෂණ සමාගම්වල අලෙවිකරණ / ප්‍රචාරණ දැන්වීම් සමාලෝචනය**

සාමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ නිෂ්පාදන සම්බන්ධයෙන් සාධාරණ, අවංක සහ විනිවිදභාවයෙන් යුතු අලෙවිකරණ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල අලෙවිකරණ/ප්‍රචාරණ දැන්වීම් ඇගයීමට ලක් කරන ලදී.

2023 දෙසැම්බර් 31 වැනි දිනට අලෙවිකරණ /ප්‍රචාරණ දැන්වීම් එක්දහස් හතක් (1007) සමාලෝචනය කරන ලදී.

### වෙළඳපොළ පර්යේෂණ

#### (අ) මහජනතාවගේ පවතින විශ්වාසයේ මට්ටම් පිළිබඳ පර්යේෂණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, රක්ෂණය පිළිබඳ මහජන මතය සහ විශ්වාසය තහවුරු කර ගැනීමටත්, මහජන විශ්වාසය ඉහළ නැංවීමේ අරමුණින් අවධානය යොමු කළ යුතු ගැටළු හඳුනා ගැනීමටත් රක්ෂණය පිළිබඳ පවතින විශ්වාසයේ මට්ටම පිළිබඳ සමීක්ෂණය සම්පූර්ණ කර ඇත. සමීක්ෂණය සිදුකළ කොළඹ විශ්ව විද්‍යාලය විසින් එම සමීක්ෂණයේ අවසාන වාර්තාව, පර්යේෂණ සොයාගැනීම් සහ නිර්දේශ සමග කොමිෂන් සභාව සහ රක්ෂණ සමාගම්වල සියලුම ප්‍රධාන විධායක නිලධාරීන් වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව 2024 දී සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදහස් කරන අතර එහි අරමුණ වන්නේ රක්ෂණය පිළිබඳ මහජන විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා හඳුනාගත් ගැටළු විසඳීමයි.

### (ආ) වෙළඳපොළ පර්යේෂණ

රක්ෂණ කර්මාන්තය තවදුරටත් දියුණු කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් ප්‍රතිලාභ, රක්ෂණ ඔප්පු කොන්දේසි, බැහැර කිරීම්, රක්ෂණකරුවන් විසින් පිරිනමනු ලබන සේවාවන්හි ගුණාත්මක බව, බෙදාහැරීමේ මාර්ග, පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය සහ රක්ෂණ හිමිකම් පියවීම් පිළිබඳ වත්මන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආකල්ප, හැඟීම් සහ අවබෝධය හඳුනාගැනීම සඳහා වෙළඳපොළ පර්යේෂණයක් පැවැත්වීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මූලික කටයුතු සම්පාදනය කර ඇත.

### මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ උපදේශන වැඩමුළුව (NFIS)

මෙරටට අවශ්‍ය මූල්‍ය සාක්ෂරතා මාර්ග සිතියම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවන ලද ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ (NFIS) පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ උපදේශන වැඩමුළුවකට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සහභාගී වී රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදී. මූල්‍ය සාක්ෂරතා මාර්ග සිතියම සංවර්ධනය කිරීමේ පරමාර්ථය වනුයේ ගෘහ ඒකක සහ ව්‍යාපාර සඳහා මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශය, ඒවායේ කාර්යක්ෂමතාවය සහ දැරිය හැකි බව ඉහළ නැංවීමයි.

### කාන්තාවන් සඳහා ජාත්‍යන්තර මූල්‍ය සමායතනයේ (IFC) රක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර මූල්‍ය සමායතනය (IFC) සමඟ එක්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදීතාව පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. මෙම උපායමාර්ගික හවුල්කාරීත්වය රක්ෂණ වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයේ කාන්තා සහභාගිත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විවිධත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ විධායක කාර්ය මණ්ඩලය සඳහා පළමු වැඩමුළුව 2023 සැප්තැම්බර් 12 දින පවත්වන ලදී. දැනුවත් කිරීමේ සැසියේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී උපායමාර්ග, ගෝලීය හොඳම භාවිතයන්, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වශයෙන් විශ්ලේෂණය කළ රක්ෂණ දත්ත රැස්කිරීම සහ භාවිතයේ වැදගත්කම කාන්තා කේන්ද්‍රීය රක්ෂණාවරණ සංවර්ධනය යනාදිය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

### මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP)

සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල දක්වා ඇති තොරතුරු වල විනිවිදභාවය සහ පූර්ණත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සාමාන්‍ය රක්ෂණ ඔප්පුවලට අදාළ ප්‍රතිපත්ති රාමුව සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. 2023 අප්‍රේල් මස සාමාන්‍ය රක්ෂණ ඔප්පු සඳහා වන ප්‍රතිපත්ති රාමුව පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කර ඇති අතර එය 2023 ජුලි මාසයේ සිට බලාත්මක විය.

## වෙළෙඳපොළ සංවර්ධනය හා බාහිර සබඳතා අංශයට අදාළ උපායමාර්ගික සැලසුම් ක්‍රියාකාරකම් 2023

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය මගින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ බැඳීයාවන් ආරක්ෂා කිරීම සඳහා වන රෙගුලාසි සම්පාදනය කිරීමට අදාළව මූලාරම්භයන් කිහිපයක් සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

1. වෙළෙඳපොළ හැසිරීම් නියාමන රාමුවක් සකස් කිරීමේ අරමුණින් වෙළෙඳපොළ හැසිරීම් නියාමනය පිළිබඳ මාර්ගෝපදේශ කෙටුම්පතක් සකස් කරන ලදී.

2. රක්ෂණ සමාගම්වල හිමිකම්පෑම් කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා මාර්ගෝපදේශ කෙටුම්පතක් සකස් කරන ලදී.

3. 2022 වසරේ ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල හිමිකම්පෑමේ දත්ත රැස් කර විශ්ලේෂණය කරන ලද අතර එම සංඛ්‍යාලේඛන 2023 ඔක්තෝම්බර් මස ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරිණි.

### වෙනත් කටයුතු

#### ජනතාවගේ විමසුම් සඳහා වන ප්‍රතිචාර

සමාලෝචිත වර්ෂය තුළ, රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තොරතුරු සහ මඟපෙන්වීම් ඉල්ලා ජනතාව, රක්ෂණ ඔප්පුහිමියන් සහ වෙනත් විවිධ පාර්ශවකරුවන් වෙතින් ලැබුණු විමසීම් රාශියකට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිළිතුරු ලබා දී ඇත.

### වසර තුළ සිදු කෙරුණු කාර්යයන් සංක්ෂිප්තව

සිදු කරන ලද ක්‍රියාකාරකම්, පුවත්පත් නිවේදන සහ වෙනත් ප්‍රකාශන

මාධ්‍ය නිවේදන




ඊ පුවත්පත් ලිපිය




ඊ - අත්පොත්





# වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා සමාලෝචනය

යූ ටියුබ්




රූපවාහිනී වැඩසටහන්



ජාත්‍යන්තර මූල්‍ය සමායතනයේ පුහුණු වැඩසටහන





# මූල්‍ය හා පරිපාලනමය සමාලෝචනය

**මූල්‍ය හා පරිපාලන අංශය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, පරිපාලනය සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් වගකීම දරයි. අංශය එක් එක් ක්ෂේත්‍රය යටතේ පහත සඳහන් කාර්යයන් ඉටු කරයි.**




## මූල්‍ය

වාර්ෂික අයවැය සහ සැලසුම් සම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය සහ සමාලෝචනය කිරීම, වාර්ෂික/මාසික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ලියාපදිංචි ගාස්තු, සෙස්, වාර්ෂික ගාස්තු සහ ලියාපදිංචිය අළුත් කිරීමේ ගාස්තු එකතු කිරීම, දූරදර්ශී ලෙස අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම, කාර්ය මණ්ඩල වැටුප් ලේඛනය හැසිරවීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත අදාළ බදු ගෙවීම ආදිය.

සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය සමාලෝචනය පහත පරිදි වේ:

### ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතේ 7 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන සෙස් බද්දෙන් මුදල් බැර කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල පිහිටුවා ඇත. දැනට අයකරනු ලබන සෙස් බද්ද සාමාන්‍ය රක්ෂණයේ ශුද්ධ ලිඛිත වාරික ආදායමෙන් 0.4%ක් සහ දිගුකාලීන රක්ෂණයේ ශුද්ධ ලිඛිත වාරික ආදායමෙන් 0.2%ක් වේ. රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුලට බැර කෙරෙන මුදල් රක්ෂණ ඔප්පු හිමියන්ගේ සාමාන්‍ය ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් සම්පාදිත නීති ප්‍රකාරව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන වෙනත් විශේෂිත අරමුණක් සඳහා භාවිතා කිරීමට අවසර ඇත.

පනතේ 103 (3) වගන්තිය ප්‍රකාරව, අපේක්ෂා කරන අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන ඕනෑම මුදලක්, ඉහළ ප්‍රතිලාභ ලබා දීම සඳහා දූරදර්ශීව සහ ආරක්ෂිත ආකාරයෙන් කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ යුතුය. ඒ අනුව, රැස් කළ සෙස් බදු කොමිෂන් සභාව විසින් ආයෝජනය කරන ලදී. සමාලෝචිත වසර තුළ පැවති ඉහළ පොළී අනුපාතය හේතුවෙන් සමස්ථ පොළී ආදායම වැඩි විය. 2019 සිට 2023 දක්වා සෙස් බදු රැස් කිරීම සහ ආයෝජන ආදායම 1 ප්‍රස්තාරය මගින් නිරූපණය වේ.

1 ප්‍රස්තාරය - **2019-2023 කාල පරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 493 | 506 | 544 | 588 | 648 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 574 | 622 | 516 | 1236 | 2199 |

1 වන ප්‍රස්තාරයෙන් පසුගිය වසර පහ තුළ සෙස් ආදායමේ වර්ධනය පෙන්නුම් කරයි. හිතකර වෙළඳපල තත්වයන්ගේ බලපෑම හේතුවෙන් 2019 සිට 2020 දක්වා ආයෝජන ආදායම ඉහළ ගොස් ඇති නමුත් 2021 වසරේ පොළී අනුපාත පහත වැටීම හේතුවෙන් ආයෝජන ආදායම අඩු වී ඇත. කෙසේ වුවද, 2022 සහ 2023 වසරවල ඉහළ පොළී අනුපාත හේතුවෙන් ආයෝජන ආදායම ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර ඇත.

පසුගිය වසර පහ තුළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය වැඩි වී ඇති අතර 2 ප්‍රස්තාරය මගින් එය පෙන්නුම් කරයි. දිගුකාලීන ආයෝජන සඳහා වන ඉහළ පොළී අනුපාත සහ 2020 දක්වා කොමිෂන් සභාව වෙතින් වන ශුද්ධ අතිරික්ත මාරු කිරීම් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ස්ථාවර වර්ධනයට දායක විය.

# මූල්‍ය හා පරිපාලනමය සමාලෝචනය

2 ප්‍රස්තාරය - **2019-2023 කාල පරිච්ඡේදය තුල රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 6253 | 7469 | 8441 | 9381 | 11,532 |

2023 දෙසැම්බර් 31 වන දිනට අරමුදලේ වත්කම් සංයුතිය පහත දැක්වේ:

3 ප්‍රස්තාරය - **2023 දෙසැම්බර් 31 දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**




## කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ ආදායම පහත මූලාශ්‍ර වලින් ලැබේ.

- රක්ෂණකරුවන්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු
- රක්ෂණ සමාගම් වලින් වාර්ෂිකව අය කෙරෙන ගාස්තු
- රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අලුත් කිරීම සඳහා වන වාර්ෂික ගාස්තුව
- අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළී ආදායම

2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 ප්‍රස්තාරය මගින් දැක්වේ.

4 ප්‍රස්තාරය - **2019-2023 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලියන) | 224 | 245 | 258 | 291 | 319 |
| ලියාපදිංචි හා ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු (රු. මිලියන) | 14 | 14 | 15 | 17 | 18 |
| වෙනත් ආදායම් (රු. මිලියන) | 16 | 13 | 13 | 59 | 82 |
| ප්‍රදාන හඳුනාගැනීම (රු. මිලියන) | 84 | 16 | 0 | - | 5 |
| මුළු ආදායම් (රු. මිලියන) | 339 | 288 | 286 | 367 | 423 |

## කොමිෂන් සභාවේ වියදම

2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම 5 වැනි ප්‍රස්තාරය මගින් දැක්වේ.

5 ප්‍රස්තාරය - **2019-2023 කාල පරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ මුළු වියදම**




| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 188 | 178 | 200 | 212 | 229 |

## පරිපාලනය

පරිපාලන කාර්යයට පහත දෑ ඇතුළත් වේ; ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුළ පරිපාලනයේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පරිපාලන ක්‍රියාවලි සහ පද්ධති සැකසීම සහ ස්ථාපිත කරන ලද ක්‍රියාවලි සහ පද්ධති අඛණ්ඩව සමාලෝචනය කිරීම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, සියලුම වත්කම් සහ වාර්තාවල නිසි කළමනාකරණය සඳහා ක්‍රියාවලි සහ පද්ධති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම, සමස්ත ආයතනය සඳහා කාර්ය සම්පාදන සහාය සැපයීම, ලිපිද්‍රව්‍ය සහ අනෙකුත් කාර්යාල සැපයුම් පවතින බවට වග බලා ගැනීම, හිතකර සහ ක්‍රමවත් කාර්යාල පරිසරයක් සහතික කිරීම, වාහන සංචිතය නඩත්තු කිරීම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සහ බැහැර කළ හැකි වත්කම් හඳුනා ගැනීම.

දෛනික කාර්යයන්ට අමතරව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව භාරයේ සහ පාලනයේ ඇති සියලුම වාර්තා/තොරතුරු/ලේඛන නියම කර ඇති යහපත් භාවිතයන්ට සහ අදාළ නීතිවලට අනුකූලව ක්‍රමවත් ආකාරයකින් කළමනාකරණය කිරීම, ගබඩා කිරීම සහ බැහැර කිරීම සහතික කිරීම සඳහා ලේඛන කළමනාකරණ ප්‍රතිපත්තිය වසර තුළ අනුමත කරන ලදී.

## මානව සම්පත් කළමනාකරණය

මානව සම්පත් කාර්යයට පහත දෑ ඇතුළත් වේ; මානව සම්පත් සැලසුම් කිරීම, බඳවා ගැනීම සහ තෝරා ගැනීමට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම, පුද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම, කාර්යසාධන කළමනාකරණය, තනතුරුවල ස්ථිර කිරීම, පුහුණුව සහ සංවර්ධනය, සෞඛ්‍ය සහ ආරක්ෂාව, වෘත්තීය සැලසුම් කිරීම, පැමිණීමේ ලේඛනය සහ නිවාඩු වාර්තා නඩත්තු කිරීම, ඉවත්වීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම ගැනීම්වලට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම.

### කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාර්ථකත්වයට මානව සම්පත අත්‍යවශ්‍ය වේ. මානව සම්පත් කළමනාකරණය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි ඵලදායිතාවයට දායක වීමෙන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. මානව සම්පත වැදගත් වන්නේ දැනුම, කුසලතා සහ තාක්ෂණය යොදා ගනිමින් වැඩි සම්පත් ප්‍රමාණයක් නිර්මාණය කිරීම සඳහා තම බුද්ධියෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විශාලතම වත්කම ඔවුන් වීම හේතුවෙනි.

රටේ පවතින අස්ථාවර ආර්ථික තත්වයන් ඇතුළු විවිධ හේතූන් මත සමාලෝචිත වර්ෂය තුළ එක් සහකාර අධ්‍යක්ෂවරයෙක්, සහකාර කළමනාකරුවන් තිදෙනෙක්, විධායකයින් හය දෙනෙක් සහ එක් ලේකම්වරයෙක් ඉල්ලා අස්විය. 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 12 ක් පුරවා ඇත. 2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මුළු කාර්ය මණ්ඩලය 45 ක් විය.

# මූලය හා පරිපාලනමය සමාලෝචනය

### වයස් කාණ්ඩ විශ්ලේෂණය




### සේවා තොරතුරු




### ස්ත්‍රී පුරුෂ සංයුතිය




ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තිය පිළිබඳව සේවකයින් දැනුවත් කිරීම/ ඔවුන්ට මඟ පෙන්වීම සඳහා සංශෝධිත පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති අත්පොත වර්ෂය තුළ නිකුත් කරන ලදී.

වර්ෂය තුළ සේවක කාර්යසාධන ඇගයීම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර නියමිත නිර්ණායක මත පදනම්ව වාර්ෂික කාර්යසාධන ඇගයීම සිදු කරන ලදී.

මානව සම්පත් දෘෂ්ටිකෝණයෙන් බලන කල, වසර තුළ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. එවැනි ප්‍රතිපත්තියක් හඳුන්වා දීමේ අරමුණ වූයේ රැකියාවට අදාළ හෝ සේවකයා සම්බන්ධ දුක්ගැනවිලි නියමිත කාල සීමාවක් තුළ නිසි ලෙස සහ කඩිනමින් විසඳීම, වින්දිතයන්ට බියෙන් තොරව දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට සේවකයන් තුළ විශ්වාසය ගොඩ නැංවෙන පරිසරයක් ඇති කිරීම සහ සේවකයින් අභිප්‍රේරණය වන, අවධානය යොමු කරන සහ ඵලදායක වන සේවා ස්ථානයක් නිර්මාණය කිරීම ය.

### පුහුණුව

පුහුණුව සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැනුම සහ රැකියා ආශ්‍රිත කුසලතා ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩලය වැඩි දියුණු කිරීමේ පුළුල් ප්‍රතිපත්තිය ආවරණය කරයි. කාර්ය මණ්ඩලයට අදාළ ක්ෂේත්‍රවල දැනුම වර්ධනය කර ගැනීමට දේශීය හා විදේශීය පුහුණු අවස්ථා ලබා දේ. අධ්‍යක්ෂ (මූලය හා පරිපාලන) සහ සහකාර අධ්‍යක්ෂ (නීති) නේපාලයේ පැවති "ආසියානු රක්ෂණ හමුව" පිළිබඳ විදේශ පුහුණුව සඳහා සහභාගී වූ අතර එක් කළමනාකරුවෙක් තායිලන්තයේ පැවති "ආපදා සහ වසංගත අවදානම සඳහා පරිසරය ශක්තිමත් කිරීම පිළිබඳ ERD, ADB කලාපීය සංසදයට" සහභාගී විය. චීනයේ පැවති "චීන-ආසියාන් රක්ෂණ අධීක්ෂණ වැඩමුළුව" පිළිබඳ පුහුණුව සඳහා සහකාර කළමනාකරුවෙක් සහ විධායක නිලධාරියෙක් සහභාගී වූහ. අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (අධීක්ෂණ) සමාලෝචිත වර්ෂය තුළ ඉන්දුනීසියාවේ බාලි හි පැවති "අවදානම තක්සේරු කිරීම සහ අවදානම් අවම කිරීම සඳහා තාක්ෂණය පිළිබඳ OECD-OJK සාකච්ඡාව" සඳහා සහභාගී වූහ.

විදේශීය පුහුණු අවස්ථා හැර බදු සංශෝධන පිළිබඳ පුහුණුව, රක්ෂණ සමාගම් සඳහා නව ආයතනික පාලන නීති පිළිබඳ දැනුවත් කිරීමේ සැසිවාරය, ආසියානු නුබුන්වත් රෙගුලාසි සහ සහයෝගීතාව පිළිබඳ CBIRC වැඩමුළුව, අවදානම් පාදක ප්‍රාග්ධනය සහ නුබුන්වත් රෙජිමයන් සමග ආසියානු රක්ෂණ අධීක්ෂකයන් සමග RBSIF සහ MAS සාකච්ඡා සැසිය, සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර මූල්‍යකරණයට සූදානම් වීම පිළිබඳ ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය:

ශ්‍රී ලංකාව සඳහා වන පාඩම්, IFRS පුහුණු පාඨමාලාව, නිවැරදිව ප්‍රධාන කාර්යසාධන දර්ශක සැකසීමෙන් සේවක කාර්යසාධනය ඉහළ නැංවීම, ආසියාවේ කොවිඩ්-19 මරණවල බලපෑම ඇස්තමේන්තු කිරීම සහ පුරෝකථනය පිළිබඳ තාක්ෂණික වැඩමුළුව, ජීවිත රක්ෂණය හඳුන්වා දීම පිළිබඳ ICCSL වැඩමුළුව.

තවද, සයිබර් ආරක්ෂාව පිළිබඳ සමුළුව 2023, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ 44 වැනි ජාතික සමුළුව සහ දකුණු ආසියානු ආයුගණක සමුළුව වැනි ජාතික සම්මන්ත්‍රණවලට සහභාගී වීමට කාර්ය මණ්ඩලයට පහසුකම් සලසා ඇත. එසේම, කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් වසර තුනකට පසුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් වාර්ෂික නේවාසික පුහුණු වැඩසටහන සංවිධානය කරන ලදී.

### සීමාවාසික පුහුණුව

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රජයේ විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ට ආයතනික පරිසරයේ වැඩ කිරීම සඳහා ඔවුන්ට මග පෙන්වීම සඳහා සීමාවාසික පුහුණුව ලබා දේ. සීමාවාසිකයින් හත් දෙනෙකුට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවෙහි සීමාවාසික පුහුණුව පිරිනමනු ලැබුවේ අදාළ විශේෂිත ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා ය.

### සේවක සුබසාධනය

සේවකයින්ගේ යහපැවැත්ම පිළිබඳ සැලකිලිමත් වීම, අභිප්‍රේරණය ඇති කිරීම සහ ඔවුන්ගේ චිත්ත ධෛර්යය වැඩි කිරීම සඳහා වැදගත් සාධකයක් වී ඇත. එබැවින්, නේවාසික හා බාහිර වෛද්‍ය යෝජනා ක්‍රම, පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය, මරණ සහ බරපතල රෝගාබාධ ආවරණය, වාහන සහ ආපදා ණය යෝජනා ක්‍රම සහ උත්සව අත්තිකාරම් ඇතුළත් ආකර්ෂණීය සුබසාධන පැකේජයක් කොමිෂන් සභාව විසින් සපයනු ලැබේ.

### තොරතුරු තාක්ෂණය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්ට අවම බාධා ඇති වන පරිදි සෑම කණ්ඩායම් සාමාජිකයෙකුටම තාක්ෂණික පහසුකම් ලැබෙන බවට වගබලා ගනියි. දත්ත සුරක්ෂිතව පවතින බවට වග බලා ගැනීම සඳහා දෛනිකව නඩත්තු කටයුතු සිදු කෙරේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට

සක්‍රීයව සිටීමට සහ ආපදාවන් වළක්වා ගැනීමට ජාල පද්ධතිවල දුර්වල ස්ථාන නිරන්තරයෙන් පරීක්ෂා කෙරේ. එය ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ දෘඩාංග සහ මෘදුකාංග යාවත්කාලීනව තබා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ත්‍රිභාෂාවෙන් පරිවර්තනය කිරීම ආරම්භ කිරීම, O365 සඳහා උපස්ථ පරිපාටිය ක්‍රියාත්මක කිරීම, ලේඛන කළමනාකරණ පද්ධතිය සඳහා NAS මත පදනම් වූ මෘදුකාංග පද්ධති, හඬ පටිගත කිරීමේ පහසුකම සහිත නව CCTV කැමරා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ අන්තර්ජලය මත පදනම් වූ පැමිණීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සමාලෝචිත වර්ෂය තුළ වාර්තා කෙරුණු ජයග්‍රහණ අතරින් කිහිපයකි.

ඉහත නව ක්‍රියාත්මක කිරීම්/සංවර්ධනයන්ට අමතරව, වෙබ් නඩත්තුව, මෘදුකාංග යෙදුම් අලුත් කිරීම සහ දෘඩාංග නඩත්තු ගිවිසුම්, සර්වර්, රවුටර, ප්‍රවේශ ස්ථාන සහ ෆයර්වෝල් නඩත්තු කිරීම සහ සක්‍රීය නිර්දේශක සහ පරිශීලක කළමනාකරණය වැනි සාමාන්‍ය කාර්යයන් සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ ඒකකය කටයුතු කරයි. තවද, තාක්ෂණික සහාය සැපයීම, ආරක්ෂක පරීක්ෂණ, ජාල නඩත්තු කිරීම සහ උපාංග කළමනාකරණය ද මෙමගින් සිදු කෙරේ.



# සංයුක්ත පාලනය පිළිබඳ වාර්තාව

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත හරහා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල සහ රාජකාරි වගවීම, විනිවිදභාවය, අභ්‍යන්තර පාලනයන් සහ එහි පාර්ශවකරුවන්ගේ යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සෑම විටම පාලන ප්‍රමිතීන් අනුගමනය කිරීමට කැපවී සිටියි.

නීති, රක්ෂණ, ගිණුම්කරණය සහ මූල්‍ය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණ උපදේශන, අලෙවිකරණය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් යන ක්ෂේත්‍රවල වෘත්තිකයන් වන සහ තෝරාගත් ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති පත්කළ සාමාජිකයින් හතර දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත වේ. කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනෙකු නිල බලයෙන් පත් වූ සාමාජිකයින් වන අතර ඔවුහු භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මහ බැංකු නියෝජ්‍ය අධිපති සහ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙති.

සුදුසුකම් ලත් සහ පළපුරුදු සාමාජිකයින්ගෙන් සමන්විත කොමිෂන් සභාව අනුමත සැලැස්මක් හරහා අරමුණු ඉටු කර ගැනීම සඳහා සංවිධානයට උපායමාර්ගිකව මග පෙන්වීමට කැපවී සිටියි. කොමිෂන් සභාව විසින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලෙස නිශ්චිත, මැනිය හැකි, ළඟා කරගත හැකි, අදාළ සහ කාලයට ගැළපෙන අරමුණු නියම කර ඇති අතර ඒවායේ ප්‍රගතිය අධ්‍යක්ෂ ජනරාල් වෙතින් කාර්තුමය වශයෙන් කැඳවනු ලබන වාර්තා හරහා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලැබේ.

කොමිෂන් සභාව විසින් මග පෙන්වීමට අවශ්‍ය වූ විට විගණන අනු කමිටුවට අමතරව අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටෙක වෙනත් කමිටු වෙත සිය සාමාජිකයන් පත් කර ඇති අතර එමගින් කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ සාමාජිකයින් පහත සඳහන් කමිටුවල සේවය කළහ;

- විගණන කමිටුව
- ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුව
- අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කිරීම සහ ඇගයීම සඳහා පත් කළ කමිටුව
- පරිපාලන අත්පොත සමාලෝචනය කිරීම පිළිබඳ කමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ මෙහෙයුම් කමිටුව

කොමිෂන් සභා රැස්වීම් සහ කොමිෂන් සභාවේ අනු කමිටු රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සහභාගීත්වය පිළිබඳ සාරාංශය පහත දැක්වේ.

කොමිෂන් සභා සාමාජිකයාගේ නම කොමිෂන් සභා රැස්වීම විගණන කමිටුව ප්‍රධාන කාර්යසාධන දර්ශක ඇගයීමේ කමිටුව.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ උපාය මාර්ගික මග පෙන්වීම සිදු කරනු ලැබේ. කොමිෂන් සභාවේ සාමාන්‍ය මග පෙන්වීමට සහ පාලනයට යටත්ව ආයතනයේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුවේ.

| කොමිෂන් සාමාජිකයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම | විගණන කමිටුව | කාර්ය සාධන දර්ශකය ඇගයුම් කමිටුව | සංවිධාන ප්‍රතිව්‍යුහගත කමිටුව | පරිපාලන අත්පොත සමාලෝචනය කිරීම | තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව |
|---|---|---|---|---|---|---|
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා (නිළ බලයෙන් පත් වූ සාමාජික) | 15/17 | 05/05 | - | - | 02/02 | - |
| ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය (නිළ බලයෙන් පත් වූ සාමාජික) | 17/17 | 05/05 | - | - | 02/02 | - |
| සංජීව දිසානායක මහතා (නිළ බලයෙන් පත් වූ සාමාජික) | 12/17 | - | 01/01 | 01/01 | - | - |
| බ්‍රයන් සෙල්වනායගම් මහතා | 17/17 | 05/05 | - | 01/01 | 01/02 | - |
| සංජීව ඇන්තනී මහතා | 16/17 | - | 01/01 | - | 02/02 | - |
| ආචාර්ය ප්‍රසාද් සමරසිංහ | 12/12 | - | 01/01 | - | - | 02/02 |

# විගණන කමිටුවේ වාර්තාව

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රඥප්තියට අනුකූලව විගණන කමිටුව ස්වාධීනව සහ වාස්තවිකව සිය රාජකාරී ඉටු කර ඇත. මෙම ප්‍රඥප්තිය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ආයතන සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවලට සහ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වත්මන් ව්‍යාපාරික ප්‍රමුඛතාවලට අනුකූල වේ. නියාමකයාගේ දිගුකාලීන තිරසාර ක්‍රියාකාරිත්වය සඳහා පාලනය, අඛණ්ඩතාව, ආචාර ධර්ම, වගවීම සහ විනිවිදභාවය යනාදියෙන් යුක්ත ශක්තිමත් සංස්කෘතියක් වෙනුවෙන් විගණන කමිටුව පෙනී සිටී.

භාණ්ඩාගාර මාර්ගෝපදේශවලට අනුව විගණන කමිටුව කොමිෂන් සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය. සාමාජිකයින්ට ඒකාබද්ධ කුසලතා සහ මූල්‍ය, ගිණුම්කරණය, ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර පිළිබඳ විශේෂඥ දැනුම ඇත. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විගණන කමිටුවේ සභාපතිවරයා වේ.

කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| නම | විගණන කමිටුවේ තනතුර | සේවා කාලය | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ තනතුර |
|---|---|---|---|
| ඒ.කේ. සෙනෙවිරත්ව මහතා | සභාපති | 2023.01.01 සිට 2023.12.31 දක්වා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය | සාමාජික | 2023.01.01 සිට 2023.12.31 දක්වා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| බ්‍රයන් සෙල්වනායගම් මහතා | සාමාජික | 2023.03.23 සිට 2023.12.31 දක්වා | සාමාජික |

සාමාජිකයින්ගේ පැතිකඩ 2023 වාර්ෂික වාර්තාවේ 14 සිට 15 දක්වා පිටුවල දැක්වේ.

2023 දී, විගණන කමිටුව විසින් සියලුම සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් පහක් (05) පවත්වන ලදී.

2023 වර්ෂය තුළ විගණන කමිටුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත සාරාංශගත කර ඇත.

1. **මූල්‍ය වාර්තා සමාලෝචනය:**

   ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මත පදනම් වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද කාර්තුමය වාර්තා සහ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වැදගත් තොරතුරු, කලමනාකාරිත්වය සහ බාහිත විගණක සමග එක්ව විගණන කමිටුව මගින් සමාලෝචනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාව සහ සම්පූර්ණත්වය, මූල්‍ය ප්‍රකාශනවලට බලපෑ සැලකිය යුතු ගැලපීම්, ගිණුම්කරණ ක්‍රමවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාව, අභ්‍යන්තර පාලනයන් ඇගයීම, මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා අදාළ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව අනාවරණය කරන තොරතුරුවල නිවැරදි බව සහ ප්‍රමාණවත් බව පිළිබඳව විගණන කමිටුව විසින් බාහිර විගණකවරයා සමග සාකච්ඡා කරන ලදී.

2. **අභ්‍යන්තර පාලන පද්ධතිය සහ අනුකූලතා කාර්යය පිළිබඳ සමාලෝචනය:**

   **2021 වසර සඳහා අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය**

   විගණන කමිටුව විසින් 2021 වසර සඳහා වන අභ්‍යන්තර විගණන වාර්තාව එහි 3 වැනි රැස්වීමේදී සමාලෝචනය කරන ලදී. මෙම වාර්තාව ඊඩ පාර්ට්නර්ස් වෙත ඉදිරිපත් කරන ලදී. එම වාර්තාව කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා කමිටුව විසින් නිර්දේශ කර ඇත.

   **2021 සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පිළිබඳ සමාලෝචනය**

   1 වන විගණන කමිටු රැස්වීමේදී, විගණකාධිපතිවරයාගේ 2021 සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඒ සඳහා වන අදහස් සහිතව සාකච්ඡාවට බඳුන් කරන ලදී.

3. **කෙටුම්පත් අයවැය, කෙටුම්පත් උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සහ කෙටුම්පත් ප්‍රසම්පාදන සැලැස්ම පිළිබඳ සමාලෝචනය:**

   - 3 වන විගණන කමිටු රැස්වීමේ දී විගණන කමිටුව විසින් 2023 වසර සඳහා සංශෝධිත අයවැය වියදම් සමාලෝචනය කරන ලදී.
   - 4 වන විගණන කමිටු රැස්වීමේදී අයවැය කෙටුම්පත, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැසුම් කෙටුම්පත සහ 2024 වර්ෂය සඳහා මූල්‍ය අධිකාරය පැවරීම සමාලෝචනය කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

4. **අදාළ පාර්ශව ගනුදෙනු පිළිබඳ සමාලෝචනය:**

   විගණන කමිටුව විසින් අදාළ පාර්ශ්ව ගනුදෙනු නිරන්තරයෙන් සමාලෝචනය කරන ලදී.

5. **ලේඛන කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය**

   3 වන විගණන කමිටු රැස්වීමේදී, ලේඛන කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

# විගණන කමිටුවේ වාර්තාව

මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවත් අදාළ පාර්ශ්ව ගනුදෙනු සාමාන්‍ය ව්‍යාපාර තත්වයන්ගෙන් ඈත්ව පවතින බවත් අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණන පද්ධති ප්‍රමාණවත් සහ ඵලදායී වන බවත් මෙහෙයුම් ඊට සම්බන්ධ රෙගුලාසිවලට සම්පූර්ණයෙන්ම අනුකූල බවත් විගණන කමිටුවේ අදහස විය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ විගණන කමිටුව සඳහා සහ ඒ වෙනුවෙන්



**බ්‍රයන් සෙල්වනායගම් මහතා**
විගණන කමිටුවේ සභාපති

2024 ජූනි මස 26 වැනිදා



# මූල්‍ය තොරතුරු

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | INF/B/05/IRCSL/AR/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 09 අගෝස්තු 2024 |

**සභාපති**

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම්/ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා සටහන් යනාදියෙන් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තියේ විධිවිධාන අනුව විගණනය කරන ලදී. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යථා කාලයේ දී මාගේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මූල්‍ය ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා වන පදනම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ වන මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වන විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.3 කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය මගින් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳව කිසිඳු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගෙන ඇති අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන හෝ විගණනයේ දී ලබාගත් මාගේ දැනුමට ප්‍රමාණාත්මකව නොගැලපේද යන්න හෝ ප්‍රමාණාත්මකව සාවද්‍ය ලෙස ප්‍රකාශ කර ඇත්ද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන ඇති බව මා නිගමනය කරන්නේ නම්, එය නිවැරදි කිරීම සඳහා පාලනය සම්බන්ධයෙන් වගකීම දරන පුද්ගලයන්ට එම කාරණය දැනුම් දිය යුතුය. තව දුරටත් නිවැරදි නොකළ ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශන තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධාන අනුව ඒවා මාගේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර එය නියමිත වේලාවට පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ සහ පාලනයට සම්බන්ධ පුද්ගලයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක වන සාවද්‍ය ප්‍රකාශනවලින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තියට අනුව, කොමිෂන් සභාව වාර්ෂික හා කාලානුරූපී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි සිය සියලු ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම්**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙලිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වෙනස් කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයේ දී මා හඳුනා ගත් අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු අඩුපාඩුවක් ඇතුළුව, වෙනත් කාරණා අතර, සැලකිය යුතු විගණන සොයා ගැනීම් පිළිබඳ මම පාලනය සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් දැනුවත් කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2. වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතට පහත අවශ්‍යතා සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මාගේ අධ්‍යයනය තුළින් හැකි පමණ මා ලබාගෙන ඇති අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ අවශ්‍යතාව අනුව කොමිෂන් සභාව විසින් නිසි ගිණුම්කරණ වාර්තා තබා ගෙන ඇත.

2.1.2 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශන පෙර වසරට අනුකූල වේ.

2.1.3. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ අවශ්‍යතාවයට අනුව මූල්‍ය ප්‍රකාශනවලට ඉකුත් වර්ෂයේදී මා විසින් ලබාදෙන ලද නිර්දේශ ඇතුළත්ව ඇත.

2.2. ක්‍රියාවට නංවන ලද ක්‍රියා පරිපාටි මත පදනම් වූ බැවින් සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණුවලට පමණක් සීමා වූ බැවින් මාගේ අවධානයට කිසිවක් ලක් වී නැත;

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ අවශ්‍යතාවය ප්‍රකාරව සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලින් බැහැර වන කොමිෂන් සභාව විසින් ඇති කර ගන්නා ලද ඕනෑම කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2. පහත දැක්වෙන කරුණු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියට අනුව කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන වලට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර නොමැති බව ප්‍රකාශ කිරීම;

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | නීතිය/විධානය වෙත වන යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | රජය සතු ව්‍යාපාර සඳහා වන සංයුක්ත පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2021 හි මාර්ගෝපදේශ 2.2.2 (අ) (i) | කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි පරිදි කටයුතු කිරීමට සභාපතිවරයා වග බලා ගත යුත්තේය. කෙසේ වුවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛණය ප්‍රකාරව රැස්වීම්වල කටයුතු සඳහා වන ලිඛිත ප්‍රතිපත්තියක් විගණනය වෙත සපයා නොමැත. |
| (ආ) | රජය සතු ව්‍යාපාර සඳහා වන සංයුක්ත පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2021 හි මාර්ගෝපදේශ 2.6 | ප්‍රධාන වශයෙන් මණ්ඩලයට මග පෙන්වීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සතු වන අතර ව්‍යවස්ථාමය අවශ්‍යතාවන් සහ කර්මාන්තයේ හොඳම භාවිතාවන්වලට අනුකූල වන පරිදි සියළු ක්‍රියාපරිපාටීන් අනුගමනය කරන බවට වගබලා ගත යුතු වේ. එමෙන්ම මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් ලේකම් සතු විය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නියැළී සිටින යම් සේවකයෙකු මණ්ඩලයේ ලේකම් ලෙස පත් නොකළ යුතු අතර මණ්ඩල ලේකම් එහි උප කමිටුවල ලේකම් ලෙස කටයුතු කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව සඳහා සුදුසුකම්ලත් ලේකම්වරයෙකු නොමැත. වර්තමානයේ විමර්ශන අධ්‍යක්ෂවරයා සහ සහකාර අධ්‍යක්ෂ - නීති තම නිත්‍ය තනතුරුවල වගකීම්වලට අමතරව පිළිවෙලින් කොමිෂන් සභාවේ ලේකම් ලෙසත් විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර එය මාර්ගෝපදේශවලට පටහැනි වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වන වගන්තිය | විධායක කාණ්ඩයේ සේවකයන් සඳහා වාහන මිලදී ගැනීමට බැංකු ණය ලබා දීමට විධිවිධාන සලසා තිබුණ ද සමාලෝචිත වසර තුළ සේවකයෙක් සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වලින් 4.2% ක පොළියක් යටතේ රු. 1,000,000 ක වාහන ණය ලබා දී ඇත. |
| (ඈ) | අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය හා රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 03 වගන්තිය | සියළු අමාත්‍යංශ සහ අදාළ අධිකාරීන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීම සහ වැටුප් සහ සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වැළකී සිටිය යුතු බවට චක්‍රලේඛ මගින් උපදෙස් දී ඇත. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව අධ්‍යක්ෂ තනතුරු (01), කළමනාකාර/ සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) හා ලේකම් තනතුරු එකක් (01) පුරවා ඇත. |

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරී අනුව ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට;

(අ) 2010 වසරේ සිට රු. 60,506,093ක කාර්ය සාධන දිරි දීමනාවක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) යෝජනා ක්‍රමය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 වසරේ සිට මාස එකක (01) මූලික වැටුප ගෙවීමේ පදනම මාස එකහමාරක (1 1/2) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මෙම වැඩි කිරීම සඳහා 2019 සිට 2023 දක්වා කාල සීමාව තුළ කොමිෂන් සභාව විසින් රු. 14,102,183ක් වියදම් කර ඇත.

(ඇ) පනත ප්‍රකාරව අධීක්ෂණ සහ නියාමන කටයුතු ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව සතුව රක්ෂණයට අදාළ දැනුම සහ ආයුගණක දැනුම සහිත සුදුසුකම් ලත් වෘත්තිකයන් නොමැත. 2016 වසරේ දී ආයුගණක තනතුර අනුමත කළ ද එම තනතුර තවමත් පුරප්පාඩුව පවතියි.

2.2.4 පහත කටයුතු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තිය ප්‍රකාරව අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් සහිතව, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කොට භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම.

**වෙනත් කරුණු**

(අ) රක්ෂණයේ මූලික මූලධර්ම යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමය මගින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. එම මූලධර්ම රක්ෂණ නියාමකයන්ගේ නියාමන සහ අධීක්ෂණ කටයුතුවල ගුණාත්මක බව ඇගයීම සඳහා වන ප්‍රධාන ක්‍රමය වන අතර මෙරට රක්ෂණ අංශය සඳහා රෙගුලාසි හඳුන්වා දීමට රාමුවක් ලෙස භාවිත කරනු ලැබේ. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමයේ සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව 2023 වසර සඳහා සාමාජිකත්ව ගාස්තු ලෙස රු. 6,009,935ක් ගෙවා ඇත. කොමිෂන් සභාව රක්ෂණයේ මූලික මූලධර්මවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි බැලීමට 2021 විගණයේ දී තොරතුරු ඉල්ලා ඇත. කෙසේ වුවද, ඉල්ලූ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත.

(ආ) නීතිපතිවරයාගේ අදහස අනුව කොමිෂන් සභාව තම සේවක සංඛ්‍යාව සහ වැටුප් යෝජනා ක්‍රමය තීරණය කර ඇත. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් වැටුප් ගැළපීම්, සේවක සංඛ්‍යා සංශෝධනය, 2018 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා රු. 7,800ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15%ක් වන නිපුණතා දීමනාව සහ රු. 12,500ක විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම යන කරුණු සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. කොමිෂන් සභාව මුදල් අමාත්‍යංශය යටතේ වන ආයතනයක් වුවද සිය සේවක සංඛ්‍යාව සහ වැටුප් හා දීමනා වැඩි කිරීම පිළිබඳ තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයේ නිෂ්කාශනය හෝ එකඟතාව ලබාගෙන නොමැත.

(ඇ) නීතිපතිවරයාගේ අදහසට අනුව 2019 වසර තුළ අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට සහ යහ පාලන මාර්ගෝපදේශයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ නංවා ඇත.

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඈ) සිය සේවකයන් සඳහා ස්වයං-දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. සේවකයන්ගේ කිසිදු දායකත්වයකින් තොරව කොමිෂන් සභාව 2023 වසර සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමට රු.මි. 3.5ක (2022-රු. 6.3) අරමුදල් වැය කර ඇත.

(ඉ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 03 වගන්තිය මගින් කොමිෂන් සභාවේ අරමුණු සහ වගකීම් දක්වා ඇත. පනතේ 05 වන වගන්තිය මගින් කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා එහි ඉටු කළ යුතු කාර්යයන් සහ වගකීම් නිශ්චිතව දක්වා ඇත. කොමිෂන් සභාවේ කාර්යසාධනය සහ පරිපාලනයේ පහසුව සඳහා කොමිෂන් සභාව මගින් අංශ 6ක් ස්ථාපිත කර ඇති අතර ඒවා නම් මූල්‍ය සහ පරිපාලන, අධීක්ෂණ, විමර්ශන, නීති, ආයුගණක සහ අලෙවිකරණ වේ. කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශ අන්තර් සම්බන්ධතාවකින් යුතුව කටයුතු කළ යුතු අතර රක්ෂණ සමාගම් සහ කර්මාන්තය පිළිබඳ පොදු තොරතුරු බෙදා ගත යුතුය. කෙසේ වුවද, පනතේ අරමුණු සපුරාලීමට කොමිෂන් සභාව සඳහා සංකලිත තොරතුරු බෙදා ගැනීමේ පද්ධතියක් සකස් කර නොමැත.

(ඊ) 2023 සඳහා කොමිෂන් සභාව විසින් සිය අභ්‍යන්තර විගණක ලෙස වරලත් ගණකාධිකාරී ආයතනයක් පත් කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වසරේ පළමු කාර්තුව පමණක් අභ්‍යන්තර විගණනය මගින් ආවරණය කර ඇත.

ඩබ්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# 2023 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| විගණකාධිපති වාර්තාව | | | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර |
|---|---|---|---|
| **2.** | **වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | | |
| **2.2.2** | කොමිෂන් සභාව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියට අනුව පහත කරුණු හැර කොමිෂන් සභාවේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ විධාන කිසිවක් අනුගමනය කර නොමැති බව ප්‍රකාශ කිරීම; | | |
| **(අ)** | **නීතිය/ නියෝගය වෙත යොමුව**<br>රජය සතු ව්‍යාපාර සඳහා වන සංයුක්ත පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2021 හි මාර්ගෝපදේශ 2.2.2 (අ) (i) | **විස්තරය**<br>කොමිෂන් සභාවේ රැස්වීම්වලදී නිසි පරිදි කටයුතු කිරීමට සභාපතිවරයා වග බලා ගත යුත්තේය. කෙසේ වුවද, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 4 (3) ඡේදය සහ පළමු උපලේඛණය ප්‍රකාරව රැස්වීම්වල කටයුතු සඳහා වන ලිඛිත ප්‍රතිපත්තියක් විගණනය වෙත සපයා නොමැත. | රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ රැස්වීම් පවත්වනු ලැබේ. පනතේ පළමු උපලේඛනයේ 8 (1) ඡේදය මගින් මණ්ඩලයේ කටයුතු විශේෂයෙන් දක්වා ඇති අතර එවැනි අවශ්‍යතා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සපුරනු ලැබේ.<br><br>තවද 2022 අගෝස්තු 16 දින පැවති කොමිෂන් සභාවේ 223 වැනි රැස්වීමේදී මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ රැස්වීම් වාර්තා තබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොතක් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. |
| **(ආ)** | රජය සතු ව්‍යාපාර සඳහා වන සංයුක්ත පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2021 හි මාර්ගෝපදේශ 2.6 | ප්‍රධාන වශයෙන් මණ්ඩලයට මග පෙන්වීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සතු වන අතර ව්‍යවස්ථාමය අවශ්‍යතාවන් සහ කර්මාන්තයේ හොඳම භාවිතාවන්වලට අනුකූල වන පරිදි සියළු ක්‍රියාපරිපාටීන් අනුගමනය කරන බවට වගබලා ගත යුතු වේ. එමෙන්ම මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් ලේකම් සතු විය යුතුය. තවද, දැනටමත් වෙනත් කාර්යයක නියැළී සිටින යම් සේවකයෙකු මණ්ඩලයේ ලේකම් ලෙස පත් නොකළ යුතු අතර මණ්ඩල ලේකම් එහි උප කමිටුවල ලේකම් ලෙස කටයුතු කළ යුතුය. කෙසේ වුවද, කොමිෂන් සභාව සඳහා සුදුසුකම්ලත් ලේකම්වරයෙකු නොමැත. වර්තමානයේ විමර්ශන අධ්‍යක්ෂවරයා සහ සහකාර අධ්‍යක්ෂ - නීති තම නිත්‍ය තනතුරුවල වගකීම්වලට අමතරව පිළිවෙලින් කොමිෂන් සභාවේ ලේකම් ලෙසත් විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන අතර එය මාර්ගෝපදේශවලට පටහැනි වේ. | යෝජනා සඳහා වන ඉල්ලීම (RFP) ප්‍රමුඛතම විගණන ආයතන පහකට යවන ලදී. යෝජනාව යැවීමේ අවසාන දිනය 26/09/2023 විය. කෙසේ වෙතත්, අපගේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත කිසිදු යෝජනාවක් ලැබී නැත. 2023 සැප්තැම්බර් 27 වැනි දින පැවැත් වූ කොමිෂන් සභාවේ 239 වැනි රැස්වීමේදී මේ බව කොමිෂන් සභාවට දැනුම් දෙන ලද අතර නීති සමාගම්, සමාගම් ලේකම්වරුන්ගේ ආයතන සහ විගණන ආයතන වෙතින් අයදුම්පත් කැඳවන ලෙස කොමිෂන් සභාවේ සාමාජිකයින් උපදෙස් දෙන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යෝජනා සඳහා වන ඉල්ලීම් කැඳවීය. කෙසේ වෙතත්, කිසිදු අයදුම්පතක් නොලැබිණි.<br><br>කරුණු සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ලෙස පත් කිරීම සඳහා නීතිමය පසුබිමක් සහිත අධ්‍යක්ෂ - විමර්ශන පත් කිරීමට 2024.01.18 දින පැවැති 246 වැනි කොමිෂන් සභා රැස්වීමේ දී තීරණය කරන ලදී. |
| **(ඇ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 7 වන වගන්තිය | විධායක කාණ්ඩයේ සේවකයන් සඳහා වාහන මිලදී ගැනීමට බැංකු ණය ලබා දීමට විධිවිධාන සලසා තිබුණ ද සමාලෝචිත වසර තුළ සේවකයෙක් සඳහා කොමිෂන් සභාවේ අරමුදල්වලින් 4.2% ක පොළියක් යටතේ රු. 1,000,000 ක වාහන ණය ලබා දී ඇත. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2021 නොවැම්බර් 16 වැනි දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (PED) විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 2.3 වගන්තියට අනුව සකස් කරන ලද කොමිෂන් සභාව මගින් අනුමත පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති අත්පොත අනුව කටයුතු කරනු ලැබේ. වාහන ණය යෝජනා ක්‍රමය අත්පොතෙහි කොටසකි. |

# 2023 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| විගණකාධිපති වාර්තාව | | | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර |
|---|---|---|---|
| **(ඇ)** | අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය හා රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතේ 03 වගන්තිය | සියළු අමාත්‍යංශ සහ අදාළ අධිකාරීන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සේවකයන් බඳවා ගැනීම සහ වැටුප් සහ සේවක සංඛ්‍යාව වැඩි කිරීමෙන් වැළකී සිටිය යුතු බවට චක්‍රලේඛ මගින් උපදෙස් දී ඇත. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව අධ්‍යක්ෂ තනතුරු (01), කළමනාකාර/ සහකාර කළමනාකාර තනතුරු දහතුනක් (13) හා ලේකම් තනතුරු එකක් (01) පුරවා ඇත. | කොමිෂන් සභාව තනතුරු 57ක් සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගෙන ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත සිදු කෙරෙන සියලුම නව බඳවා ගැනීම් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව සිදු කරන ලදී.<br>කළමනාකරු/සහකාර කළමනාකරු යනු විධායක තනතුරට උසස් කිරීමේ ශ්‍රේණි වන අතර මුළු සේවක සංඛ්‍යාවට බලපෑමක් ඇති නොවේ.<br>ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නැවත වරක් 2024.01.10 දින නීතිපතිවරයාගෙන් පැහැදිලි කර ගැනීමක් ලබාගෙන ඇත. පනතට අනුව කොමිෂන් සභාවට බලය තිබෙන බව ඔවුන් යළිත් තහවුරු කර ඇත. |
| **2.2.3** | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය අනුව කොමිෂන් සභාව පහත දෑ හැර කිසිවක් එහි බලතල, කාර්යයන් සහ රාජකාරි අනුව ඉටු කර නොමැති බව ප්‍රකාශ කිරීමට; | | |
| | (අ) 2010 වසරේ සිට රු. 60,506,093ක කාර්ය සාධන දිරි දීමනාවක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | | නව කාර්ය සාධන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය 2024.03.25 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. |
| | (ආ) යෝජනා ක්‍රමය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2019 වසරේ සිට මාස එකක (01) මූලික වැටුප ගෙවීමේ පදනම මාස එකහමාරක (1 1/2) දළ වැටුප ලෙස වෙනස් කර ඇත. මෙම වැඩි කිරීම සඳහා 2019 සිට 2023 දක්වා කාල සීමාව තුළ කොමිෂන් සභාව විසින් රු. 14,102,183ක් වියදම් කර ඇත. | | ඉහත පරිදි ම වේ. |
| | (ඇ) පනත ප්‍රකාරව අධීක්ෂණ සහ නියාමන කටයුතු ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව සතුව රක්ෂණයට අදාළ දැනුම සහ ආයුගණක දැනුම සහිත සුදුසුකම් ලත් වෘත්තිකයන් නොමැත. 2016 වසරේ දී ආයුගණක තනතුර අනුමත කළ ද එම තනතුර තවමත් පුරප්පාඩුව පවතියි. | | ආයුගණක සහ රක්ෂණ කුසලතා සම්බන්ධ විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය අවසන් කර ඇත. කැබිනට් උපදේශක ප්‍රසම්පාදන කමිටුව නිර්දේශ කර ඇත. අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත 2024.05.09 දින අමාත්‍යාංශය වෙත යවා ඇති අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය අපේක්ෂා කරයි. |
| **2.2.4** | පහත කටයුතු හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තිය ප්‍රකාරව අදාළ නීතිවලට අනුකූලව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් සහිතව, කාර්යක්ෂම හා ඵලදායී ලෙස ප්‍රසම්පාදනය කොට භාවිතා කර නොමැති බව ප්‍රකාශ කිරීම. | | |
| **3** | **වෙනත් කරුණු** | | |
| | (අ) රක්ෂණයේ මූලික මූලධර්ම යනු ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමය මගින් සකස් කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්ම රාමුවකි. එම මූලධර්ම රක්ෂණ නියාමකයන්ගේ නියාමන සහ අධීක්ෂණ කටයුතුවල ගුණාත්මක බව ඇගයීම සඳහා වන ප්‍රධාන ක්‍රමය වන අතර මෙරට රක්ෂණ අංශය සඳහා රෙගුලාසි හඳුන්වා දීමට රාමුවක් ලෙස භාවිත කරනු ලැබේ. ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමයේ සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව 2023 වසර සඳහා සාමාජිකත්ව ගාස්තු ලෙස රු. 6,009,935ක් ගෙවා ඇත. කොමිෂන් සභාව රක්ෂණයේ මූලික මූලධර්මවලට අනුකූලව කටයුතු කර ඇත්දැයි බැලීමට 2021 විගණයේ දී තොරතුරු ඉල්ලා ඇත. කෙසේ වුවද, ඉල්ලූ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | | ඇගයීම බොහෝ දුරට නිරීක්ෂණය වූ රක්ෂණ ප්‍රධාන මූලධර්ම 1,2,9,10 වේ. දැනට ජාත්‍යන්තර රක්ෂණ අධීක්ෂකයන්ගේ සංගමය මගින් හඳුනා ගත් රක්ෂණ ප්‍රධාන මූලධර්ම 25 ක් වේ.<br>රක්ෂණ පනතට සංශෝධන සිදු කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද කමිටුවක් මගින් සියලුම රක්ෂණ ප්‍රධාන මූලධර්ම පිළිබඳ සමාලෝචනයක් සිදු කෙරේ. සමාලෝචන අවසන් වූ පසු ඒවා බෙදා ගනු ලැබේ.<br>ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් රක්ෂණ ප්‍රධාන මූලධර්ම 1-4 පිළිබඳ අදහස් සහ ඉදිරිපත් කිරීම් කමිටුව වෙත ලබා දී ඇත. කමිටුව විසින් ඒකාබද්ධ කරන ලද රක්ෂණ ප්‍රධාන මූලධර්ම සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.<br>2024 දී රක්ෂණ ප්‍රධාන මූලධර්ම 10 ක් සහ 2025 දී ඉතිරි රක්ෂණ ප්‍රධාන මූලධර්ම සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සැලසුම් කරයි. |

| විගණකාධිපති වාර්තාව | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර |
|---|---|
| (ආ) නීතිපතිවරයාගේ අදහස අනුව කොමිෂන් සභාව තම සේවක සංඛ්‍යාව සහ වැටුප් යෝජනා ක්‍රමය තීරණය කර ඇත. 2019 මැයි 31 දිනැති සංදේශය මගින් වැටුප් ගැළපීම්, සේවක සංඛ්‍යා සංශෝධනය, 2018 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා කාර්ය මණ්ඩලය සඳහා රු. 7,800ක ජීවන වියදම් දීමනාව, මූලික වැටුපෙන් 15%ක් වන නිපුණතා දීමනාව සහ රු. 12,500ක විශේෂ ජීවන වියදම් දීමනාව ගෙවීම යන කරුණු සඳහා සභාපතිවරයාගේ අනුමැතිය ඉල්ලා ඇත. කොමිෂන් සභාව මුදල් අමාත්‍යංශය යටතේ වන ආයතනයක් වුවද සිය සේවක සංඛ්‍යාව සහ වැටුප් හා දීමනා වැඩි කිරීම පිළිබඳ තීරණය කිරීම සඳහා කොමිෂන් සභාව මහා භාණ්ඩාගාරයේ නිෂ්කාශනය හෝ එකඟතාව ලබාගෙන නොමැත. | 2024.01.10 දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව යළි අවධාරණය කර ඇත්තේ:<br>i) කොමිෂන් සභාවට සිය බලය, වගකීම් සහ කාර්යයන් භුවමාරු කිරීමේ දී හා ඉටු කිරීමේ දී අවශ්‍ය විය හැකි පරිදි නිලධාරීන් සහ සේවකයන් සේවයේ යෙදවීම සඳහා සිය බලය භාවිතා කළ හැකි ය යන්න රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ කොමිෂන් සභාවේ බලය, වගකීම් සහ කාර්යයන් පිළිබඳ 5 (ඉ) වගන්තියෙහි දක්වා ඇත.<br>ii) 5 (ඌ) වගන්තිය මගින් "මෙම පනත යටතේ යථා පරිදි කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලු කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාවට බලය ලබා දෙනු ලැබේ".<br>iii) 10 (1) සහ (2) වගන්ති මගින් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පත්වීම්, වේතන සහ සේවා කොන්දේසි තීරණය කිරීමට කොමිෂන් සභාවට බලය පවරනු ලැබේ. |
| (ඇ) නීතිපතිවරයාගේ අදහසට අනුව 2019 වසර තුළ අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයට සහ යහ පාලන මාර්ගෝපදේශයට පටහැනිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කොමිෂන් සභාවේ වැටුප් 12.98% සිට 59.73% දක්වා ඉහළ නංවා ඇත. | ඉහත පරිදි ම වේ. |
| (ඈ) සිය සේවකයන් සඳහා ස්වයං-දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීමට කොමිෂන් සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. සේවකයන්ගේ කිසිදු දායකත්වයකින් තොරව කොමිෂන් සභාව 2023 වසර සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමට රු.මි. 3.5ක (2022-රු. 6.3) අරමුදල් වැය කර ඇත. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ආරම්භයේ සිටම කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ ප්‍රතිලාභවල කොටසක් ලෙස දායක නොවන රක්ෂණ ආවරණයක් ලබා දී ඇති අතර එය පත්වීම් ලිපිවල ඇතුළත් කර ඇත. ඒ අනුව ස්වයං දායක යෝජනා ක්‍රමයක් නිකුත් කරන ලද රැකියා ගිවිසුම්වලට අනුකූල නොවනු ඇත.<br>ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 06/2019 සහ 06/2019 (i) අනුව රක්ෂණ පහසුකම් සපයන්නන් තෝරා ගැනීමේ දී තරඟකාරී ලංසු ක්‍රියාවලිය අනුගමනය කරයි. |
| (ඉ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 03 වගන්තිය මගින් කොමිෂන් සභාවේ අරමුණු සහ වගකීම් දක්වා ඇත. පනතේ 05 වන වගන්තිය මගින් කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා එහි ඉටු කළ යුතු කාර්යයන් සහ වගකීම් නිශ්චිතව දක්වා ඇත. කොමිෂන් සභාවේ කාර්යසාධනය සහ පරිපාලනයේ පහසුව සඳහා කොමිෂන් සභාව මගින් අංශ 6ක් ස්ථාපිත කර ඇති අතර ඒවා නම් මූල්‍ය සහ පරිපාලන, අධීක්ෂණ, විමර්ශන, නීති, ආයුගණක සහ අලෙවිකරණ වේ. කොමිෂන් සභාවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශ අන්තර් සම්බන්ධතාවකින් යුතුව කටයුතු කළ යුතු අතර රක්ෂණ සමාගම් සහ කර්මාන්තය පිළිබඳ පොදු තොරතුරු බෙදා ගත යුතුය. කෙසේ වුවද, පනතේ අරමුණු සපුරාලීමට කොමිෂන් සභාව සඳහා සංකලිත තොරතුරු බෙදා ගැනීමේ පද්ධතියක් සකස් කර නොමැත. | නියාමන තොරතුරු තාක්ෂණ පද්ධතිය නැවත සකස් කිරීම සඳහා මුදල් වෙන් කර ඇත. තවද, තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ මග පෙන්වීම අනුව වෙබ් පාදක තොරතුරු රැස් කිරීමේ පෝටලය සංවර්ධනය කර ඇත. එය නියමු මට්ටමේ පවතී. මේ අතර, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නියාමන කටයුතු සඳහා පද්ධතියක් සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. |
| (ඊ) 2023 සඳහා කොමිෂන් සභාව විසින් සිය අභ්‍යන්තර විගණක ලෙස වරලත් ගණකාධිකාරී ආයතනයක් පත් කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වසරේ පළමු කාර්තුව පමණක් අභ්‍යන්තර විගණනය මගින් ආවරණය කර ඇත. | අභ්‍යන්තර විගණකවරුන් විසින් අධීක්ෂණ අංශයේ ක්ෂේත්‍ර කටයුතු ද සම්පූර්ණ කරන ලදී. |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 23,108,368 | 27,301,799 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු (රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල) | 2 | 9,593,949 | 9,593,949 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 3 | 10,549,513 | 12,540,714 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 43,251,830 | 49,436,462 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 4 | 581,384 | 535,914 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ වෙනත් | 2 | 11,522,878,141 | 9,371,226,885 |
| වෙනත් ජංගම වත්කම් | 5 | 21,384,321 | 38,597,160 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | 114,000,000 | 228,000,000 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය - ප්‍රතිමිලදී ගැනුම් | | 180,000,000 | 103,000,000 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | | 150,004,810 | - |
| විලම්භිත බදු වත්කම් | 21 | 7,090,385 | 7,137,274 |
| මුදල් හා මුදල් සමාන දෑ | 6 | 8,094,322 | 13,542,583 |
| **මුළු ජංගම වත්කම්** | | 12,004,033,363 | 9,762,039,816 |
| **මුළු වත්කම්** | | 12,047,285,193 | 9,811,476,278 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත හා අරමුදල්** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 7 | 11,532,472,092 | 9,380,820,835 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 34,972,754 | 32,439,194 |
| සමුච්චිත අරමුදල | | 352,127,844 | 282,996,422 |
| **මුළු සංචිත සහ අරමුදල්** | | 11,919,572,690 | 9,696,256,451 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදානය | 8 | - | 5,061,291 |
| විලම්භිත බදු වගකීම | 21 | 3,922,087 | 4,672,066 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 9 | 23,634,618 | 23,790,913 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 27,556,705 | 33,524,270 |
| **ජංගම වගකීම්** | | | |
| අත්තිකාරම් ලැබීම් | | 34,126,830 | 17,685,781 |
| වෙනත් ජංගම වගකීම් | 10 | 66,028,968 | 64,009,776 |
| **මුළු ජංගම වගකීම්** | | 100,155,798 | 81,695,557 |
| **මුළු සංචිත සහ වගකීම්** | | 12,047,285,193 | 9,811,476,278 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයන් සතුය.

ඉහත මූල්‍ය ප්‍රකාශනය පිටු අංක 69 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමග සංයෝජිතව කියවිය යුතුය.

**රසික් සරූක්**
සභාපති, ශ්‍රීලරනිකොස

**බ්‍රයන් සෙල්වනායගම්**
සභාපති, විගණන කමිටුව

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජෙනරාල්

**සතීෂ් කුමාර්**
අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකාව
2024 ජූනි 25

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| ආදායම | සටහන් | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|---|
| **හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම** | | | |
| වාර්ෂික ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු | 11 | 336,403,880 | 307,905,835 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 8 | 5,061,291 | - |
| ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් ලද ආදායම | 12 | - | 750 |
| | | | |
| **හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම** | | | |
| පොළී ආදායම | 13 | 81,638,422 | 58,821,625 |
| වෙනත් ආදායම් | 14 | 549,484 | 532,554 |
| **මුළු ආදායම** | | 423,653,076 | 367,260,764 |
| | | | |
| **වියදම** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | (132,146,344) | (127,680,340) |
| වෘත්තීය ගාස්තු | 16 | (224,300) | (227,120) |
| මෙහෙයුම් ගාස්තු | 17 | (96,697,394) | (83,834,958) |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ වියදම් | 18 | - | (750) |
| මූල්‍ය සහ අනෙකුත් | 19 | (140,396) | (297,028) |
| | | | |
| **මුළු වියදම්** | | (229,208,435) | (212,040,196) |
| | | | |
| බදුවලට පෙර ශුද්ධ අතිරික්තය | | 194,444,641 | 155,220,568 |
| බදුකරණය | 21 | (45,171,143) | (37,981,891) |
| බදුවලට පසු ශුද්ධ අතිරික්තය | | 149,273,498 | 117,238,677 |
| සමුච්චිත අරමුදලට මාරු කෙරෙන අතිරික්තය | | 150,892,215 | 120,054,308 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක ලාභය | 9 | (1,618,717) | (2,815,631) |
| | | | |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | 152,510,932 | 122,869,939 |

පිටු අංක 69 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2021 ජනවාරි 1 දිනට ශේෂය | 17,689,652 | 92,731,913 | 17,206,631 |
| 2021 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 69,783,461 | 69,783,461 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 12,679,107 | - | 12,679,107 |
| විලම්භිත බදු | (1,775,075) | - | (1,775,075) |
| ආයුගණක අලාභය | - | 496,209 | 496,209 |
| විලම්භිත බදු | | (69,469) | (69,469) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 28,593,684 | 162,942,114 | 191,535,798 |
| 2022 ජනවාරි 1 දිනට ශේෂය | 28,593,684 | 162,942,114 | 191,535,798 |
| 2022 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 122,869,939 | 122,869,939 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 3,845,510 | - | 3,845,510 |
| ආයුගණක ලාභය | - | (2,815,631) | (2,815,631) |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 32,439,194 | 282,996,422 | 315,435,615 |
| 2023 ජනවාරි 1 දිනට ශේෂය | 32,439,194 | 282,996,422 | 315,435,615 |
| 2023 වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය | - | 152,510,932 | 152,510,932 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 2,533,560 | - | 2,533,560 |
| පෙර වසරවල ආදායම් බද්ද | | (35,430,918) | (35,430,918) |
| ආයුගණක ලාභය | - | (1,618,717) | (1,618,717) |
| පසුගිය වසරවල අතිරික්ත ප්‍රතිපාදන ආපසු හැරවීම | | 3,670,125 | 3,670,125 |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | - | (50,000,000) | (50,000,000) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 34,972,754 | 352,127,844 | 387,100,598 |

ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතය මෝටර් වාහන, ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් හා කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසීමේ කාර්යාල උපකරණ තක්සේරුවෙන් පැන නගින අතිරික්තය/හිගය නියෝජනය කරයි.

සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) මගින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙන් මාරු කරන ලද අතිරික්ත/ (ඌණතාවය) නියෝජනය කරයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | සටහන් | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| කාල පරිච්ඡේදය සඳහා වන අතිරික්තය | | 194,444,641 | 155,220,568 |
| ක්ෂය සඳහා ගැලපීම් | 1 | 10,352,302 | 8,320,725 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | 9 | 6,430,322 | 5,438,479 |
| ප්‍රදාන හඳුනා ගැනීම් | | (5,061,291) | - |
| පසුගිය වසරවල ප්‍රතිපාදන ආපසු හැරවීම | | 3,670,125 | - |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම | 9 | (4,967,900) | (446,775) |
| පොළී ආදායම | 13 | (81,638,405) | (58,821,625) |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම | | 123,229,795 | 109,711,372 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | | |
| තොගවල (වැඩි වීම)/ අඩු වීම | 4 | (45,470) | 62,516 |
| ලැබිය යුතු දෑවල (වැඩි වීම)/ අඩු වීම | 5 | 3,596,983 | (29,049,200) |
| අත්තිකාරම් ලැබීම්වල වැඩි වීම/ (අඩු වීම) | | 16,441,049 | 1,305,452 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩි වීම/ (අඩු වීම) | 10 | (1,190,107) | (1,129,065) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහ | | 18,802,456 | (28,810,294) |
| ගෙවන ලද ආදායම් බදු | 21 | (80,476,064) | (12,998,271) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | 61,556,187 | 67,902,806 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(යෙදූ) මුදල් ප්‍රවාහ** | | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය | | (227,004,810) | 117,000,000 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | 114,000,000 | (228,000,000) |
| පොළී ආදායම | | 99,625,674 | 58,821,625 |
| දේපළ පිරියත හා උපකරණ මිලට ගැනීම | 1 | (3,625,311) | (7,949,650) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (17,004,447) | (60,128,025) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| මුදල් අමාත්‍යංශයෙන් ලද ප්‍රදානයන් | | - | (552,384) |
| ඒකාබද්ධ අරමුදල වෙත වන දායකත්වය | | (50,000,000) | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | (50,000,000) | (552,384) |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | (5,448,260) | 7,222,397 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | 13,542,583 | 6,320,185 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | 8,094,323 | 13,542,583 |
| **අතැති සහ බැංකුවේ ඇති මුදල්** | 6 සහ 22 | | |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | | 7,775,887 | 13,550,961 |
| බැංකුවේ  පවතින මුදල් - ලංකා බැංකුව | | 317,804 | - |
| ඉතුරුම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | 632 | 614 |
| | | 8,094,323 | 13,551,575 |
| බැංකුවේ  පවතින මුදල් - ලෙජරයට අනුව | | - | (8,993) |
| | | 8,094,323 | 13,542,582 |

පිටු අංක 69 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වැඩි වීම | 2,151,651,257 | 939,396,269 |
| කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර ශුද්ධ වැඩි වීම | 2,151,651,257 | 939,396,269 |
| | | |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | |
| රජයේ සුරැකුම්පත්වලින් ලැබිය යුතු පොළියෙහි (වැඩිවීම)/ අඩුවීම | (364,760,935) | (1,581,250,000) |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩි වීම)/ අඩු වීම | (39,599,688) | 6,815,722 |
| ගෙවිය යුතු දෑවල වැඩි වීම/(අඩු වීම) | (868,580,507) | 884,809,359 |
| ලැබිය යුතු දෑවල වැඩි වීම/(අඩු වීම) | (88,690,828) | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ අරමුදලින් මාරු කළ යුතු ප්‍රමාණයේ වැඩිවීම/ (අඩුවීම) | 18,970,175 | (540,000) |
| | (1,342,661,783) | (690,164,919) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම) | 808,989,474 | 249,231,350 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබූ/(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහ** | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | (7,800,000) | - |
| ස්ථාවර තැන්පතුවල අයෝජන | (817,312,649) | (224,970,912) |
| ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් වැඩි වීම/(අඩු වීම) | (825,112,649) | (224,970,912) |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | (16,123,174) | 24,260,438 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 25,562,131 | 1,301,693 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | 9,438,956 | 25,562,132 |
| | | |
| ජංගම ගිණුමේ ශේෂය | 1,000,000 | 1,000,000 |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | 8,438,956 | 24,562,131 |
| | 9,438,956 | 25,562,131 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. 1 වාර්තා කිරීමේ ආයතනය

### 1.1.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදනය අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

කොමිසමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01 යන ලිපිනයෙහිය.

### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම වන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීමයි.

පනතට අනුව කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම,

(ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම,

(ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් රජය වෙත උපදෙස් ලබා දීම,

(ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(ඉ) කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම,

(ඊ) නිශ්චල හෝ චංචල දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම,

(උ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම සහ,

(ඌ) මෙම පනත යටතේ යථා පරිදි කොමිෂන් සභාවේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම.

## 1.2 සකස් කිරීමේ පදනම

### 1.2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, සම කොටස්හි/ ශුද්ධ වත්කම්හි වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහයන් හා මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වන අතර ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර එම ප්‍රමිතීන්ට අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2024 ජූනි 25 වන දින නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

### 1.2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු නොකර අඛණ්ඩව අදාළ කර ඇත.

සටහන 3.1.1 හි පැහැදිලි කර ඇති පරිදි ආයුගණක තක්සේරුවක් මත පදනම්ව එහි වර්තමාන අගය අනුව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ බැඳීම් මනිනු ලැබේ.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියෙන් දැක්වෙන සටහන් මගින් ආනාවරණය කර ඇත.

### 1.2.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත් එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයින්හට සාධාරණ තක්සේරුවක් ඇත. අනාගත සියළුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවක් හඳුනාගෙන නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන ඇත.

### 1.2.4 භාවිත සහ වාර්තා කරන මුදල්

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන කොමිසමේ භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ. රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

### 1.2.5 සංසන්දනාත්මක තොරතුරු

වඩා හොඳ තත්වයෙන් ඉදිරිපත් කිරීම සහ වත්මන් වර්ෂය සමග සැසඳිය හැකි පරිදි පෙර වසරේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 1.2.6 ද්‍රව්‍යමය බව සහ එකතු කිරීම

සමාන අයිතමවල සෑම ද්‍රව්‍යමය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය සමාන නොවන අයිතම ද්‍රව්‍යමය නොවන්නේ නම් හැර වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.2.7 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීම සහ වාර්තා කළ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කළ යුතුය. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කෙරෙන කාලපරිච්ඡේදය සහ බලපෑමට ලක්වන ඕනෑ ම අනාගත කාල පරිච්ඡේදයක දී ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදලට සැලකිය යුතු බලපෑමක් එල්ල කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමට අදාළ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ.

**දුර්වලතා තක්සේරු කිරීම - වට්ටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනවල දී භාවිතා වන ප්‍රධාන උපකල්පනයන්**

වත්කමකට හෝ වත්කම් කළඹකට හානි වී ඇති බවට වාස්තවික සාක්ෂි තිබේද යන්න කොමිෂන් සභාව වාර්තා කරන සෑම දිනකම ඇගයීමට ලක් කරයි. වත්කමක අය කරගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර එහි සාධාරණ වටිනාකම විකිණීමේද අඩු පිරිවැයක් වේ. භාවිතයේ දී පවතින වටිනාකම තක්සේරු කිරීමේදී ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ මුදල්වල කාල අගය සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වට්ටම් අනුපාත භාවිතා කරමින්ය.

**ක්ෂය**

ක්ෂය වීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ ශේෂ වටිනාකම තීරණය කිරීමේදී විනිශ්චය අවශ්‍ය වේ.

**විලම්භිත බදුකරණය**

අනාගත බදු සැලසුම් උපාය මාර්ග සමග අනාගත බදු අය කළ හැකි ලාභ මට්ටම මත පදනම්ව, හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට කළමනාකරණ විනිශ්චය අවශ්‍ය වේ.

**අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම්**

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ බැඳීම්වල වගකීම තක්සේරු කිරීමට උපකල්පනවල සැලකිය යුතු කොටසක් අදාළවේ. එයට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත ඇතුළත් වන අතර මෙම සැලසුම් දිගුකාලීන වන බැවින් එවැනි ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයට යටත් වේ.

**වත්මන් බදුකරණය**

කළමනාකාරිත්වය විශ්වාස කරන පරිදි තථ්‍ය බැඳීම් නිරූපණය කෙරෙන අදාළ බදු ප්‍රඥප්ති සහ රෙගුලාසි අදාළ කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල වත්මන් බදු වගකීම් ඉදිරිපත් කරනු ලැබේ. ගණුදෙණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණය ආදායම් බලධාරීන් විසින් විවාදයට ලක් කරන අවස්ථා ද තිබිය හැකිය. මෙම ගැටළුවලට අදාළ ඕනෑම අමතර පිරිවැයක් කොමිෂන් සභාවේ වගකීමක් ලෙස තහවුරු කරන අවස්ථාවේ දී බදු වියදමක් ලෙස ගණන් ගනු ලැබේ.

**1.2.8. වාර්තා කරන කාල සීමාවෙන් පසු හට ගන්නා සිදුවීම්**

වාර්තා කරන කාල සීමාවෙන් පසුව හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

## 1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශ මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකයන් පාදකව වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත. විදේශ මුදල්හි වත්කම් හා වගකීම් ශේෂ පත්‍රයේ පවතින විනිමය අනුපාත මත පරිවර්තනය කරනු ලැබේ. ඇති වන ලාභ හා අලාභ සම්බන්ධයෙන් ආදායම් හා වියදම් ගිණුම තුළ කටයුතු කරනු ලැබේ.

## 1.4 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් පෙර ලැබීම් හා වෙනත් ගෙවිය යුතු දෑවලින් සමන්විත වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් වලට ලැබිය යුතු දෑ සහ එහි කටයුතුවලින් සෘජුවම ලැබෙන මුදල් හා වෙනත් කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

**1.4.1 වෙළඳපළ අවදානම**

වෙළඳපළ අවදානම යනු වෙළඳපළ මිල වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයෙහි සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ මිල අවදානම් වර්ග දෙකකින් සමන්විත වේ. වෙළඳපළ අවදානම මගින් බලපෑමට ලක් වන මූල්‍ය උපකරණවලට මූල්‍ය ආයතනවල තැන්පතු ඇතුළත් වේ.

**1.4.1.1 පොළී අනුපාත අවදානම**

පොළී අනුපාත අවදානම යනු වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයෙහි උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනාවරණය මූලික වශයෙන් පාවෙන පොළී අනුපාතත් කොමිෂන් සභාවේ වගකීමට අදාළ වේ.

**1.4.1.2. ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු කොමිෂන් සභාව විසින් අඛණ්ඩව මුදල් ප්‍රවාහ පුරෝකථනයන් හා මුදල් අයවැයකරණය භාවිත කරමින් එහි අරමුදල් හිඟයක් ඇති වීමේ අවදානම අධීක්ෂණය කිරීමයි.

## 2. වත්කම් හා අගය කිරීමේ පදනම

### 2. 1 දේපළ, පිරියත හා උපකරණ

**ස්වසන්තක අයිතිය සහිත දේපළ පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන්/ ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපළ, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ අත්පත් කර ගැනීමේ පිරිවැය සමග එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

හුවමාරු නොවන ගනුදෙනුවක දී වත්කමක් ශූන්‍ය හෝ නාමික සලකා බැලීමක් සඳහා අත්පත් කර ගන්නා විට වත්කම මුලින් මනිනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමෙනි.

අයිතමයට සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන යාමට හෝ ගලා ඒම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා පසුකාලීනව දරන ලද පිරිවැය ප්‍රාග්ධන වියදම් ලෙස සලකන ලදී. අනෙකුත් අළුත් වැඩියාවන් සහ නඩත්තු කටයුතු සඳහා වන වියදම් ඒවා දරණ ලද මූල්‍ය වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් අය කරනු ලැබේ.

වසර තුනකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලබන මෝටර් රථ සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කරගන්නා අතර ඉන් පසුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 යටතේ වන ප්‍රත්‍යාගණන ආකෘතියේ අවශ්‍යතාවලට අනුකූල වන බවට වග බලා ගනු ලැබේ.

කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

**ක්ෂය**

වත්කම් ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ. ප්‍රයෝජනවත් ආයු කාලය, ක්ෂය වීමේ ක්‍රම සහ අවශේෂ අගයන් වාර්ෂිකව හෝ එවැනි තක්සේරුවක් අවශ්‍ය වන බව පෙන්නුම් කරන අවස්ථාවට පෙර දිනයක දී තක්සේරු කරනු ලැබේ.

| වත්කම් | වාර්ෂික % |
|---|---|
| මෝටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම සහ සවි කිරීම | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම | 25 |
| පුහුණු උපකරණ | 25 |

මිල දී ගත් දින සිට බැහැර කරන දින දක්වා ක්ෂය කරනු ලැබේ. විකුණුම් මත ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ විකුණුම් ආදායම ගෙන යන මුදල සමග සංසන්දනය කිරීමෙනි.

### 2.2 ආයෝජන

බලපත්‍රලාභී රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන, රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරනු ලබන අතර වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ උපචිත පොලී ලෙස දක්වා ඇත. මෙම ආයෝජන වාර්තා කරන කාල සීමාව දක්වා පිරිවැය සහ එකතු කළ පොළියෙන් දක්වා ඇත. එබැවින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය උපකරණවල අවදානමක් නොමැත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

හානිය සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ලැබිය යුතු දෑ අපේක්ෂිත යථාර්ථවාදී අගයට රැගෙන යනු ලැබේ. වාස්තවික සාක්ෂි සලකා බැලීම මගින් සියළුම ලැබිය යුතු දෑ නිශ්චිත හානි සඳහා තක්සේරු කරනු ලැබේ.

### 2.5 මූල්‍ය නොවන වත්කම් හානි වීම

සෑම මූල්‍ය කාල සීමාවක් අවසානයේ ම කොමිෂන් සභාව මූල්‍ය නොවන වත්කම් හානි විය හැකි බව පෙන්නුම් කරන සිදුවීම් හෝ වෙනස් වීම් තක්සේරු කරයි. එවැනි ඇඟවීමක් තිබේ නම්, කොමිෂන් සභාව අය කරගත හැකි ඇස්තමේන්තුගත වත්කම් ප්‍රමාණය ලබා දෙයි. වත්කමක ගෙන යා හැකි මුදල එහි අයකර ගත හැකි මුදල ඉක්මවන විට, වත්කම හානි වූවා සේ සලකනු ලබන අතර එහි අයකර ගත හැකි මුදලට ලියා දක්වනු ලැබේ.

### 2.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා මුදල් සමාන දෑවලින් නියෝජනය වන්නේ සෑම විටම මුදල් ලෙස ලබා ගැනීමේ හැකියාව ඇති සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන බැංකුවේ මුදල් සහ අතැති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ මුල් කල් පිරීම මාස තුන හෝ ඊට අඩු වන ද්‍රවශීල ආයොජනයි.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍ර දිනයට සියළු භෞතික බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලබන අතර පවතින බැරකම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සපයා ඇත. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළු ම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

**3.1** වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

**3.2** වාර්තා කරන දිනයෙන් වර්ෂයකට පසු ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම නොවන බැරකම් සේ වර්ගීකරණය කර ඇත.

**3.3** අවිනිශ්චිත වගකීමක් යනු කොමිෂන් සභාවේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

නොවීම මගින් හෝ පියවීමට සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නිසා පිළිගත නොහැකි වර්තමාන වගකීමක් හේතුවෙන් පැන නැගිය හැකි වගකීමකි.

**3.4** අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට දැනට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර වගකීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැකිය.

## 3.5 සංචිතවල ස්වභාවය සහ අරමුණ

නිශ්චිත දේශීය අවශ්‍යතා සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තුල සංචිත නිර්මාණය කර පවත්වාගෙන යයි.

### (අ) සමුච්චිත සංචිත

කොමිෂන් සභාවේ අතිරික්තය/හිඟය සමුච්චිත අරමුදලට මාරු කරනු ලැබේ.

### (ආ) ප්‍රත්‍යාගණන සංචිතය

වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී ලැබෙන ලාභය/අලාභය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබේ.

## 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

### 3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ සියළු සුදුසුකම් ලත් සේවකයන් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සකස් කරගන්නා ලදී. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මගින් විශ්‍රාම ගැනීමේ දී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දැක්වේ.

කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 සේවක ප්‍රතිලාභ යටතේ දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| **2023 මූල්‍ය වසර ආරම්භයේ දී** | **23,790,913** |
| වර්තමාන සේවා පිරිවැය | 247,958 |
| පෙර සේවා පිරිවැය (විශ්‍රාමික වයස වෙනස් වීම හේතුවෙන්) | - |
| පොළී පිරිවැය | 4,282,364 |
| ආයුගණක ලාභ | (1,618,717) |
| **ආදායම් ප්‍රකාශයෙහි ලාභ හා අලාභවලට අදාළ ගැලපීම්** | **4,811,605** |
| ගෙවන ලද ප්‍රතිලාභ | (4,767,900) |
| **2023 මූල්‍ය වසර අවසානයේ දී** | **23,634,617** |

පූර්ව වර්ෂයේ ඌණ හෝ අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇති වූ වෙනස්කම් නිසා ලැබූ ලාභ හා අලාභ ඒවා ඇති වූ කාල සීමාවේ ආදායම් ප්‍රකාශයට අදාළ කරනු ලැබේ. වසර සඳහා වන බැඳීම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

භාවිත කරන ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාතය | : | වසරකට 13% |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | : | 10% |
| විශ්‍රාම වයස | : | අවුරුදු 60 |

### 3.1.2 නිශ්චිත සභාගත සැලසුම - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

අදාල ව්‍යවස්ථාවන් සහ රෙගුලාසිවලට අනුකූලව කොමිෂන් සභාවේ සියළු ම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායක වීමට සහ සේවක භාරකාර අරමුදලට දායක වීමට සුදුසුකම් ලබයි. කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙලින් 12% හා 3% ක මුදලක් දායක කරයි.

## 3.2 අදාළ පාර්ශවයන්

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශවයක් ලෙස සලකනු ලබන්නේ තනි තනිව හෝ ඒකාබද්ධව පාලනය කිරීමට හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට හැකියාව ඇති පුද්ගලයෙකු හෝ ආයතනයකි. ප්‍රධාන කළමනාකාරිත්වයේ සාමාජිකයන් අදාළ පාර්ශව ලෙස සලකනු ලබන අතර ඊට රේඛීය අමාත්‍යාංශය සහ කොමිෂන් සභාවේ සාමාජිකයන් ඇතුළත් වේ.

## 4. ආදායම් හා වියදම්

## 4.1 ආදායම හඳුනා ගැනීම

### 4.1.1 හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

#### ගාස්තු සහ බදු

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සිදුවීම සිදු වූ විට සහ වත්කම් හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන විට ගාස්තු සහ බදුවලින් ලැබෙන ආදායම හඳුනා ගනී. වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වත්කම ආශ්‍රිත සේවා විභවයන් ආයතනය වෙත ගලා ඒමේ සම්භාවිතාවක් ඇති විට සහ වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකි වූ විට වෙනත් හුවමාරු නොවන ආදායම් හඳුනා ගනු ලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ආදායම වාර්ෂික ගාස්තු, අලුත් කිරීමේ ගාස්තු, ලියාපදිංචි ගාස්තු සහ ප්‍රකාශන විකිණීම යනාදියෙන් සමන්විත වේ.

#### 4.1.2 හුවමාරු වන ගණුදෙනුවලින් ලැබෙන ආදායම

**පොළී ආදායම**

වත්කම්වල ඵලදායී ආදායම සැලකිල්ලට ගත් කාලයට සමානුපාතිකව පොලී ආදායම හඳුනාගෙන ඇත.

**වත්කම් අලෙවිය**

වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම සාමාන්‍යයෙන් භාණ්ඩ භාරදීමේදී, හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත මාරු කර ඇති විට හඳුනා ගැනේ.

### 4.2 වියදම් හඳුනා ගැනීම

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියා හරිනු ලැබේ.

#### 4.2.1 පොලී ආදායම සහ වියදම

පොලී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි උපචිත පදනම මත පිළිගනු ලැබේ.

### 4.3 ආදායම් බදු වියදම්

**වත්මන් බදුකරණය**

කොමිෂන් සභාවේ බදු වියදම, වත්මන් බදුකරණය සහ වසර තුළ විලම්භිත බදු ලාභය හෝ අලාභය යනාදියෙන් සමන්විත වේ. බදුකරණය සඳහා වන ප්‍රතිපාදන බදුකරණ අරමුණු සඳහා සකස් කරන ලද වර්ෂයට අදාළ ලාභය/අතිරික්තය මත පදනම් වේ.

**විලම්භිත බදු**

මූල්‍ය වාර්තා කිරීම සඳහා වත්කම් සහ බැරකම් ඉදිරියට ගෙන යන මුදල් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සඳහා පහසුකම් සලසන ක්‍රමයක් වන ශේෂ පත්‍ර වගකීම් භාවිතා කරමින් විලම්භිත බදුකරණය සපයනු ලැබේ. විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ වත්කම් භාවිතා කළ ප්‍රමාණයට සාපේක්ෂව අනාගත බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති ප්‍රමාණයට පමණි. විලම්භිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර තවදුරටත් අදාළ බදු ප්‍රතිලාභය ලබා ගැනීමට හැකියාවක් නැති වන තරමට අඩු කරනු ලැබේ.

### 4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

### 4.5 අයවැය තොරතුරු

වාර්ෂික අයවැය උපචිත පදනම මත සකස් කර ඇත. එනම්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අවශ්‍යතා තීරණය කිරීම සඳහා සියළු සැලසුම්ගත පිරිවැය සහ ආදායම තනි ප්‍රකාශයක් තුළ ඉදිරිපත් කෙරේ.

මෙම අයවැය සංඛ්‍යාවන් මූල්‍ය වර්ෂය ආරම්භයේ දී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඒවා වේ.

## 5 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

### 5.1 නෛතික ආකෘතිය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කරන ලද අතර එහි "රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අය කෙරෙන සෙස් බද්ද බැර කරනු ලබන රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ලෙස හැඳින්විය යුතු අරමුදලක් තිබිය යුතු වන්නේය" යනුවෙන් දැක්වේ.

### 5.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ (RII පනත) 103(1) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදලේ බැර කිරීමට ඇති අරමුදල් රක්ෂණ ඔප්පු හිමියන්ගේ පොදු ආරක්ෂාව සඳහා සහ ඒ වෙනුවෙන් සාදන ලද නීති මගින් කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි වෙනත් ඕනෑම විශේෂිත අරමුණක් සඳහා යොදා ගත යුතුය.

